

# කෝවිඩ්-19 කතා එකතුව

''අවසානයේ දී කොවිඩ් 19 මගින් මනුෂ්‍ය වර්ගයාට උගන්වන
ලොකුම පාඩම වනුයේ අප සියල්ලෝම එකාවන්ව සිටිය යුතු බවයි''

Sarvodaya

Shanthi Sena Sansadaya

This project is co-funded by the European Union

UNDP

# පටුන


කෙටි යෙදුම් 03
හැඳින්වීම 04
සර්වෝදය ශාන්ති සේනා සංසදයේ පණිවිඩය 06
සර්වෝදය ශ්‍රමදාන සංගමයේ පණිවිඩය 07
යුරෝපා සංගමයේ පණිවිඩය 08
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ පණිවිඩය 09
කොරන්ටයින් කාලේ අපි මෙහෙමයි රාලේ 11
අපේ කුඩා නිවස කඩා ඇයි බිම දැම්මේ 15
කොනකලගල අලංකාරේ 17
ඉතාලියෙන් මෙ-තාලියට 21
හැබෑට මෙහෙමත් නාටක 23
සෝකය දුක ආවත් මට කොයි තරම්
මම දලා යන්නේ නෑ මගේ සුදු රත්තරං 25
නේවි පුතාට කළ අරියාදුව 26
මාදැලෙන් ගොඩ ආව හිත හයිය සංජීව 29
පොලිසිය හරිද PHI හරිද? 31
සාගර ජලය මදි හැඬුවා නුඹ හන්ද 35
අමුතු ඉලන්දාරින්ගේ කථා වස්තුව 40
රාජ්‍ය සේවකයින්ගේ වීර්ය පාරමිතාව 42
මල්ලි අපි නං ගොඩ මල්ලි 46
කටකතාවක් ගිය දුරක් 47
හරියනකොට ඔහොම තමයි 49
ඉතාලි සිට ලංකාවට 50
නැති අපට නැති - ඇති අයට ඇති ඔන්ලයින් 56
ඒ වෙලාවේ ඔක්කොම ඇඩුවේ පොඩිවුන් වාගේ. 58
මූණ බල බල සල්ලි බෙදුවේ 60
වැව් ඉස්මත්තේ තනිවූ සුසුමන් 62
කෝවිඩ් කාලේ මීගමු ආලේ 64
ATM හුටපටේ 67
කථා වලින් ඔද්දල් හිත 69
අනේ අපේ නැන්ද කොහි ගියාදේ 71
වළින්න ගිය දේවාලේ හිසේ කඩා වැටීම 72
හෙට මැරුණත් හිතට සැබයි අද ජොලි කරලා 75

# කොරෝනා

## කෙටි යෙදුම්

PHI - මහජන සෞඛ්‍ය පරීක්ෂක

MOH - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

IDH - බෝවන රෝග වෛද්‍යායතනය

# හැඳින්වීම

**We are not makers of history.**
**We are made by history.**
**Martin Luther King, Jr.**

**අපි ඉතිහාසය ගොඩනගන්නෝ නොවේ**
**ඉතිහාසය අපව ගොඩනගයි**
**මාර්ටින් ලූතර් කිං**

කෝවිඩ් වසංගතේ ලෝකය ගිලගත්තේ ඇහිපිය ගහන වේගයෙන්. මේ අවාසනාවන්ත කාල පරාසයේ එලිපහලියට බැහැ ගන්න බැරිව මිනිසුන් ගෙවල්වලට හා සේවා ස්ථානවලට කොටුවුනා. ගහෙන් ගෙඩි එන්නා වාගේ ඇඳිරි නීතිය පනවාපු වේලේ මිනිසුන් අන්ත අසරණභාවයට පත්වුනා. මේ කාල පරාසය ප්‍රයෝජනවත් ලෙස ගතකරන්නට තීරණය කළ සර්වෝදය ශාන්ති සේනා සංසදය ශ්‍රී ලංකාව තුල තෝරාගත් දිස්ත්‍රික් දහයක විශේෂ වැඩසටහන් මාලාවක් දියත් කළා. මේ වැඩසටහනේ එක් පියවරක් වූයේ ඇඳිරිනීති සමයේ තමන් අත්විඳි සිදුවීම් අලලා කෙරෙන මතකය සංචිත ගතකිරීම. මේ ග්‍රන්ථය සම්පාදනය වන්නේ ඒ කථා ඇසුරින්. මෙහි එන සියලු කතා සත්‍ය සිදුවීම් ඇසුරින් නිර්මිතයි. ඒවා පලකරන්නට අවසර සහිතයි. කතා නායකයින්ගේ ඉල්ලීමට අනුව ඇතැම් කතාවලට භාවිත නම් ගම් මනඃකල්පිතයි.

කෝවිඩ් 19 තත්වයට ප්‍රජාව මුහුණු දුන්නේ අනපේක්ෂිත අවස්ථාවකය. මෙම නොහදුනන ව්‍යසනය මිනිසුන් තුළ මානසික කම්පනයක් සහ භීතියක්ද ඇති කළේය. එකිනෙකාගෙන් රෝගය බෝවීම සිදුවිය හැකි බැවින් අනෙකා දෙස සැකෙන්, භියෙන් සහ තැති ගැන්මකින් යුක්තව එම දින පසු කළේය. මේ හරහා එක් අතකින් රෝගීන් මෙන්ම රෝගී වුවන්ගේ සමීපතමයන් කෙරෙහි භිය උපදවා ගත් අතර ඔවුන් කොන් කොට ජීවත්වීමට උත්සාහ කළේය. වරෙක යම් ආගමික කණ්ඩායමක් අතරින් රෝගය මතු වන විට එම ආගමික කණ්ඩායම කොන් කළේය. වෙනස් කොට සැලකුවේය. වෘත්තියක නියෙලෙන්නන් අතර රෝගය ව්‍යාප්ත වනවිට එම වෘත්තියෙහි නියෙලෙන්නන් කොන් කළේය. වෙනස් කෙට සැලකුවේය. අසල් වැසියන් රෝගීන් වන විට ඔවුන් කොන් කළේය. මෙය මිනිසත්කම සහ ආගමික ඉගැන්වීම් අමතක කළ අවස්ථාවක් විය.

නිවෙස් තුල හුදෙකළා වූ මිනිසුන්ගේ ආර්ථික ශක්තිය කඩා වැටුනේය. මානසික පීඩනයක් සමග ආර්ථික පීඩනයද එක්වූ තැන ප්‍රජාව තුල නොසන්සුන් බව ඉස්මතුවීමෙන් සමාජ සහජීවනයට බාධා ඇති විය. ආගම් හා වාර්ගික කණ්ඩායම් අතර ආරම්භ වූ වාචික සංහාර, සමාජ කොන් කිරීම් දක්වා වර්ධනය විය. සමාජ මාධ්‍ය හරහා එය වඩ වඩාත් තීව්‍ර විය.

මෙවන් පසුබිමක් තුළ, සර්වෝදය ශාන්ති සේනාව, එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩ සටහන සමග එක්ව රෝග ව්‍යාප්තිය ආරම්භ වූ හා බලපෑම් ඇතිකළ දිස්ත්‍රික් 10 ක් තෝරා, අගමික, සිවිල්, තරුණ සහ කාන්තා නායක නායිකාවන් 25 බැගින් ඒකරාශිකොට කොට සමාජ නායකත්ව මණ්ඩලයක් පිහිටුවා ඔවුන් සමග මාර්ග ගතව සංවාද මාලාවක් ආරම්භ කළේය. ඒ තුළින් පවතින තත්වය පිළිබඳ අදහස් හුවමාරු කර ගනිමින් සමාජ විද්‍යා, ජනමාධ්‍ය, වාචික ඉතිහාසය හා වෛද්‍ය ක්ෂෙත්‍රයේ ප්‍රවීණයන්ගේද සහාය ඇතිව සංවාද මාලාවක් පැවත්විය. ඒ දැනුම සහ අවබෝධය හරහා වෙනස්

කොට සැලකීම් අවම කිරීම සඳහා ජන මතයක් නිර්මාණය කළේය. සමාජ සහජීවනය ශක්තිමත් කිරීම සඳහා ආගමික කණ්ඩායම් අතර විශ්වාසය ගොඩ නැගීමට කටයුතු කළේය. පවතින රෝග තත්වයට සෞඛ්‍ය විද්‍යානුකූලව මුහුණ දීම සඳහා සූදානම් කළේය.

විශේෂයෙන්ම මෙම දුෂ්කර අවස්ථාවේ තරුණ ව්‍යවසායයින් මුහුණ දුන්නේ ඉතාමත් දුක්ඛිත තත්ත්වයකටය. ඔවුනගේ  කඩා වැටුනු ව්‍යාපාර නගා සිටුවා ගැනීම සඳහා මුදලින් ආධාර කිරීමද මෙම වැඩ සටහනේ තවත් ප්‍රබල කාර්යයක් විය. ඒ සඳහා සුදුසු ව්‍යවසාකයින්ගෙන් අයදුම් පත් කැඳවා, තේරීම් කමිටුවක් මගින් සුදුස්සන් තෝරා, ඔහුනට මූලික පුහුණුවක්ද ලබා දී ව්‍යවසායකයින් 102 කට මූල්‍ය ආධාර පිරනැමීය. මේ අතරට කාන්තා ව්‍යවසායකයින්, ආබාධිත හා වැන්දඹු ව්‍යවසායකයින් ද ඇතුලත් විය. කුඩා පරිමාන ඇඟලුම් කර්මාන්ත, හස්ත කර්මාන්ත, ලෙදර් බෑග් නිෂ්පාදන, සිමෙන්ති නිෂ්පාදන, බෝග වගාවන්, ආහාර හා රසකැවිලි නිෂ්පාදන රන් කර්මාන්තය, මාළු වෙළඳ ව්‍යාපාර, ඇලුමිනියම් නිෂ්පාදන, යකඩ වැඩ කර්මාන්ත , තාක්‍ෂණික මෙවලම් නිෂ්පාදන හා සිල්ලර වෙළඳ ව්‍යාපාර ආදිය ඒ අතර විය.

මෙම දුෂ්කර අවස්ථාවේ ප්‍රජාව මුහුණ දුන් සැබෑ අද්දැකීම් මෙම කණ්ඩායම හරහා එකතු කොට ඒ පිළිබඳ අත්දැකීම් බෙදා ගත් අතර එයින් තොරා ගත් කථා කිහිපයක් ඇතුලත් කොට මෙම මතක සංචිත පොත මුද්‍රණය කිරීමට තීරණය කළේය. මෙම පොත එළි දකින්නේ මෙම ක්‍රියාවලියෙහි තවත් එක් ප්‍රතිඵලයක් ලෙසිනි.

සංස්කාරක මණ්ඩලය

## සර්වෝදය ශාන්ති සේනා සංසදයේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ පළමු කොවිඩ් රෝගියා වාර්තා වූයේ මාර්තු 11 වැනිදා ය. මාර්තු 16 වැනිදා සිට රටේ පළාතෙන් පළාත වැසී යන්නට විය. මාර්තු 24 වැනිදා වන විට රටම වසා දැමුනේය. මෑත ඉතිහාසයේ පළමු වරට මුළු රටම එකවර ලොක්ඩවුන් විය. කොවිඩ් 19 හෙවත් කොරෝනා රෝගීන් රටේ නන් දෙසින් වාර්තා වන්නට විය.

සෞඛ්‍ය හා ආරක්ෂක අංශ විසින් සමාජ දුරස්ථභාවය පවත්වාගැනීමේ ඒකායන අරමුණින් සාමාන්‍ය ජන ජීවිතයට දැඩිව සීමා බාධක පනවන ලදී. ඇති හැකි අය අඩු වශයෙන් ද නැති බැරි අය වැඩි වශයෙන් ද විවිධ දුක්ඛ දෝමනස්සයන්ට හා දුෂ්කරතාවයන්ට මුහුණ දුන්නෝය. සියල්ලන්ටම තම නිවෙස ක්ෂේම භූමියක් විය.

මෙම අදුරු කාල පරිච්ඡේදය තුළදී රටේ අතිමහත් බහුතරයට පෙර නොවූ විරූ අන්දමේ නානාවිධ අත්දැකීම්වලට මුහුණදෙන්නට සිදුවිය. ඇතැමුන්ගේ අත්දැකීම් ඉතා දුක්ඛදායී වූ අතර ඇතැමුන්ගේ අත්දැකීම් ඉතා ධෛර්යවන්ත ඒවා ය. කෙනෙකුට අතිශය මානුෂීය අත්දැකීම් ලැබෙද්දී තවෙකෙකුට ඉතා අමානුෂික තත්වයන්ට මුහුණදීමට සිදුවිය. ඇතමෙකුට තම අත්දැකීම ඉතා රමණීය වෙද්දී තවෙකෙකු ට මරණීය අත්දැකීම් වලට මුහුණ දෙන්නට සිදුවිය.

මේ සියල්ලටම මුහුණ දුන්නේ අපේම රටේ අපේම සහෝදර මිනිසුන් ය. එනිසාම මේ අත්දැකීම් කිසිවක් කාලයේ වැලිතලාවෙන් වැසී යන්නට ඉඩ දිය යුතු නැත. මෙවන් අනපේක්ෂිත වටපිටාවක පෙර නොවූ විරූ ලෙස අප සැම අත්විඳි දෑ අදින් හෙටට රැගෙන ගොස් දැන කියාගන්නට ඉතිරි කර තැබිය යුතුව ඇත. මේ කොවිඩ් කතා කෘතිය ඒ උදෙසා අප ගත් එක් ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

අප මෙම කතාන්දර එකතු පහදු කරගන්නේ කොවිඩ් කාලසීමාවේදී අන්තර්ජාලය ඔස්සේ අප සමග එක්ව කටයුතු කළ ආගමික නායකයින් හා තරුණ සිවිල් සංවිධාන ක්‍රියාධරයන්ගේ සහයෝගයේ ප්‍රතිඵලයක් ලෙස ය. එකතු කරගත් කතාන්දර අන්තර්ගතය වෙනස් නොවන සේ සිත්ගන්නාසුළු අයුරින් සංස්කරණය කළේ අර්ජුන් ක්‍රිෂ්ණරත්නයන්ය. නිලුක්ෂි කුරේ මහත්මිය හා වින්සිකා සේරම් මෙනවිය ඉංග්‍රීසි පරිවර්තනයෙන් දායක විය. එය අවසන් වශයෙන් සංස්කරණය කළේ ආදිලා ඉස්මයිල් මහත්මියයි. දෙමළ පරිවර්තනය තාරික් අලි මහතාගෙනි. සමස්ථ ක්‍රියාවලියම දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කලේ සර්වෝදය දිස්ත්‍රික් නියමු සේවක මහත්ම මහත්මීන්ය. විවිධ අයුරින් සහාය වූයේ මහාචාර්ය කමල් වලේබොඩ, නලීන් පරණගම, රසික ගීතාංග මහත්වරුන්ය.

කොවිඩ් ලොක් ඩවුන් සමයෙහි වුවද මෙවන් වැඩසටහනක් කරන්නට හොදම කාලය බව මතක් කරදී අපව දිරිගැන්වූයේ සර්වෝදය ගරු සභාපති වෛද්‍ය වින්යා ආරියරත්න මහතාය. මෙම නිමැවුමට බරපැන දරමින් අපට ශක්තියක් වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි කොලඹ කාර්යාලයේ ආචාර්ය ප්‍රියාන් සෙනෙවිරත්න මහතා ඇතුළු කණ්ඩායම ද සිහිපත් කළ යුතුමය.

සර්වෝදය අපට ඉගැන්වූයේ ව්‍යවසනයට සාප නොකොට ඉන් ගැලවීමට කළ හැකි සියල්ල කළ යුතු බවය. අප අපට හැකි අයුරින් එය ඉටු කරන්නට සිතුවෙමු. මේ එහි එක් එළිදැක්වුමකි. මෙම සද්කාර්යයට දායක වූ සැමට මහත් සේ තුති පුදමු.

**රවීන්ද්‍ර කන්දගේ** | විධායක අධ්‍යක්ෂ | සර්වෝදය ශාන්ති සේනා සංසදය

# සර්වෝදය ශ්‍රමදාන සංගමයේ පණිවිඩය

රට තුළ ඇතිවන ඕනෑම ස්වාභාවික හෝ හදිසි ව්‍යසන තත්වයක දී විපතට හා පීඩාවට පත් ප්‍රජාව සොයා ගොස් ඔවුනට අවශ්‍ය භෞතික හා මානසික සේවාවන් සපයා ඔවුන් නගා සිටුවීමට කටයුතු කිරීම සර්වෝදය සංගමයට අමුත්තක් නොවේ. ඒ සදහා වූ ඕනෑ තරම් උදාහරණ ඇත. එතරම් පහසු කාර්යයක් නොවූවත් COVID 19 තත්වය හමුවේ ද පීඩාවට පත් ජනතාවට සහන සේවාවන් ක්‍රියාත්මක කෙරුණි. එය මෙවැනි බෝවන රෝග තත්වයකදී මුහුණ දුන් අතිශය අභියෝගාත්මක කාර්යයකි. විපතට පත් ජනතාව ගේ පීඩාව දැක ඉවත බලා සිටීම අප වැනි සමාජ සංවිධානයක වගකීම නොවේ. මේ අරඹයා රජයේ සෞඛ්‍ය අංශ ලබා දුන් උපමාන තුළ හිඳිමින් විවිධ ක්ෂෙත්‍ර ඔස්සේ අපට කළ හැකි උපරිම සේවය ඉටු කිරීමට කටයුතු කරන ලදී. පීඩාවට පත් ජනයා වෙනුවෙන් පෙනී සිටින අවස්ථාවේ, සර්වෝදය ශාන්ති සේනාව ඉටුකළ කාර්යයන් තුළින් ද අදාල ප්‍රජාවන්ට සිදුවූ සේවය සුලුපටු නොවේ.

කිසිදු සමාජ ක්‍රියාධරයෙකුට මුහුණුට මුහුණ හමුවී යමක් කළ නොහැකි අවස්ථාවක මාර්ග ගත සංවාද හරහා එක්ව කටයුතු කිරීමට දිස්ත්‍රික්ක 10 ක ආගමික නායකයින්, සමාජ නායකයින්, හා තරුණ නායකයින්ට අවස්ථාව සලසා දී ඔවුනගේ නායකත්වය සමාජය සුවපත් කිරීමට භාවිතා කිරීම ඉතා වැදගත් විය. මෙවැනි තත්වයක් තුළ නිර්මාණය වන වෙනස් කොට සැලකීම් අවම කිරීමටත්, බිඳවැටුණු තරුණ ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර නැවත නඟා සිටුවීම සදහා මුදලින් උපකාර කොට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමටත් කටයුතු කරන අතර, අපේක්ෂා නොකළ මෙවැනි තත්වයක් තුළ ප්‍රජාව මුහුණ දුන් ජීවන අත්දැකීම් අනාගත ඉගෙනුම් හා පාඩම් සදහා රැගෙන යාමට එම කතා එකතු කොට පොතක් ලෙස මුද්‍රණය කිරීමට කටයුතු කිරීමත් මෙම අවස්ථාවේ සිදු කළ  වැදගත් කාර්යයකි.

මෙය එතරම් පහසු කාර්යක් නොවුවත් එම අභියෝගය භාරගෙන සාර්ථකව ඵලදායීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ සර්වෝදය ශාන්ති සේනා සංසදයට මාගේ ස්තුතිය පුද කරන අතර, අප කෙරෙහි විස්වාශය තබමින් ඒ සදහා මුල්‍ය  අනුග්‍රහය දැක්වූ එක්සත් ජාතිනීන්ගේ සංවර්ධන වැඩ සටහනට ද සර්වෝදය සංගමයේ ස්තුතිය පිරි නමමු. මෙම කොවිඩ් කතා සංචිතය, අනාගතයේ මෙවැනි ව්‍යසන තත්වයක දී ඒ සඳහා මුහුණ දීමට ප්‍රජාවට ශක්තියක් වන බව මගේ විශ්වාසයයි.

**වෛද්‍ය වින්යා ආරියරත්න** | සභාපති | සර්වෝදය සංගමය

# යුරෝපා සංගමයේ පණිවිඩය

COVID -19 වයිරසය සහ එහි සමාජ, ආර්ථික ප්‍රතිවිපාක කාන්තාවන්ගේ, ළමයින්ගේ සහ වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම්වලට හා අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සියලු පුද්ගලයින්ට අසමාන ලෙස බලපායි. සමාජයේ ව්‍යුහාත්මක අසමානතාවයට හා බැහැරවීමට මුහුණ දෙන අය බොහෝ විට ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික දිශානතිය මත පදනම් වූ වෙනසෙහි සලකුණු දරති. යුරෝපා සංගමය විසින් අරමුදල් සපයනු ලබන 'විවිධත්වය ඉවසීම සහ ගෞරවය ප්‍රවර්ධනය කිරීම තුළින් ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම' ව්‍යාපෘතිය යුරෝපා සංගමය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමග ඇතිකර ගත් හවුල්කාරිත්වයක ප්‍රතිඵලයකි. ආසියානු කලාපයේ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා එහි මූල හේතු ආමන්ත්‍රණය කිරීම හා විවිධත්වය ඉවසීම සහ ගෞරවය ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. වෙනත් තැන්වල මෙන්, ශ්‍රී ලංකාවේ දී ද මෙම ප්‍රයත්නයන්හි අරමුණ වන්නේ COVID -19 වසංගතයට දේශීය ප්‍රතිචාර දැක්වීමට සහාය වීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතරම, අවදානම් සහිත ප්‍රජාවන්ගේ ප්‍රත්‍යස්ථභාවය ගොඩනැගීම සහ ශක්තිමත් කිරීමයි. මෙම ප්‍රමුඛතාවය මගින් ආන්තිකකරණය හා අපකීර්තිය හා වෙනත් ආකාරයේ වෙනස්කම් කිරීමේ අවදානමට ලක්ව ඇති අයගේ අවශ්‍යතා සැලකිල්ලට ගන්නා වසංගත ප්‍රතිචාර ක්‍රියාමාර්ග සඳහා යුරෝපා සංගමයේ කැඳවීම පිළිබිඹු වේ.

මෙම ව්‍යාපෘතිය බහුත්වවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ යුරෝපා සංගමය මගින් අරමුදල් සපයන මැදිහත්වීම්වලින් එකකි. වෙන කවරදාකටත් වඩා, ආයතනික ප්‍රතිචාර සහ චර්යාත්මක වෙනසක් ඇති කරන සමාජයක් ගොඩනැගීමේ උත්සාහයට අපි සහාය දෙමු.

පවතින අසමානතාවයන්ට පිළියම් යෙදීම සඳහා සමාජීය දෝෂ රේඛා අවබෝධ කර ගැනීමේ මාධ්‍යයක් ලෙස COVID -19 අගුළු දැමීමේ අත්දැකීම් විස්තර කිරීම සඳහා ගත් ප්‍රයත්නයට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ සර්වෝදය ශාන්ති සේනාව වෙත මම සුබ පතමි.

**ප්‍රැන්ක් හේස්** I සහයෝගීතා ප්‍රධානී I යුරෝපා සංගම් නියෝජිත ශ්‍රී ලංකාව

# එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ පණිවිඩය

COVID-19 කොරෝනා වයිරසය පැහැදිලිවම පෙන්නුම් කර ඇත්තේ සමාජයක් එහි දුර්වලම සම්බන්ධතාවය තරමටම ශක්තිමත් බවයි. මෙය ජනතාවගේ සෞඛ්‍යය හා ආර්ථිකය යන දෙඅංශයෙහිම සත්‍ය වේ. මේ වනවිට රටවල් මුහුණ දී සිටින සමාජ, දේශපාලන හා ආර්ථික බිඳවැටීම් ඉදිරි වසර ගණනාව තුළ අපේ සමාජයට බලපෑම් කරනු ඇත. ජීවනෝපායන් කඩාකප්පල් වීම, මූල්‍ය දුෂ්කරතා, ගෘහස්ථ හිංසනය සහ අපයෝජනය, සමාජ හුදකලාව වැඩිවීම, ගැටුම් හා ප්‍රචණ්ඩත්වය උග්‍රවීම සහ දරිද්‍රතා ප්‍රයෝගයන් වැනි දෑ ලොව පුරා ජනතාව මුහුණ දෙන සිතාගත නොහැකි පීඩා වේ. එක් අතකින්, මෙම සියලු සාධක කොරෝනා වයිරසය විශාල ගෝලීය අභියෝගයක් ලෙස නිර්මාණය කිරීම සඳහා හේතු වේ. අනෙක් අතට, වසංගතය අපට, නැවත සිතා බැලීමට, නවෝත්පාදනය කිරීමට, පරිවර්තනය කිරීමට හා අභියෝගයන් අවස්ථාවන් බවට පරිවර්තනය කිරීමෙන් සමෘද්ධිමත් වීමට දිරිමත් කර බලපෑම් කරයි.

අපි මනුෂ්‍යයෝය, ඒ නිසා අපි ජීවත් වන්නේ කතන්දර සමග ය. විවිධ අභියෝගයන්ට මුහුණ දෙන සැබෑ පුද්ගලයින්ට අයත් සැබෑ කථා විශාලනය කළ විට, ඒවා අපගේ කාලයෙහි වඩාත් දැවෙන ගැටළු කිහිපයක් වඩාත් ගැඹුරින් හා සංවේදනයෙන් තේරුම් ගැනීමට ඉඩකඩ නිර්මාණය කර දෙයි. සංවාදයේ සහ ආවර්ජනයේ බලය කෙරෙහි විශ්වාසය තබමින්, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ලෙස අප යොමු වී ඇත්තේ COVID-19 මගින් උග්‍ර කරන ලද අභියෝගයන් ඉස්මතු කර දැක්වීමට ය. මෙහිදී මිනිසුන් සහ ප්‍රජාවන් ලෙස බැහැර කිරීමේ හා වෙනස් කොට සැලකීමේ චර්යා රටාවන් අභියෝගයට ලක් වේ. COVID-19 ශ්‍රී ලංකාව පුරා වෙසෙන ප්‍රජාව තුළ අඛණ්ඩව ඉහළ යත්ම, කතන්දර කීමෙන් මතුවන සංවාදයේ සහ ආවර්ජනය කිරීමේ බලයට වාර්ගික ආතතීන් ඇමතීමට, සමාජ සහජීවනය හා විශ්වාසය ගොඩනගා ගැනීමට සහ ප්‍රජාවන් අතර සබඳතා ශක්තිමත් කිරීමට හැකි වේ. උපාය මාර්ගිකව කතන්දර කීම සහ වටිනාකම් මත පදනම් වූ ජාලයක් වන 'සර්වෝදය ශාන්ති සේනා සංසදය' එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමග සහයෝගයෙන් ප්‍රජා සංවාද 60 ක් සහ මුහුණට මුහුණ සංවාද 20 කට වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම ගැන මම සතුටු වෙමි. දිස්ත්‍රික්ක 10 ක ආගමික හා ජනවාර්ගික ප්‍රජාවන්, කාන්තාවන් සහ තරුණයින් වැදගත් යැයි සලකන කාරණා යුරෝපා සංගමයේ අරමුදල සමඟ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ද සහාය ඇතිව ඉවසීම සහ විවිධත්වයට ගරු කිරීමේ ව්‍යාපෘතිය හරහා ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ උත්සාහයක් ලෙස නිරත විය. සමාජ සහජීවනය සහ වාර්ගික සමගිය සඳහා ප්‍රජාවන් ශක්තිමත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සිවිල් සමාජ සංවිධානවලට බලය ලබා දෙයි. ප්‍රජා සංවාද මගින් COVID-19 නිසා ඇති විය හැකි අවදානම් සහ ඔරොත්තු දීමේ හැකියාව පෙන්වන කථාන්දර තුළින් අන්තර් වාර්ගික සමගිය පිළිබඳ, සවිබල ගැන්වීම සහ ප්‍රීතිය හා සාර්ථකත්වයේ ව්‍යවසායක චාරිකා ගැන ලියා ඇත.

ජීවිත කතා හා අත්දැකීම් වලින් යුත් මෙම සම්පාදනය වටිනා සම්පතක් වන අතර, අභියෝගාත්මක කාලවලදී සහයෝගීතාවයෙන් සාමකාමීව ජීවත් වීමට ප්‍රජාවන් සවිබල ගැන්වීමට උපකාරී වේ.

**රොබට් ජුහ්කාම්** | නේවාසික නියෝජිත | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකාව


චීරංග

# කොරන්ටයින් කාලේ අපි මෙහෙමයි රාලේ

මගේ නම චිරංග. වයස අවුරුදු 38 යි. මගේ ප්‍රධාන රැකියාව තමයි පාටිවල ඩී.ජේ කරන එක.

ඊට අමරතව මම හොටෙල් එකක වැඩ කරනවා. කොවිඩ් 19 ගැන දැනගන්නකොට මම හිටියෙ නුවරඑළියේ. මම මගේ නිවාඩුව ගතකරලා ආයිමත් හෝටලේට ආවේ මාර්තු දහතුන් වෙනිදා. හැබැයි හොටෙල් එකේ නතර වෙලා හිටපු ගෙස්ට්ලා එච්චරම බරපතල විදිහට මේක අරගෙන තිබුණෙ නැහැ කියලා තේරුනා.

ඔන්න දැං ලංකාවේ පළමුවැනි රෝගියා වාර්තා වුනා. අර චීනේ එක්කෙනා. කට්ටිය ටිකක් බය වුනා. රජයයයි සෞඛ්‍ය අංශයි තේරුම් ගත්තා මේක යන්නේ මොන පැත්තට ද කියන එක. ඊට පස්සේ PHI ලා පොලිසියෙන් එහෙම ඇවිදින් අපිව දැනුවත් කළා. ඇත්තටම කියනවනම් මම වැඩ කරපු හොටලේ ඉස්සරවෙලාම කළේ නාන තටාංගන දෙකම වහල දැම්ම එක. ඒ කියන්නේ කාටවත්ම පාවිච්චි කරන්න බැරිවෙන විදිහට.

ගෙස්ට්ලා අපිත් එක්ක රණ්ඩු කළා. ඒ ගොල්ලන් ඇහුවා අපි ලක්ෂ ගානක් ගෙවලා අපේ නිවාඩු කාලය ගත කරන්න ඇවිත් තියෙද්දි උඹලා ඇයි පූල් එක වැහුවේ කියලා. ඒක අසාධාරණයි කියල අපිට දෙස් තිබ්බ අයත් හිටියා. උඹල බොරුවට බය වෙනව කියලත් කිව්වා. ඔන්න මාර්තු 20-21 වන විට එයාලටත් මැසේජ් එන්න පටන් ගත්තා. ඉතාලියේ දවසට අච්චරක් මැරෙනව, ජර්මනියේ මෙච්චරක් මැරෙනව කියල. එතකොට තමයි කට්ටියටම පත්තු වුනේ. දවස් කීපෙකට ඉස්සර අපිත් එක්ක ඔට්ටු වෙන්ඩ ආව සුද්දෙ මර බයේ ගැහෙන්න ගත්තා. කොටින්ම අපිත් එක්ක කතා කරන එකත් නැවැත්තුවා. ඒ ගොල්ලන් කොහොමත් හිතාගෙන ඉන්නේ අපි කිසිම තාක්ෂණික දියුණුවක් නැති ගෝත්‍රිකයෝ රැලක් කියලා.

මාර්තු 21 විතර වෙන කොට දැනුම් දුන්නා පුළුවන් තරම් සංචාරකයන් රටෙන් පිටත් කරන්න කියලා. ඒ වෙලේ මාත් එක්ක කතා කළ සුද්දේ කිහිප දෙනෙක්ම කිව්ව අපි නං කීයටවත් මේ රට දාල යන්නේ නැහැ එහේ ගිහිං මැරෙන්න බැහැ කියලා.

මේ කොරෝනා වසංගතේ අපිට තමයි වැඩියම බලපෑවේ. අපි 2020 ලැබුවාම හිතුවා මේ අවුරුද්ද හොඳ වෙයි කියලා. අපිට බුකින්ස් එන්න පටං ගත්තා. මං හිතන්නේ මගේ හෝටලේ විතරක් මැයි මාසේ වෙනකොට රූම් බුකින් 4000 විතර තිබුණා. අපි හරි සන්තෝසෙන් හිටියා මේ සීසන් එකට හොඳ සර්විස් චාර්ජ් එකක් ගන්න පුළුවන් වෙයි කියලා.

කොරෝනා එනකොට ස්ටාෆ් එක 310 ක් විතර හිටියා. ඒ අය අතරින් 100 ක් විතර හිටිය කොන්ත්‍රාත් පදනම මත. ඒ අය එක්ක කිසිම ගිවිසුමක් තිබුණේ නැහැ. කෝවිඩ් ඇවිත් හෝටලේ වහනකොට ඒ අයට නිකම්ම රස්සාව අහිමි වුණා.

හෝටලය නිරෝධායන මධ්‍යස්ථානයක් හැටියට භාරදුන්නේ අප්‍රේල් පළමුවැනිදා. එතකොට හෝටලයට සම්පූර්ණ ආරක්ෂාව, වෛද්‍ය පහසුකම් ආදී හැම දේම සැපයුවේ රජයෙන්.

නිරෝධායනය වෙන අයට පිරිසට සේවය  දෙන්න ඕන කියල දවස් දහතරකට මට මෙහෙ වැඩට එන්න කියල කිව්වේ මැයි පළවෙනිද. ඇත්තටම මට ලොකු  වගකීමක් සහ අවදානමක් එක්ක තමයි වැඩ කරන්න සිද්ධ වුනේ. පිටරට ඉදල එන දවස් 14 ක් නිරෝධායනය වෙන  අයත් එක්ක ගණුදෙනු කරන්න වුනු නිසා ලොකු තිගැස්මකින් තමයි රස්සාව කළේ.

මම අවුරුදු 12 ක් මේ ආයතනයේ වැඩ කරලා තියෙනවා. මේ වාගේ වෙලාවක ආයතනය දාලා යන්නත් බැහැ. රස්සාව නැති කරගෙනත් බැහැ. හැබැයි සමහර ස්ථිර සේවකයෝ කොරෝනා පටන් ගත්තට පස්සේ ගෙදර ගිහින් ආවෙම නැහැ. ඒත් ආයතනයෙන් එයාලට පඩි ගෙව්වා වෙලාවට. මිනිස්සුන්ට බැනලත් වැඩක් නැහැනේ. මේ වාගේ තැනක වැඩකරලා ගමට ගියාම කොන් වෙන්න කවුද කැමති.

අපිට පැය දෙකක පුහුණුවක් දුන්නා. පොඩි පොලු කැල්ලක අග්ගිස්සේ බෝලයක් හයි කරල තියෙනව. ඒ රබර් බොලෙන් තමයි නිරෝධායනය වෙන අයගේ කාමරවල දොරට තට්ටු කරන්නේ. උදේ හත වෙනකොට ගාබේජ් බෑග් එක ගන්න ඕන. අපි දොරට තට්ටු කරල තත්ත්පර 10 ක් යනකොට ඇතුලේ ඉන්න කෙනා ගාබේජ් බෑග් එක එළියෙන් තියනව. අපි ට්‍රොලියට පටවාගෙන යනව. කෑම දෙන ඒවත් එහෙම තමයි. එලියේ පොඩි මේසයක් තියෙනවා. ඒ මෙසේ උඩින් තමයි කෑම ටික තියෙන්නේ. ඒ කෑම ටික තියල ගියාම ඇතුලේ ඉන්න කෙනා විනාඩි 10 කින් කෑම ටික ඇතුලට ගන්නව.

සාමාන්‍යයෙන් අපි බොටම් එකයි ටී ෂර්ට් එකයි අදින්න ඕන. මේස් දෙක දාගන්න ඕන. ගලවුස් දාගන්න ඕන. මම නම් හැම වෙලේම ග්ලවුස් සෙට් 03 ක් දාගත්තා. අපි නානකොට ෂවර් කැප් එකක් දාගන්න ඕන. හැම වෙලේම මාස්ක් එක දාගෙන ඉන්න ඕන. ගාබේජ් එකතු කරන්න යනකොට ඕවරෝල් එක ඇදගන්න ඕන. ඒක දාගත්තම ඔලුවේ ඉදන් වැහෙනව. රෝගීන් දාන එකමයි. හරියටම රසායනික අවි පරිහරනය කරන්න දාන එක වගේමයි. ඒකට උඩින් ලොකු කන්නාඩි දෙකක් දාගෙන ලොකු ග්ලවුස් දෙකකුත් දාගන්නව. ඒ දෙක දාපුවාම අපේ උරහිස් වලට එනකල් වැහෙනවා. අපි දාගෙන ඉන්න ග්ලවුස් ගලවපුවාම දහඩිය ගලනව මිලි ලීටර් දෙතුන් සීයක්. හුස්ම ගන්න එකත් ලේසි නෑ ඒ කිට් එක දාගෙන.

තුන් වේලම එකම මෙනු එකක් යන්නේ. ඒ අයට දෙන මෙනු එකමයි මුළු හෝටලේම වැඩ කරන අයට ලැබෙන්නේ. 12 දවසේ තමයි PCR පරීක්ෂණය කරන්නේ.

සාමාන්‍යයෙන් පී.සී.ආර්. පරීක්ෂණය කරන්නේ උදේ 10.00 ට. දොස්තරල දැනුම් දීල තියෙනව අපි මේ වෙලාවට එනව කියල. එතකොට අපි වෙලාසනින් ගිහින් අර කිට් එක ඇදගෙන ඩොක්ටර්ස්ලා එනකල් බලන් ඉන්නව. දොස්තරලා හතර දෙනෙක් විතර එනව. ආරක්ෂක අංශ වලින් සහ ජෙනරල් හොස්පිටල් එකෙන්. එයාල ඇවිදින් කියනව මේ සෙක්ෂන් එකේ ඉන්න අය අරන් එන්න කියල. එතකොට අපි කාමරවලට තට්ටු කරල එයාල එලියට අරගෙන එලියේ හිටගන්න කියනව. අන්තිම කෙනාවත් එලියට ගත්තට පස්සේ මීටරයක් දුර තියාගෙන මගේ පස්සෙන් එන්න කියනව. එයාලගේ පරීක්ෂණය ඉවර වුනාම ආපසු අරගෙන යන්නත් ඕන. ටිකක් වයෝවෘද්ධ දෙන්නෙක් හිටියා. ඒ දෙන්නා මගේ යටතේ හිටියේ. ඒ මහත්මියට ටිකක් ඇවිදින්න අමාරුයි. රෝද පුටුවෙන් තමයි යන්නේ. අරන් ආවට පස්සේ රෝද පුටුවත් අනිවාර්යයෙන්ම විෂබීජ හරනය කරන්න ඕන. ඊට පස්සේ මමත් ඒ කෙමිකල් එකම ඇඟට ගහගන්නව මැෂින් එකෙන්.

පලමුවෙනි PCR පරීක්ෂණය කරන්නේ එහෙන් ඒ රටවලින් එනකොට. ඒක ගැන වැඩි විශ්වාසයක් නැති නිසා ගුවන් තොටුපලෙනුත් නැවත PCR පරීක්ෂණයක් කරනව. කරල එයාල බස් එකේ ආරක්ෂක අංශත් එක්ක එවනව මෙහට. ආපුවාම අපි කවුරුත් ඒ අයගේ ගමන් මලු බාන්නේ නැහැ. ඒ අයම බාගන්න ඕන.  ඊට පස්සේ අපේ එක්කෙනෙක් ඇවිත් ඒ ගොල්ලන්ව සම්පූර්ණයෙන්ම විෂබීජහරණය කරනව. ඒ ගමන්මලුත් විෂබීජ හරණය කරනව. ඒ හැම දෙයක්ම ක්‍රමානුකූලව වගකීමෙන් කරන්න ඕනේ. මොකද කොතනක හරි පොඩි අතපසුවීමක් වුනොත් ඒකේ ප්‍රතිඵලය හරිම භයානක වෙන්න පුළුවන් නිසා.

ඒ අය දින 14 න් යන නිසා දොලොස්වන දිනයෙදි අන්තිම PCR පරීක්ෂණය කරනව. ඊට පස්සේ 13 වැනි දිනයේදි මැලේරියා පරීක්ෂණය කරනව. එතකොට ඒකටත් අර විදියටම කාමරවල ඉඳලා කැන්දන් එනව. ඊට පස්සේ ලේ ගන්නව. ඊටත් පස්සේ තමයි පරීක්ෂණය කරන්නේ.

ඒ රාජකාරි දවස් 14 ඉවර වුනාම අපි යන්න ඕනේ PHI ළගට. ඊට පස්සේ එයා සහතිකයක් අත්සන් කරල දෙනව දවස් 14 ක් කිසි ප්‍රශ්නයක් නැතුව මේ ආයතනයේ වැඩ කළා දැන් ගෙදර යන්න පුළුවන් කියලා. ඒ සහතිකේ තමයි අපි පාරට බහින්න පාස් එක හැටියට පාවිච්චි කළේ. අපිට ලොකු ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිද්ද වුනා රටේ ගමනාගමනය ඇණ හිටල තිබුනු නිසා. දිස්ත්‍රික්ක අතර ගමනාගමනයක් සිදුවුනේ නැති හන්දා අපට සේවය හමාර කරලා ගෙවල් වලට යන එක ලොකු ප්‍රශ්නයක් වුනා.

අපේ ගම්වල මිනිස්සු අපි දිහා වපර ඇහින් බලන්න ගත්තා.  සමහර සේවකයෝ ගොඩාක් අඩම්තේට්ටම් වලට ලක්වුනා. අපි විදේශිකයොත් එක්ක වැඩ කරන නිසා ගමේ අය කිව්වා ගමට එන්නත් එපා කියලා.  මිනිස්සු හිතාගෙන හිටියේ කොරෝනා එන්නේ විදේශ රටවලින් කියලා. මම කියන්නේ අපේ මිනිස්සු යමක් හරියකට තේරුම් ගන්නේ නැහැ කියලා. අපි ගෙදර ගියාම අපි කොරෝනා ආසාදිතයන් නෙවෙයි කියලා ලියුම තිබුනත් මිනිස්සු අපි ගැන සැකයි කියලා පොලීසියට පැමිණිලි කළා. ඔන්න ඊට පස්සේ පොලිසියෙන් ගෙදරට එනව. ඊට පස්සේ ගමේ මිනිස්සු බලනව මොකද මේ ගෙදරට පොලිසියෙන් එන්නේ කියල. බලන කොට මේ අල්ලපු ගෙදර එක්කෙනා තමා කෝල් කරල කියල තියෙන්නේ. ඊට පස්සේ ආපසු ගෙදර දවස් 14 හිර වෙනව එලියට එන්න බැරුව. එහෙම ප්‍රශ්නවලට අපේ කිහිපදෙනෙක්ම මුහුණ දුන්න. දැනටත් ඒ ප්‍රශ්නෙම තමයි තියෙන්නේ.

ඇත්තටම අපි එන හැම අභියෝගයක්ම අකමැත්තෙන් හරි බාර අරගෙන බලන්න ඕන හරියනවද නැද්ද කියලා. අභියෝගයට මුහුණ දෙන්නේ නැතිව අපිට ප්‍රශ්නවලට උත්තර හොයන්නත් බැහැ. මමත් අකමැත්තෙන් හරි ආපු නිසා මේ කොරෝනා අවදානමේ සහ රජය දියත් කළ ක්‍රියා කලාපයේ නියම තත්ත්වය තේරුම් ගත්තා. දැන් මම අත්දැකීමක් ලබපු නිසා මේ වගේ නෙවෙයි යුද්ධයක් ආවත් බය නැහැ.

**කතාව ඉදිරිපත් කළේ :** ත්‍යාග චන්දන | ගම්පහ දිස්ත්‍රිකය


ප්‍රියදර්ශිනී

# අපේ කුඩා නිවස කඩා ඇයි බිම දැම්මේ

මගේ නම ඒ එම් හර්ෂිකා ප්‍රියදර්ශිනී. මගේ මහත්තයා කොළඹ කොන්ක්‍රීට් වැඩපොලක රස්සාවක් කරනවා. මාස දෙකකට සැරයක් තමයි පඩි අරං ගෙදර එන්නේ. අපි ජීවත්වුනේ මහත්තලාගේ ලොකු අම්මලාගේ ඉඩමේ හදාගත්තු පුංචි අඩි 10X10 ගෙදරක. හදිසියේම කොරෝනා වසංගතය පැතිරෙන්න ගත්තා. පොලිස් ඇඳිරි නීතිය ප්‍රකාශ කළා. මහත්තයා මාස දෙකකින් ගෙර ඇවිත් තිබුනේ නැහැ. එයා කිව්වා පඩි හම්බවුනේ නැති නිසා එන්න විදියක් නෑ කියලා. එයාව කොළඹට හිරවුනා. ඒ වෙලාවේ ගෙදර සීනි ඇටයක්වත් තිබුනේ නැහැ. අඩුම තරමින් කුප්පි ලාම්පුවක් පත්තු කරගන්න තෙල් බිංදුවක්වත් තිබුනේ නැහැ. කවමදකවත් නැති තරමට අපි අසරණ වුනා. අපිටම කියලා වැසිකිලියක් නොතිබුන නිසා අපි පාවිච්චි කළේ මහත්තලාගේ ලොකු අම්මලාගේ වැසිකිලිය. වසංගතේ පැතිරෙන්න ගත්තම ඒ අය වැසිකිලියට ඉබ්බෙක් දැම්මා අපිට යන්න බැරි විදියට.

මම දරු දෙන්නත් එක්කගෙන අපේ අම්මලාගේ ගෙදර ගියා. එහේ සති දෙකක් විතර ඉඳලා ගෙවල් පැත්තේ ගොඩවුනා දරුවන්ගේ ඇඳුම් ටිකක් අරං එන්නත් එක්කලා. අපේ ගෙදරට හරිහමන් දොරක් තිබුනේ නැහැ. පිට ලෑලි කීපෙකට ඇන ගහලා යාන්තමට අටවාගත්තු දොරක් තිබුනේ. මම ගෙදරට යනකොට දොර ඇරිලා තිබුනා. මං හිතුවා හුළඟට ඇරෙන්න ඇති කියලා. දරුවන්ගේ අඩුම කුඩුම ටිකත් අරං මං දොර වහලා දාලා ආයිමත් අම්මලාගේ ගෙදර ගියා.

සතියකට විතර පස්සේ අම්මලාගේ ගෙදරට පොලීසියෙන් ආවා. හොරෙන් කසිප්පු පෙරන්න මගේ නිවස දුන්නා කියලා මට හොඳටම දොස් කිව්වා. මං නැති දවස්වල රෑට රෑට මගේ නිවස කසිප්පු පෙරන්නට පාවිච්චි කරඇති බවත්, නැවත එවැනි නීති විරෝධි කටයුත්තක් සිදුවුවහොත් මට හිරේ විලංගුවේ වැටෙන්නට සිදුවන බවත් දන්වා පොලීසියේ මහත්තුරු පිටත්ව ගියා.

සතියකට විතර පස්සේ මට ආරංචි වුනා රාත්‍රියේ මගේ නිවස සෝදිසි කළ පොලිස් නිළධාරීන් නිවස තුල කසිප්පු පෙරමින් සිටි අය හතර දෙනෙක් කුදලාගෙන ගිහින් ඇති වග. එදම රෑ දොළහට විතර මහත්තයාගේ ලොකු අම්මලාගේ දුවලා මා නැවතී සිටි අපේ අම්මාගේ ලෙදර ආවා. මට පරුස වචනයෙන් බැන්නා මම පොලීසියට ඔත්තු දුන්නා කියලා. උඹට ආයිමත් ඉඩම පැත්ත පලාතට එන්න ඉඩ දෙන්නේ නැහැ කියලා තරවටු කළා. ඒ අය හිතලා තියෙන්නේ කසිප්පු පෙරනවා කියලා ඔත්තුව දුන්නේ මම කියලා. ඒ වුනාට මං හාංකවිසියක් දන්නේ නැහැ මේ සිද්ධිය ගැන.

පහුවදා උදෙන්ම මම හිත හයිකරන් දරුවෝ දෙන්නත් එක්ක අපේ ගෙදරට ගියා. ඒ යනකොට අපේ පුංචි ගේ කඩලා බිමට සමතලා කරලා තිබුනා. මේක මහ පොළොව නුහුලන අපරාධයක්. මම ඉතිරිවෙලා තිබුනු බඩුටික පොදි ගහගෙන ආයිමත් අපේ අම්මලාගේ ගෙදරට ගියා.

මාස හතරකට පස්සේ මහත්තයා ගෙදර ආවා. ඒ වුනාට අම්මලා එන්න එන්නම අපිට නුහුරට සලකන්න ගත්තා. දරුවන්ට නිතර පරුස වචනයෙන් බැන වැදුනා. ටොකු ඇන්නා. සැරවැර කරන්න පටන් ගත්තා.

මේ කෙනෙහිලිකම් ඉවසාගෙන ඉන්න බැරිතැන මහත්තයයි මමයි රජයේ ඉඩමක මැටියෙන් බිත්ති බැඳලා වටේට ඉටිරෙදි වලින් වහගෙන යාන්තමට අපට ඉන්ඩ පැලක් අටවාගත්තා. ඒ වුනත් දින

පහක් ගතවුන තැන මහවැලි නිළධාරීන් ඇවිත් අනවසර ඉදිකිරීම් කරන්න එපා කියලා අවවාද කරලා අපේ නිවස කඩා බිඳ දැමුවා. දැන් අපි ආයිමත් යන එන මං නැති අනාථයින් බවට පත්වුනා. ඊට පස්සේ අසල තිබූ බෝගසක් යට දවල් කාලය ගතකළා. රාත්‍රියට කඩා දැමූ නිවසේ ඉතිරිව තිබූ කණුවකට බැඳගත්තු ඉටිරෙද්දක් යට නිදා ගත්තා. අපට කාගෙන්වත් පිළිසරණක් ලැබුනේ නැහැ. දවස් දෙකක් දරු දෙන්නත් අපි දෙන්නත් නිරාහාරව සිටියා. වතුර විතරමයි. තුන්වන දවසේ අසල කඩයකින් බත් පාර්සලයක් ලැබුනා. ඒක දරුවන්ට කන්ඩ දීලා අපි දෙන්නා නිරාහාරව සිටියා. දින ගනනක් ගතවුනත් වගකිවයුතු කිසිම නිළධාරියෙක් අපේ දුක සැප සොයා බලන්නට ඉදිරිපත් වුනේ නැහැ.

අන්තිමේ අපි දෙන්නා ප්‍රාදේශීය ව්‍යාපෘති නිළධාරී මහත්තයා හම්බවෙලා අපේ දුක්ගැනවිල්ල ඉදිරිපත් කළා. අපේ කථාවට සාවධානව සවන් දුන්න ඒ මහත්තයා ඡන්ද රාජකාරි ඉවර වෙනතුරු ප්‍රජා ශාලාවේ නැරඹුම් වේදිකාවේ ඉන්නා ලෙස අවසර දුන්නා. දැන් අපි ඉන්නේ එතන. තව කොච්චර කාලයක් මෙහෙම ඉන්න ඉඩ දෙයිද කියලා උඩ ඉන්න දෙයියෝ විතරයි දන්නේ. අපි හරියටම අහිකුණ්ටිකයෝ ගානට වැටිලා.

**කතාව ඉදිරිපත් කළේ :** සඳුන්පුර රේවතාලංකාර ස්ථවිර | ගම්පහ දිස්ත්‍රික්කය

# කොනකලගල අලංකාරේ

කෝවිඩ් වසංගත කාලේ අපේ රටේ ප්‍රාදේශීය ආගමික නායකයින් කළ මෙහෙය වචනයෙන් ලියා තියන්නට බැරි තරම්. බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් යන මෙරටේ ස්ථාපිත ප්‍රධාන ආගම් හතරටම අයත් පූජක පක්ෂය, වසංගතයෙන් මිනිසුන් බේරාගන්නට පෙරට ආවා. තම තමන්ගේ ඇදහිලි සහ විශ්වාසයන් පසෙකලා ඔවුන් එකම රටක්, එකම ජාතියක් ලෙස නැගී සිටිමින් අවස්ථානුකූලව කළ මැදිහත්වීම් නිසා සිදුවූ මෙහෙය අප්‍රමාණයි. මේ මොවුන් එකට එක්වී දියත් කළ පළමු මෙහෙයුම නෙවෙයි. කාලාන්තරයක් තිස්සේ සර්වෝදය ශාන්තිසේනා සංසදය සමඟ එක්ව කටයුතු කරන මේ ප්‍රාදේශීය ආගමික නායකයින්, සර්වෝදයේ දර්ශනයට අනුව, ගමින් ගමට යමින් සැමට සේවය කිරීමට සැදී පැහැදී සිටිනවා.

කෝවිඩ් වසංගතය එන්නට කලිං සිටම මහනුවර දිස්ත්‍රිකයේ අකුරණ ග්‍රාමය කරුණු කාරණා කිහිපයක් නිසා ලාංකේය ප්‍රජාව අතර කථාබහට ලක්වූ ප්‍රදේශයක්. 2018 අවුරුද්දේ මාර්තු මාසයේ, දෙපිරිසක් අතර හටගත් ගැටුමක් හේතුවෙන් ඇතිවූ අවාසනාවන්ත තත්ත්වය නිසාවෙන් අකුරණට ඇඳිරි නීතිය පැනවුනා. ජාති ආගම් බේදයෙන් තොරව ඒ අවස්ථාවේ පෙරට ආවෙත් මේ සර්වෝදයෙන් පන්නරය ලත් තරුණ සහ වැඩිහිටි ආගමික නායකයින්මයි. නිතර පහේ මුණ ගැසී තම තමන්ගේ ගැටළුවලට ප්‍රාදේශීව පිළිතුරු සොයාගන්නා මේ අන්තර් ආගමික සහෘද සංගමයට ගැටුම් නිරාකරණය පිළිබඳව ඇත්තේ හසල දැනුමක්.

කෝවිඩ් කියන්නේ එක්තරා ආකාරයක ජීවිතයත් මරණයත් අතර ගැටුමක් ලෙස අර්ථ දක්වන්නට පුළුවනී. හදිසියේ පනවන ලද ඇඳිරි නීතිය නිසා මුළු රටේම මිනිසුන් අසරණ වූවා. වෛරසයෙන් ආසාදනයට පත්වූ රෝගීන් කිහිප පොලක්ම හමුවූ නිසා අකුරණ ග්‍රාමය සම්පූර්ණයෙන්ම වසා දැමුවා. හමුදාව, පොලීසිය එකතුව අකුරණට යන එන සියළුම මාර්ග අවහිර කළා. එළිපහලියට යන්නටවත් බැරිව ගම්මු නිවෙස් ඇතුලේ හිර වුනා.

අලවතුගොඩ, කොනකලගල ශ්‍රී සද්ධානන්ද මහා පිරිවෙනේ පරිවේනාධිපති පූජ්‍ය කොනකලගල උදිත ස්වාමීන්වහන්සේ ....

ආන්ඩුව ඇඳිරි නීතිය දැම්මේ ගහෙන් ගෙඩි එනවා වාගේ. කිසිම පෙර දැනුම් දීමක් නැහැ. ආණ්ඩුවටත් වෙන කරන්ඩ දෙයක් තිබුනෙත් නැහැ. ඒ වෙලාවේ අපේ පිරිවෙනේ ඉගෙන ගන්නා හාමුදුරුවරු අනූවක් හිටියා. ඉස්සර අපට දනේ පූජා කරපු මිනිස්සු කැලෑ පාරවල් වලින් පංසලට ආවා තමන්ගේ දුක කියාගෙන. කෑම ටිකක් ඉල්ලා ගන්ඩ, බෙහෙත් හේත් තියෙනවද අහන්ඩ, හදිසි අතමාරුවක් ඉල්ලා ගන්නඩ. මං කීප දෙනෙකුට හදිස්සියකට ගන්න කියලා පංසලේ අරං තිබ්බ සල්ලි දුන්නා. මෙහෙම ආව සමහරු රජයේ රැකියාවල් කරන, පෞද්ගලික අංශයේ ලොකු තනතුරු දරන අය. ඒ අයගේ සල්ලි බැංකුවල තිබුනට කොහොමද බැංකුවකටවත් යන්නේ.

ඔය අතරේ ගමට පිටින් ආවා පොලීසියේ, STF එකේ නිළධාරී මහත්තුරු. ඒ හැමෝටමත් පංසලේ නවාතැන් පිළියෙල කරන්න සිද්ධ වුනා. වතුර ප්‍රශ්නේ තමයි තදින්ම බලපෑවේ. ගමට එන්න පොලිස් මුරපොලවල් තුන හතරක්ම තිබුන නිසා වෙළෙන්දේ කවුරුවත්ම මෙහේ එන්න මැලි වුනා. සමහර ගම්මුන්ට ඉස්පිරිතාලේ යන ලෙඩක් අසනීපයක් වුනාමත් ආවේ පංසලට. අපි කවුරු හරි දයකයෙකුගේ

වාහනයක් සූදානම් කළත් ගමෙන් එළියට යන්න ක්‍රමයක් නැහැ. ලොක් ඩවුන් කියන එක හොඳටම අත් වින්දේ අපි. පංසලේ නවාතැන්ගෙන සිටි කවුරුවත්ම වසංගතේට ගොදුරු නොවෙන්නට අවශ්‍ය පිළියම් සියල්ලක්ම යෙදුවා. ගෑස්, පොල් වාගේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිගයක් එනවා දකිද්දි අපි අදාල නිළධාරීන්ට ඒ බව දැනුම් දුන්නා. විසාල උත්සාහයක් දරලා කොහොම හරි ඒ අවශ්‍යතා සම්පූර්ණ කරගත්තා.

අකුරණ විලානගම පදිංචි යූ එස් එම් එම් හුසේන් මහත්තයා කොනකගල උදිත ස්වාමීන්වහන්සේ ගේ කිට්ටු හිතවතෙක්. ප්‍රදේශවාසීන් විසින් දියත් කරන අන්තර් ආගමික සහජීවන ක්‍රියාවලියේ සක්‍රිය සාමාජිකයෙක්.

අපි මුලින්ම කළේ දුර පලාත්වල හිටපු අපේ දරුවන්ට වහාම ගමට එන ලෙස අවවාද කිරීම. මේ වාගේ ව්‍යසනකාරී අවස්ථාවක මුළු පවුලේම සාමාජිකයින් එක තැනකට ගාල් වුනාම හිතට නිවනයි. අපි කථා වෙලා සතියකට විතර සෑහෙන්න වියලි ආහාර ගබඩාකර ගත්තා. ඒත් අපට තේරුම් ගියා මේක සතියකින් හමාරකින් ඉවර වෙන කෙරුවාවක් නෙවෙයි කියලා. අපි තරුණයෝ කීප දෙනෙක් ගෙදරට රැස් කරලා පුංචි සාකච්චාවක් තිබ්බා, මේ වෙලාවේ ධර්මානුකූලව ගන්න ඕනේ තීරණ මොනාද කියලා හොයලා බලන්නට. දෙවනුව ඈත දුර සිටින අයට ශක්තියක් වෙන්නේ කොහොමද කියලා හොයලා බැලුවා. අපිට තිබුනු ලොකුම ප්‍රශ්නේ පානීය ජලය මදිකම. අපේ ගම හරහා ඇලක් ගලනවා. ඉස්සර අපි පොඩි කාලේ එතන තමයි නෑවේ. දැන් වල් වැදිලා. අපේ ළමයි එකතු වෙලා මේ නාන තොටුපල පිලිසකර කළා. ලොකු පිරිසකට එක්කාසු වෙන්න එපා කියපු අවස්ථාවක වුනත් ගමේ අවශ්‍යතාවක් වෙනුවෙන් කට්ටිය ඉදිරිපත් වුනාම හැමෝගෙම හිත් අළුත් ජවයකින් පිරුනා.

අපි තීරණය කළා අපේ කොනකලගල නායක හාමුදුරුවන්ටත් කථා කරලා, පංසලයි පල්ලියයි එකතු වෙලා, අසරණ වෙච්ච පවුල් වලට උදව් වෙන්න වැඩ පිළිවෙලක් හදන්න ඕනේ කියලා. අපි කොච්චර දුරට හිතුවද කිව්වොත් නාස්තිය අවම කරමින් ගමේ අයගේ ඉඩම් වල වැවුනු එළවළු පළතුරු ගමටම ප්‍රයෝජනය ගන්න පුළුවන් විදියට ආරක්ෂා කරගන්නා ආකාරය ගැන පවා කථා කළා. අපි ගොඩක් ඉදිරියට හිතලා පුරන් කුඹුරුවල එළවළු වගා කළා. අපේ හාමුදුරුවෝත් මේ වාගේ ආපදාවකින් ගොඩ එන්නට මුස්ලිම් මවුලවීලත් සරල චාම් ජිවිතයකට හැඩගැසීමේ ආනිසංස පිළිබඳව ආගමික ඉගැන්වීම් නිතර සිහිපත් කර දුන්නා.

## පූජ්‍ය කොනකලගල උදිත ස්වාමීන්වහන්සේ

අපේ තියෙනවා අකුරණ ප්‍රාදේශීය සුහදතා පදනම කියලා සංවිධානයක්. දැං අපට අවුරුදු විස්සක් වයසයි. මේ සංවිධානය අන්තර් ආගමික සංවිධානයක්. මේ වෙලාවෙ අපි දුරකථන මගින් සම්බන්ධ වෙලා එකිනෙකාගේ දුක සැප හොයලා බැලුවා. තියෙන විදියට අපිට ලැබුනු වියලි ආහාර ද්‍රව්‍ය පවුල් අතරේ බෙදාහදා ගත්තා. විශේෂයෙන්ම මුස්ලිම් ගෙදරක අකරතැබ්බයක්, මලගෙයක් වුනාම පංසලට කථා කළා. ඒ වෙලාවේ අපි ශාරීරිකව වෙන්ව සිටියත් තීරණ ගත්තේ එක හිතකින්. ආගමික සහජීවනය හොඳටම අත් විඳපු අවස්ථාවක් මේ කෝවිඩ් ඇඳිරි නීතිය.

**හුසේන් මහත්තා**

බඩගින්නට ජාති, ආගම් බේද නැහැ. අපි හැමෝටම දැනෙන බඩගින්න එකයි. කොනකලගල නායක හාමුදුරුවෝ ළඟ හොඳ සැලැස්මක් තිබුනා. අකුරණ ඉන්නවා හයිය තියෙන මුදලාලිලා. අපි ඒ අයට කථා කරලා අත්‍යවශ්‍ය ආහාර පරිත්‍යාග කරන ලෙස ඉල්ලීමක් කළා. කවුරුවත්ම දෙසැරයක් හිතන්නේ නැතිව ස්වේච්ඡාවෙන්ම උදව් කරන්න පෙරට ආවා. අපේ තරුණ පිරිස ඒකරාසි වෙලා, පිළියෙල කරපු වියලි ආහාර පාර්සල් අවශ්‍ය අයට බෙදලා දුන්නා. පංගු පේරු බැලිල්ලක් එතන තිබ්බේ නැහැ. ඕනේ කාටද අපි දුන්නා. අපේ ගමේ කාන්තාවක් දරුවෙක් ප්‍රසූත කළා. දවසයි දෙකයි දරුවා මැරුණා. අපි ඉක්මනින්ම අදාල නිළධාරීන් දැනුවත් කළා. හාමුදරුවෝ මැදිහත්වෙලා මරණය සිදු කරන පිළිවෙල සාකච්චා කළා. එදා රටේ පනවා තිබූ නීති රීති වලට අනුගතව අවමංගල්‍ය කටයුතු කරන්න ඕනේ කියලා හැමෝම එකඟ වුනා. අපි කොයි තරම් පරිස්සමට ඒ කටයුතු කළාද කිව්වොත් දරුවගේ මිනිය සෝදපු වතුර බිංදුවක්වත් කාගෙවත් පයට නොපෑගෙන්න වගබලා ගත්තා.

ඒ වෙලාවේ අපි ක්‍රියා කරපු විදිය ගැන පොතක් ලියන්න පුළුවනි. ජාතික සහ ආගමික සහජීවනය කියන්නේ මොකක්ද කියලා මුළු රටටම පෙන්වන්න පුළුවන් ආදර්ශමත් කථාවක් අපිට කියන්න තියෙනවා.

**පූජ්‍ය කොනකගල උදිත ස්වාමීන්වහන්සේ**

අකුරණ ගැන පැතිරිච්ච ගොඩක් කථා සත්‍ය ඒවා නෙවෙයි. ඒවායේ බහුතරය ප්‍රබන්ධ කථා. පට්ටපල් බොරු. අපි එක රටක එකම ජාතියක මිනිස්සු විදියට සාමදනෙන් කටයුතු කරද්දි, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සහ සමාජ ජාල හරහා කටකථා පැතිර ගියේ විදුලි වේගෙන්. ඒක හරිම නරක ප්‍රවනතාවක්. අපි ලොක් ඩවුන් එකට අහුවෙලා ජාති, ආගම්, කුල බේද අමතක කරලා එක බඩවැල කඩාගෙන ඉපදිච්ච පවුලක් වාගේ කටයුතු කරපු වෙලාවේ අකුරණ ගැන රටේ පැතිරුනේ වෙනම කථාවක්. වාසනාවට අපි ඒ කථා අභිබවා අපේ පවුලේ සාමය පවත්වා ගත්තා. අපි සිහිබුද්ධියෙන් කටයුතු නොකරන්නට තත්වය වෙනස් අතට හැරෙන්නට ඉඩ තිබුනා. දැන් වසංගතය පාලනය වෙලා. ඒ වුනාට ඒ දවස් වල අපි අතරේ හටගත් ආදරේ දේර ගලනවා. ඒ මොන තරම් ආනන්දයට කාරනාවක්ද !!!

**කතාව ඉදිරිපත් කළේ :** ජී එස් ටී දිල්ශානි සහ යසින්තා අබේසිංහ | මහනුවර දිස්ත්‍රික්කය


රෝෂිනි

# ඉතාලියෙන් මෙ-තාලියට

මම රෝෂිණී පෙරේරා. මගේ මහත්තයා නිරෝෂ්. දැන් මට හතලිස් නවයයි. මගේ ලොකු පුතාට දසයයි. දෙවැනියට දහයයි. අපි හිටියේ ඉතාලියේ. කෝවිඩ් වසංගතය ඉතාලියට ඉතාමත්ම දරුණු විදියට බලපෑවා. වසංගතය සීඝ්‍රයෙන් පැතිරෙද්දී පෙබරවාරි දෙවැනි සතියේදි මුළු ඉතාලියම ලොක් ඩවුන් කළා. දරුවන්ගේ ඉස්කෝල වැහුවා. අපි ගෙවල් ඇතුලේ කොටුවුනා. බහුතරයකට රස්සාවලුත් නැති වුනා. දිනෙන් දිනම මේ අර්බුදය උග්‍ර වෙද්දී අපිට කරකියා ගන්න දෙයක් නැතිව ගියා. අපේ ලොකු පුතාට කොහොමත් පුංචි කාලේ ඉඳලම පොඩි පහේ හුස්ම ගන්න අපහසු කමක් තිබුනා. මොන බෙහෙත් දුන්නත් මේ හතිය හොඳ කරගන්න බැරිවුනා. ලොක්කගේ මේ අසනීප තත්ත්වය නිසාම වසංගතය පැතිරෙන්න ගත්තම අපි හොඳටම බය වුනා.

මේ අතරේ ලංකාවෙන් මිලාන් වලට ගුවන් යානා එන එක නතර වුනා. ඩුබායි ගුවන් සමාගමක් මාර්තු මාසේ දෙලොස් වෙනිදා තමන්ගේ අන්තිම ගුවන් ගමන සංවිධානය කරනවා කියලා අපිට තොරතුරැක් ලැබුනා. ලොකු පුතාගේ  අසනීපෙත් නිසා මහත්තයා මට බල කළා දරු දෙන්නත් එක්ක ඉක්මනින්ම ලංකාවට යන්න කියලා. එයා එහේ රස්සාවක් කළ නිසා නතර වුනා. ලහි ලහියෙම මම දරු දෙන්නා එක්ක දෙලොස් වෙනිදා රාත්‍රියේ මිලානෝ වලින් පිටත් වුනා.

ලංකාවට එන ගුවන් යානය පිටත්වන තුරු ඩුබායි ගුවන් තොටුපලේ පැය දහයක් හිරවෙලා හිටියා. අපි අතර සිටි සියළුම දෙනා තමන්ගේ දරුවොත් එක්ක ලංකාවට එන අය. ලංකාවට ගොඩබැහැපු ගමන්ම අපට දැනුම් දුන්නා ඉතාලියේ සිට පැමිණි අය තමන්ගේ ආසනවලම රැඳී ඉන්න අනිත් රටවලින් ආ පිරිස පමණක් බහින්න කියලා. හමුදාවේ නිළධාරීන් ඇවිත් අපව එලියට ගත්තා. අපේ ගමන් මළු සියල්ලම විෂබීජහරනය කරලා වෙනම තැනක ගොඩගහලා තිබුනා.

ඊට පස්සේ අපි සේරම බස්වල දාලා පූනානි නිරෝධායන මධ්‍යස්ථානයට අරං ගියා. දින දහතරක් නිරෝධායනය වෙලා අපි නැවත ගෙවල් වලට එන්නට පිටත් වෙනකොට අපිට රජයෙන් සහතිකයක් දුන්නා. අපි යක්කල පොලිස් ස්ථානයට ආවාම අපේ නෑදෑයෝ ඇවිත් අපි තුන්දෙනාව ගෙදර එක්ක ගියා.

අපි ගෙදරට ගොඩවෙලා විනාඩි දහයක් ගියේ නෑ ග්‍රාමසේවක මහත්තා ආවා. නිරෝධායන සහතිකයක් නිකුත් කර තිබුනත් තවත් දින දහතරක් නිවසටම වී සිටින ලෙස උපදෙස් දුන්නා. මගේ ලොකු පුතාට හතිය ඇති නිසා සෞඛ්‍ය නිළධාරීන් නිතර අපේ ගෙදරට ඇවිත් දරුවව පරීක්ෂා කළා. ගමේ අය සැක කළා අපේ ගෙදර කාට හරි කොරෝනා හැදිලා නිසයි මේ වරින් වර සෞඛ්‍ය නිළධාරීන් එන්නේ කියලා. අපේ ගේ වටේටම තාප්පයක් තියෙන නිසා කාටත් කරදරයක් නැහැ. නමුත් දරු දෙන්නා සෙල්ලං කරන්න හරි මිදුලට ආව හැම වෙලාවකම අපේ අසල්වැසියෝ පොලීසියට කථා කරලා ඔත්තු දුන්නා. පොලීසියෙන් පස්වතාවක්ම අපේ ගෙදරට ආවා. අහල පහල කට්ටිය අපි ඉතාලියේ ඉඳන් කොරෝනා ගෙනාවා කියලා නිතරම ඇනුම් පද කිව්වා. කිසිම කෙනෙක් අපි වෙනුවෙන් ඉදිරිපත් වෙලා වචනෙකින්වත් උපකාරයක් කළේ නැහැ. දවසක් අපේ ගෙදර ඉදිරිපිට විසාල කුණු කන්දක් ගොඩගහලා තිබුනා. අපිත් එක්ක දුක සැප බෙදාගත්තු මිනිස්සු මේ තරම්ම අකරුණාවන්ත වුනේ කොහොමද කියලා මට හිතාගන්නවත් බැහැ. සමහර අසල්වැසියෝ අපිත් එක්ක රණ්ඩුවටත්

ආවා. මම පොලීසියට පැමිණිල්ලක් දන්න ගියත් පොලීසියේ කට්ටියත් අපට කොරෝනා ආසාදිතයින් වාගේ හරිම නරක විදියට තමයි සැලකුවේ.

මගේ කිට්ටු හිතවතියක් ඉන්නවා මිනුවන්ගොඩ. එයා විතරමයි නිතර කතාකරලා අපේ දුක සැප ඇහුවේ. වාසනාවට එයාගේ සහෝදරයා පොලීසියේ උසස් නිළධාරියෙක්. එයා හරහා තමයි අපිට ඕනෑ කරන කෑම බීම, වියලි ආහාර ටික ගෙන්වා ගත්තේ. ඔවුන්ගේ කරුණාව නොලැබෙන්න මමත් දරුදෙදෙනාත් ලොකු අමාරුවක වැටෙන්නට ඉඩ තිබුනා.

අපි ලංකාවට ආවේ අපේ දරුවන්ගේ ඉගෙනීම් කටයුතු අඛන්ඩව කරගෙන යන්නට තිබුනු වුවමනාව නිසා. නමුත් ඒ අවස්ථාවන් සියල්ලම අපට මගහැරුනා. දැන් මගේ මහත්තයාටත් රස්සාව අහිමි වෙලා. මේ අකටයුතුකම් වලට මුහුණ දීලා දරුවොත් විසාල මානසික පීඩනයකට ලක්වෙලා ඉන්නවා. අපි දැං මේ අමාරුවෙන් ගොඩනගා ගත්තු නිවස අතහැරලා වෙනත් ප්‍රදේශයකට යන්න තීරණය කරලයි තියෙන්නේ. අපට ඒ තරම්ම මේ ගමේ මිනිස්සු අපෝ වෙලා. තමන්ගේම කියලා හිතාගෙන ආස්සරේ කරපු මිනිසුන් මෙතරම්ම සහාසික වෙයි කියලා අපි හීනෙකින්වත් හිතලා තිබුනේ නැහැ. හැබැයි මං එකක් කියන්න ඕනේ. ගමේ මිනිස්සු අවුල් වුනාට මේ ක්‍රමය අවුල් නෑ.

**කතාව ඉදිරිපත් කළේ :** එම් ඩබ් ඒ එච් විජේසූරිය | ගම්පහ දිස්ත්‍රික්කය

# හැබෑට මෙහෙමත් නාටක

මගේ නම නිලුකා සඳමාලි. මගේ ස්වාමි පුරුෂයා වඩු වැඩ කරන්නෙක්. අපට දරුවෝ දෙන්නෙක් ඉන්නවා. ලොක්කා ඉස්කෝලේ යනවා. පොඩ්ඩා මොන්ටිසෝරියේ. අපි කොහොමත් ජීවිතේ ගැටගසා ගත්තේ අමාරුවෙන්. මගේ මහත්තයාගේ දවසක පඩිය රුපියල් 2500 ක් විතර. ඒකත් වැඩ තිබුනොත් විතරයි. ඒකෙන් ගෙදර වියදමට දෙන්නේ පන්සීයයි. එයා හරියට සිගරට් අරක්කු බොනවා. කෝවිඩ් වසංගතේට ඉස්සර ඉඳලම මට ගහනවා බනිනවා. ළමයින්ටත් හරියට බනිනවා. තාත්තා වුනාට ළමයි එයාට හරිම බයයි. කෝවිඩ් කාලේ එයාට රස්සාව නැතිවුනා. අපේ ජීවිත එන්න එන්නම අමාරු වුනා.

අප්‍රේල් 18 වැනිදා ලොකු පුතාට උණ හැදුනා. පැනඩෝල් පෙත්තක් දීලා බැලුවට උණ බැස්සේ නැහැ. මං හරියට බය වුනා දරුවට ඉහෙන් බහින අසනීපයක්වත්ද කියලා. අහල පහල අය මට හොඳටම දෙස් තිබ්බා හරියටම දරුවා අසනීප වුනේ මගේ වැරැද්දකින් වාගේ. වියදමට අතේ සතේ නැහැ. සමන්තට කිසිම ගානක් ඇත්තෙත් නැහැ. එයා මේ කිසිම ප්‍රශ්නයක් නෑහුනා වාගේ උදෙන්ම ගෙදර කරදර මගඇරලා වෙලට ගියා මාළු බාන්ඩ කියලා. කොච්චර බැගෑපත් වුනත් ගමේ කවුරුවත්ම සතයක් ණයට දුන්නේ නැහැ. දරුවට අසනීපයි කිව්වත් බැරිවුනා අතමාරුවක් ගන්ඩ. කොහෝම හරි මහන්සිවෙලා ණයට රුපියල් දහක් හොයාගත්තා. අඳුරන කෙනෙකුගේ ත්‍රී වීල් එකක දාගෙන දරුවව ගම්පහ ඉස්පිරිතාලෙට අරං ගියා.

හවස පහ විතර වෙනකල් දරුවව ඉස්පිරිතාලේ තියාගෙන හිටියා. ලොකු දොස්තර ඇවිත් දරුවගේ ටිකට් කැපුවා මේ ළමයට කෝවිඩ් නෙවෙයි කියලා. ඒ දවස්වල රටපුරා දිගටම ඇඳිරි නීතිය. පාරවල් පාලු වෙලා කිසිම වාහනයක් නැහැ ගෙදර එන්න. ඉස්පිරිතාලේ ඉඳලා අපි ඉන්න චන්දන ගමට කිලෝ මීටර හතක් විතර තියෙනවා. මං තට්ට තනියමේ දරුවත් වඩාගෙන ඒ දුර පයින්ම ගෙදර ආවා. මේ දුක ඉවසා ගන්න බැරිව මං පාර දිගේ මහා හයියෙන් අඬ අඬා ආවේ.

ගෙදරට අඩිය තිබ්බ ගමන්ම අපි මෙච්චර පරක්කු වුනේ ඇයි කියලා සමන්ත අපට හොඳටම බැන්නා. අහල පහල අය බැන්නා දරුවව ඇයි ගෙදර ගෙනාවේ කියලා. මං පැහැදිලි කළා දරුවට කෝවිඩ් නෙවෙයි සමාන්‍ය උණක් හැදිලා තියෙන නිසා දොස්තර මහත්තයා ටිකට් කැපුවා කියලා. ඒ වුනත් ඒ අය මගේ කථාව පිළිගත්තේ නැහැ. උඹලා ගේ ඇතුලෙම සති දෙකක් හිටපල්ලා කියලා ගමේ මිනිස්සු අපට තර්ජනය කළා. ඇත්තටම අපි ගෙදරටම කොටු වුනා.

වාසනාවට පුතාගේ පංතියේ ටීචර් කෙනෙක් අපිට සති දෙකෙන් දෙකට බඩු මල්ලක් එව්වා. ග්‍රාම සේවක නෝනත් වියලි සලාක ගෙනැත් දුන්නා. සමුර්දියත් හම්බවුන නිසා යාන්තමට ජීවිතේ ගැටගහ ගත්තා. ඒ වුනාට මට නං පිරිමි සංහතියම එපා වුනා. මේ තරම් අකරතැබ්බයක් වෙලත් අපේ එක්කෙනා නෙවෙයිනේ ඔලුව උස්සලා බැලුවේ.

**කතාව ඉදිරිපත් කළේ :** ශ්‍යාමලී කුරුප්පු | ගම්පහ දිස්ත්‍රික්කය



# සෝකය දුක ආවත් මට කොයි තරම්
# මම දලා යන්නේ නෑ මගේ සුදු රත්තරං

මේක පොඩි චිත්‍රපටි කතාවක්. හැබැයි සිරිපාල හා රන්මැණිකා වාගේ සත්‍ය කතාවක් ඇසුරින් හැදුනු චිත්‍රපටියක්. පොඩි ටෙලියකට වුනත් හොඳයි කතාව. කෙල්ල රාජාංගණේ. කොල්ල කැකිරාවෙ.

කෙල්ල මාලිනී. කොල්ලා ගාමිණී. දෙන්නා සෙට් වෙන්නේ අනුරාධපුර ටෙක්නිකල් කොලීජියේ කෝස් එකක් කරන අතරෙදි. ටික දවසක් යනකොට වැඩේ සීරියස්. දෙන්නගෙ ආදර කතාව අනුරාධපුරෙන් මිහින්තලේට එතැනින් සීගිරිය පැත්තට, සීගිරියෙන් තලාවට, තඹුත්තේගමට, විලච්චියට මැදවච්චියට ලව් ගින්න වාගේ පැතිරුනා. දෙපැත්තේම කට්ටිය කැමති වුනා. ඈවරයි දෑවරයි කම්මුතුයි. මගුල ඉස්තීර වුනා. කෝස් එක ඉවර වෙනකල් හදිස්සි වෙන්න එපා කියලත් ඇඩ්වයිස් හම්බුනා. කොල්ලගේ අප්පච්චි දීපු ඉඩම් කෑල්ලක දෙන්න ගෙයක් හදන්න ගත්තා. කෙල්ලගේ වත්ත වටේ තිබුනු තේක්ක ගස් ටික කපලා දොර ජනෙල් හදන්න කැකිරාවට පැටෙව්වා. ඔන්න ඒ කෝස් එක ඉවර වුනාම මාලිනී එච්එන්ඩී කරන්න ගත්තා. කොල්ලා රස්සාවකට කොළඹ ගියා. මාස කීපයක් ගතවුනා. දවසක් කෙල්ල වැලහින්න වාගේ පොලොවේ පස් කකා වැලපෙනවා. අනේ ගාමිනී මාලිනීව අතඇරලා ගීතව බැඳලා. හපෝයි මෙහෙමත් චපල ජාතියක්.

කාලයාගේ ඇවෑමෙන් කෙල්ලට ආණ්ඩුවේ රස්සාවක් හම්බ වෙනවා. වැඩකරන තැන ඉන්නවා විජේ. ජැංඩි කොල්ලා. දෙන්නා අහුමුළුවල කුටු කුටු ගානවා. පොඩි පොඩි තෑගි බෝග එහෙමත් හුවමාරු කරගන්නවා. ඔහොම ගිහිං ගිහිං මගුලට දින තීරණය කරගන්නවා. ජූලි විසි තුන. හත් දෙයියනේ කෝවිඩ් ඇවිත් රාජාංගනය ලොක්ඩවුන් කරනවා. දිස්ත්‍රිකයෙන් දිස්ත්‍රිකයට කොහොමත් යන්න තහනම්. මාලිනීට තරු පේනවා. විජේ අයිති කුරුණෑගලට. ඉතිං කොහේ යන්නද? විජේගේ පවුලේ අය කියනවා මොන ලොක්ඩවුන් තිබුනත් මගුල එදාටම වෙන්න ඕනේ කියලා. මාලිනිත් ගේම අතඅරින්නෑ.

මාලිනී පොලීසියේ හමුදාවේ ඇස්වලට වැලි ගහලා රාජාංගන ඔයෙන් පැනලා දිස්ත්‍රික්ක සීමාව පන්නනවා. දෙන්නා නැකතට වෙලාවට පෝරුවට නගිනවා. ජයමංගල ගාථා කියලා අතපැන් වත් කරනවා. නව යුවලට දිගාසිරි වේවා.

**කථාව ඉදිරිපත් කළේ :** ශලිනි නිශාදි කෝදගොඩ I අනුරාධපුර දිස්ත්‍රිකය

# නේවි පුතාට කළ අරියාදුව

මගේ පවුලේ පිරිමි දරුවන් තුන්දෙනයි. මැඩිමල් පුතා රාජකාරි කරන්නේ නාවික හමුදාවේ. මේ වසංගතය පටන් ගන්නකොට මගේ පුතා වැලිසර නාවික හමුදා කඳවුරේ සේවය කළා. රාජකාරි කටයුතු බහුල නිසා කෝවිඩ් ඇඳිරි නීති සමයේ පුතාට නිවාඩු ගන්න බැරිවුනා. කොහොම හරි එයා අවිරුදු පහුවෙලා අප්‍රේල් දහනව වැනිදා ගෙදර ආවා. පුතා සාමාන්‍යයෙන් අපේ අසල්වැසියන් සියළු දෙනා සමග මිතුරුකම් පැවැත්වූ සමාජශීලි තරුණයෙක්. වෙනදා වාගේම අසල්වැසියන්  සමග කුළුපගකමින් නිවසේ වැඩිදියුණු කටයුතු කරමින් නිවාඩුව ගෙවා දැම්මා.

අපි දිනපතාම රූපවාහිනී ප්‍රවෘත්ති බැලුවා. එතකොටයි දැනගත්තේ වැලිසර නාවික හමුදා කඳවුරේ සෙබලුන් තුන්දෙනෙකුට කොරෝනා වැළඳී තියෙනවා කියලා. දවසින් දවසම මේ ගාන වැඩිවුනා. පුතාලට නාවික හමුදාවෙන් අන කළා හැංගිලා ඉන්නැතිව වහාම තමන් පිළිබඳ තොරතුරු ලබා දෙන්න කියලා.  අපි PHI මහත්තයාටයි පොලීසියටයි කථා කරලා පුතා ගැන තොරතුරු කිව්වා. PHI මහත්තයා කිව්වා ගෙදරම ඉඳන් නිරෝධායනය වෙන්න කියලා. අපේ නිවාසය ඉදිරිපිට කොලයකුත් අලවලා ගියා. අපිට නිරෝධායනය වෙන්න කියලා කිව්වට කිසිම සහනයක් ලැබුනේ නැති නිසා අපි ගොඩක් අසරණ වුනා. අපි PHI මහත්තුරු මාර්ගයෙන් අපට සහන ලබාදෙන්න කියලා බැගෑපත් වුනා. ඒ වුනාට කිසිම උපකාරයක් ලැබුනේ නැහැ. පැය බාගෙන් බාගෙට අත් සෝදන්න කියලා උපදෙස් ලැබුනට වතුර ප්‍රශ්නයක් නිසා ඒ පිරිසිදු කිරීම කරගන්න බැරිවුනා. ඒ වෙලාවේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමන් එක්ක ආරවුලක්ද ඇතිවුනා. ඒකනං හරිම අවාසනාවන්ත සිද්ධියක්.

නාවික හමුදාවේ වාහනයක් ඇවිත් පුතාව නිරෝධායනයට වෙන්වුනු ඉස්කෝලෙකට එක්ක ගියා. මේ කාලය ඇතුලත අපට නොයෙක් දෙනා දුර ඇමතුම් දුන්නා. නන්නාඳුනන අය පවා දුර ඇමතුම් දීලා අපෙන් විස්තර ඇහුවා. පුතා ගිහිං දවසකින් අපට කෝල් කරලා කිව්වා අම්මලාව නිරෝධායනය කරන්න ත්‍රිකුණාමලයට අරන් යන්න එනවා කිසි දේකට බය වෙන්නේ නැතිව එහේ යන්න ලෑස්ති වෙන්න කියලා. ඇත්තම කිව්වොත් අපි කලබල වුනා. ගමනට අවශ්‍යම දේවල් ලකලෑස්ති කරගෙන අපි සූදානම් වුනා. හැබැයි අපේ කිසිම අසල්වැසියෙක් අපි ගැන සොයන්නට උත්සුක වුනේ නැහැ. එකම එක පවුලක කට්ටිය විතරක් ඇවිත් කථා කරලා පරිස්සමින් ගිහිං එන්න කිව්වා. එච්චරමයි. අවුරුදු ගානක් ආස්සරේ කළ අපේ ගමේ හැමෝම අපිව කොන් කළා. ජීවිතේ පළමු වැනි අවස්ථාවට තේරුම් ගියා අපිට අපි විතරමයි කියලා.

නාවික හමුදාවෙන් ඇවිත් ඉස්සරලාම අපිව මාතලේට එක්කං ගියා. තවත් පවුල් කිහිපයකුත් අපේ ගමනට එක්වෙන්නට මාතලේට ගෙනැත් හිටියා. අපේ පුතා නිළධාරීන්ට කථා කරලා කිව්වා අපේ පවුලේ කිසිම කෙනෙකුට කෝවිඩ් වැළඳී නැති නිසා අපව වෙනම වාහනයක එක්ක යන්න කියලා. ඒ ඉල්ලීමට කන්දීලා අපිව වෙනම එක්ක ගියා. අපිට නිරෝධායනය වෙන්න කාමර දෙකක ගෙයක් වෙන්කර තිබුනා. මුහුද අද්දර පිහිටි ඒ නිවසේ ගත කළ කාලේ නං අපි හරිම සැහැල්ලුවෙන් ජීවත් වුනා.

නිරෝධායන කටයුතු ඉවර වෙලා අපි ආයිමත් ගෙදර එනකොට අපිට ආහාර සලාක මල්ලක්ද හමුබවුනා. ඒකේ නෑ කියන්න දෙයක් තිබුනේ නෑ. ඒ තරම්ම සාර බඩු මල්ලක්. අපේ පුතාටවත් අපටවත් කෝවිඩ් රෝගය වැළදී නැති බවට සහතික ලැබුනා. කෝවිඩ් වැළදෙන්නේ නැතිවත් අපිව කොන් කළ අපට අරියාදුකම් කළ පිරිස කෝවිඩ් හැදිලා තිබුනනා නම් අපට කොහොම සලකයිද? මිනිසුන් පිළිබඳව හොඳම පාඩම් ඉගෙනගත් අවස්ථාව තමයි මේ.

**කථාව ඉදිරිපත් කළේ :** කේ ධම්මරතන හිමි | මාතලේ දිස්ත්‍රික්කය



# මාදැලෙන් ගොඩ ආව හිත හයිය සංජීව

මම සුරේෂ් සංජීව, උපන්නේ කල්පිටියෙ. මම තරුණ කාල ඉඳලම මීගමුවෙ තමයි හිටියේ. මාදැල් රස්සාව කරන්නේ. ඉස්සරම නං අපි උදෙන්ම ගෙවල්වලට ගිහිං, මිනිස්සු එක්කාසු කරගෙන ඇවිල්ල දෙකෙන් පංගුවට, ඒ කියන්නේ ආදයමෙන් භාගයක් ඒ අයට දෙන විදිහට තමයි මාදැල් රස්සාව කළේ. පහු පහුවෙනකොට ඒ ක්‍රමේට මේ රස්සාව කරගෙන යන්න බැරිවුනා. අඬගැහුවට මිනිස්සු එන්නේ නැහැ. ඒක හින්ද මං කට්ටියක් පිටින් ගෙනැත් මගේම වාඩියේ නවාතැන් දුන්නා. මේ වසංගතේ එනකොට මගේ ළඟ වැඩ කරා සේවකයන් දහයත් පහළොවත් අතර පිරිසක්. ඒ වාගේ සුළු පිරිසකින් මාදැල් අදින්න පුළුවන් වුනේ මම ට්‍රැක්ටරයක් දාල අදින නිසා. නැත්නම් විසිපහක්වත් ඕන වෙනවා මාදැලක් අදින්න. ඒත් අන්තිමට ඒකත් කරගන්න බැරුව ගියා. කොරෝනා පටන් ගත්ත මාර්තු මාසේ අපිට ආන්ඩුවෙන් අවවාද කළා මාදැල් අදින තැන්වලට මිනිස්සු රැස්වෙන නිසා වහාම ඒ කටයුත්ත නතර කරන්න කියලා. ඊට පස්සේ අපේ සේවකයන්ව ගෙවල් වලට පිටත් කළා. ඒකත් බොහෝම අමාරුවෙන් කළේ. අතින් වියදම් කරල පඩි සල්ලි බේරුවේ.

මේ ඇඳිරිනීති තත්වය වැඩියම බලපෑවේ මාදැල් අදින කට්ටියට. බහුදින යාත්‍රා, ඩිංගි බෝට්ටුවල යන අයට ප්‍රශ්නයක් වුනේ නැහැ. මාදැල් වෘත්තිය කරන්න එන්නේ වෙනමම කට්ටියක්. මාදැල් වෘත්තියට එන අයගෙන් සියයට දහයක් විතර තමයි පොඩි බොට්ටුවල යන්නේ. නැත්නම් ඉන්නේ ගොඩ තමයි. ඒ අයට පොඩි බෝට්ටුවල ගිහිල්ල රැකියාවක් කරන්නත් බැහැ. බහුතරය හෙරොයින් වලට මත්කුඩු, මත් පෙති වලට ඇබ්බැහි වෙලා. බහුදින යාත්‍රාවල, ඩිංගි බෝට්ටු වල යන්න බයයි. මේ කුඩු කතන්දරේ හරිම ඛේදවාචකයක්. අපේ රටේ හොඳම තරුණ ජවයනේ මේ විදියට විනාස වෙන්නේ.

මුහුද කියන්නේ අපි හිතන දේ දෙන තැනක් නෙවෙයි. සමහර විට අපි හිතුවාටත් වඩා ලැබෙනව. සමහර වෙලාවට අපි හිතන දෙයක් දෙන්නෙම නෑ. ධීවර රස්සාව කරනවනං ඉතිං පහුබහින්න බැහැ. එන හැම දේකටම මුහුණ දෙන්න බලාගෙන තමයි අපි මේ රස්සාව කරන්නේ ඕනේ. කොරෝනා නිසා කොම්පැනි වලින්, රටවල් වලින් මාළු ගන්නේ නැතුව ගියා. අපි කිලෝ එක රුපියල් 4000 දෙන මාලු අන්තිම කාලෙදි අපිට රුපියල් 1500 ටත් දීගන්න බැරුව ගියා. දැනනම් කොහොමත් මාලු ටිකක් හිගයි. ලංකාවේ මාළු ගානත් වැඩියි කොහොමත්. අපේම මුහුදේ මාළු අපි කන්නේ වැඩි ගානට.

මේක මුළු ලෝකයටම බලපාපු කාරණයක් නිසා අපිට රජයට කිසිම බලපෑමක් කරන්නත් බැහැ. අපිට සහන සලසන්න, අරක දෙන්න, මේක දෙන්න කියල ඉල්ලනත් බැහැ. මේ වාගේ ආපදා අවස්ථාවක එහෙම ඉල්ලන එකත් වැරදියි. සාමාන්‍යයෙන් අපි දවසට රුපියල් 1000ක් වියදම් කරල පවුලක් නඩත්තු කරනවනම් දැන් එහෙම බැහැ. දැන් වියදම අඩු කරලා රුපියල් 600ක විතර වියදමකින් අපේ පවුල් නඩත්තු කරගන්න පුරුදු වෙන්න ඕනේ.

ධීවරයා කියන්නේ කොහොමත් හොදට කන බොන මිනිහෙක්. එදා දවස විතරයි බලන්නේ. ධීවරයන්ට ගැටළු ප්‍රශ්න ගොඩක් තියෙනවා. ඒවා කෝවිඩ් එන්න ඉස්සර ඉඳලම එකතු වෙච්ච ප්‍රශ්න. මේක අපි බලාපොරොත්තු නොවුන තත්වයක්. මේක අපට පාඩම් ඉගෙන ගන්නත් හොඳ අවස්ථාවක්. අනිත් රටවල් එක්ක ගත්තම අපි සන්තෝෂ වෙන්න ඕනේ අපි මෙහෙමවත් බේරිලා ඉන්න එක ගැන.

මම නං මේ ප්‍රශ්න ඇතිවුනා කියලා මාදැල් රස්සාව අත ඇරින්නේ නැහැ. පටන් ගත්තු වැඩේ මොන කරදර කම්කටොළු ආවත් ඉස්සරහට අරන් යන්න ඕනේ. මහ මුහුදත් එක්ක ඔට්ටුවෙන අපිට හරියට බැලුවොත් මේවා සුළු ප්‍රශ්න. මම කොහොමත් දැන් මගේ ළඟ වැඩ කරපු අයට කථා කරලා තියෙන්නේ. ණය වෙලා හරි මම කට්ටියව ගෙන්නා ගන්නවා. මට වාඩියක් තියෙන නිසා පුංචි සහනයක් තියෙනවා. මම හිත හයිකරගෙන වැඩේ පටන් ගත්තොත් තමයි පවුල් පහලොවක් විතර යැපෙන්නේ. ඒ අය දැනටත් මට වරින් වර කොල් දිල අහනව අයියා මේක කවදද කෙරෙන්නේ කියල.

මම ඒ අයට කිව්වා දෙයියන්ගේ පිහිටෙන් අපිට ඔක්තෝබර් විතර වෙනකොට ආයිමත් මාදැල් රස්සාව කරන්න පුළුවන් වෙයි කියලා. හිත හයිය නං මොනාද කරන්න බැරි. කෝවිඩ් එයි යයි. අපි ජීවත් වෙමු.

**කතාව ඉදිරිපත් කළේ :** ත්‍යාග චන්දන | ගම්පහ දිස්ත්‍රික්කය

# පොලිසිය හරිද PHI හරිද?

මම වැඩ කළේ යුද හමුදාවේ. දැං විශ්‍රාමිකයි. මගේ ගෙදර ඇනෙක්ස් ජෝඩුවකට කුලියට දීලා තියෙනවා. ඒ පුතා වැඩ කරන්නේ වැලිසර නාවික හමුදා කඳවුරට ආසන්න ලංකා කෑම්ප් එකේ. කොරෝනා වසංගතේ පැතිරීගෙන යනකොට වැලිසර නාවික හමුදා කඳවුරටත් මේක පැතිරුනා. නිවාඩු ගිය නාවික සොල්දාදුවන්ගෙන් මේක රටටම බෝවෙයි කියලා ගම්වලට ගිය නාවිකයෝ දිහා වපර ඇහෙන් බලන්න ගත්තා. මමත් අවුරුදු විසි දෙකක් යුධ හමුදාවේ සේවය කරලා විශ්‍රාම ගිය නිළධාරියෙක් නිසා මෙහෙම වෙනස් කොට සැලකීම පිළිබඳව මං හරියට කනගාටු වුනා.

අපේ ඇනෙක්ස් එකේ නතර වෙලා ඉන්න ජෝඩුවට වයස මාස 9 ක පුතෙක් ඉන්නවා. මම ඒ අයට ඇනෙක්ස් එක දුන්නේ මුදල් උපයන අරමුණින් නෙවෙයි. ඒක කළේ මනුස්සකමට. මමත් යුනිෆෝම් එකක් ඇඳපු කෙනෙක්. ඒ දුවයි පුතයි දෙන්නම මේ ගමේ. මේ ඒ ගොල්ලංගේ උපන් ගම. මගේ ගම ගාල්ලේ. මෙහෙට ඇවිල්ල අවුරුදු දහඅටක් දහනවයක් විතර වෙනවා. මම නිතර උත්සාහ කළේ ගමේ මිනිස්සුත් එක්ක එකමුතුව වැඩ කරන්න.

ඒ දවස්වල රූපවාහිනී නාලිකාවලයි, පත්තරවලයි, ෆේස් බුක් වට්ස් ඇප් වලයි වෙන මුකුත් නෑ නාවික හමුදවේ කථාව විතරමයි. ඒ පලවෙච්ච හුගක් කථා එක එක්කෙනාගේ මනෝ විකාර. ආණ්ඩුවත් ඒවා පාලනය කරන්න හරිහමන් තීන්දුවක් ගත්තේ නැහැ. ඒ වෙලාවේ ඔළුව ගිණි අරන් තිබ්බ නිසා ආණ්ඩුවට බැනලත් බෑ. මේ ප්‍රශ්නේ ආවට පස්සෙ දවසක් රෑ නිව්ස් වලට වැලිසර කඳවුරේ හිටපු අයට කොරෝනා බෝවෙලා, නිවාඩු ගිය අය වහාම දැනුම් දෙන්න කියලා ප්‍රවෘත්තියක් ප්‍රචාරය වුනා. මම ඒ පුතාගෙන් ඇහුවම කිව්වා "අනේ නෑ මාමේ මම හිටියේ ඒ කෑම්ප් එකේ නෙවේ ඒ නිසා අපිට ප්‍රශ්නයක් නැහැ. මාමාට සැක ඇරලා දැනගන්න ඕනේ නං මං කෝල් එකක් දීලා අහන්නං" කියලත් ඒ පුතා කිව්වා.

මම කෝකටත් කියලා අපේ සර්වෝදය කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකාරක ඉඳුනිල් හිත්තැටිය මහත්තයට කෝල් කරලා මේ ගැන ඇහුවා. එතුමා නාවික හමුදාවේ ඉහල නිළධාරියෙකුට කතා කරලා එහෙම ප්‍රශ්නයක් නෑ කියලා තහවුරු කළා. ඒ පුතාට කොරෝනා හැදිලා තිබ්බත් අපට නං ප්‍රශ්නයක් නෑ. අපේ නෝනත් හරියට කම්පා වුනා. රට වෙනුවෙන් ජීවිතේ දීපු රණවිරුවන්ව මෙහෙම කුණු කූඩෙට දාන එක යුතු නැහැ කියලා. ඒ වෙලාවේ කරන්ඩ තිබුනේ නේවි එකේ කොල්ලන්ට කොරෝනා හැදිලා කියලා අනබෙර ගහන එක නෙවෙයි. කොරෝනා හැදුන කෙනෙක් දිහා සානුකම්පාවෙන් බලලා කාරුණික විදියට කටයුතු කරන්න කියලයි ප්‍රචාරය කරන එක. ජනතාවට මතක් කරලා දෙන්න තිබුනා මේ රණවිරුවෝ නිසා තමයි අද මේ රටේ මිනිස්සු හුස්මක් අරං නිදහසේ ඉන්නේ කියලා.

කොහොම හරි මම ස්වේච්චාවෙන්ම අපේ ග්‍රාම නිළධාරී තුමියව, පොලීසිය, සර්වෝදයේ අපේ ඉඳුනිල් මල්ලිව, ප්‍රදේශය බාර PHI මහත්තයාව මේ සම්බන්ධයෙන් දැනුවත් කළා.

ගමේ කට්ටිය මට චෝදනා කළා මම කොරෝනා ලෙඩෙක් හංගං ඉන්නවා කියලා. මම, අපේ නෝනා, ඒ නේවි එකේ පුතා හරි දුව හරි කඩේකට ගියත් අපි දිහා සැකෙන් බලන්න ගත්තා. හරියටම ඒ දවස්වල ඒඩ්ස් රෝගීන් දිහා වපර ඇහින් බැලුවා වාගේ. ඊටත් අන්තයි කිව්වොත් හරි. ගමේ මිනිස්සු

අපිව පිලිකුල් කළා. අපේ ළඟට එන්නවත් අපිත් එක්ක කථා කරන්නවත් මිනිස්සු බය වුනා. මම හිටපු සොල්දාදුවෙක්. මගේ හිත හයියයි. විශ්‍රාම ගත්තත් කොන්ද කෙලින්. මම අපේ නෝනටත් කිව්වා මොන දේ වුනත් අපි මේ පුතාව තනි කරන්නෙත් නෑ ගමේ මිනිස්සුන්ගේ කෙනෙහිලිකං වලට ඔළුව නමන්නෙත් නෑ කියලා.

ඔය අතරේ PHI එනවා කිව්ව. එයා එන්න ඉස්සෙල්ලා මීගොඩ පොලිසියේ සැරයන් කෙනෙක් ආවා. ආවෙත් ප්‍රධාන පාරෙන් නෙවෙයි කානුවක බැහැගෙන කැලේ පාරකින්. මීටර් විස්සක් විසිපහක් විතර දුර ඉඳලා කථා කරලා කොලේ තියලා ගියා. කොලේ ගේ ඉස්සරහා ගහගන්න කිව්වා. ඔයාලා එලියටවත් බහින්න එපා කිව්වා. මම කිව්වා මහත්තයෝ කොල අලවන එක මගේ රාජකාරිය නෙවේ ඔබතුමාම මේක ගහන්න කියලා. මං කිව්ව මම මේ විස්තරේ පි.එච්.අයි ට දන්වන්නම් කියලා. ඔන්න ඇවිලෙන ගින්නට පිදුරු වැටුනේ එතනදි. ඒ පොලිස් රාලහාමි අවට ගෙවල් කීපෙකටම කියලා, කුමාරලටයි ඇනෙක්ස් එකේ අයටයි කොරෝනා, ඒ අය එලියට බැස්සොත් අපිට කතා කරන්න කියලා. ෆෝන් නොම්බරෙත් දීලා ගිහිල්ල. මේක බැරෑරුම් අවස්ථාවක් නිසා මම දොස් කියන්නේ නෑ, නමුත් මට ප්‍රශ්නේ PHI ද නිරෝධනය කරන්නෙ පොලිසියෙන්ද කියලා.

පොලිසියට යුතුකමක් තිබ්බා පී.එච්.අයි ව දැනුවත් කරලා මේ වැඩේ කරන්න. අන්තිමට මම PHI ට කිව්ව පොලිසිය මෙහෙම කොලයක් දීලා ගියා කියලා. එයා කියපි එයාට පොලිසිය දීපු එක ගහන්න බෑ කියලා. මම නිරෝධායනය කළේ ඇනෙක්ස් එක විතරයි ඒත් හැදිලා නෙවේ සැකේට. එතුමගේ රාජකාරිය එතුමා කරා. අර පොලිසිය දීපු කොලේ ගහන්න කෙනෙක් නෑ. පස්සේ මමම ඒක ඇලෙව්වා.

දැන් ඔන්න බට කැලේට ගිනි තිබ්බා වගේ ගම පුරා පැතිරුනා අපිට කොරෝනා කියලා. රොයිටර්ට හපන් ඒ ඕපාදූපේ. අපි දින දහතරක් නිරෝධායනය වුනා. ඇදිරිනීතිය ලිහිල් කළ දවසක ගෙනාව හාල් තුනපහේ ටිකෙන් දවස් 4 ක් වගේ හිටියා. ඊට පස්සෙ පොල් සම්බෝලයි බතුයි කෑවා. නමුත් අපේ ඇනෙක්ස් එකේ පුතාලට වියලි ආහාර නැහැ කියලා දැනගත්තම මම හිටපු සංවර්ධන නිළධාරිනියට කතා කරලා කිව්වා. එතුමිය උපකාර කළා. ඊලගට අපේ සර්වෝදයේ කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකාරක ඉඳුනිල් මල්ලිට කතා කළා. එයා දවස් තුනක් වගේ ආවා. එතුමා කිසිම බයක් සැකක් නැතුවා අපේ ගෙදර ඇවිල්ලා අවශ්‍ය වියලි සලාක ලබා දුන්නා පවුල් දෙකටම. ඒක නං මං ඉහලින්ම අගේ කරන්න ඕන. ඊලගට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ශාන්ති මිස්ට කිව්වම දින දෙකකදි බඩු අරගෙන ආවා. හැබැයි ඒ අයටනං මම දොස් කිව්වා. හේතුව මෙහෙම නිරෝධායනය කරනවා නම් එයාලා බලන්න ඕන අපට කන්න බොන්න තියේද කියලා. කාන්තාවන්ට විශේෂ අවශ්‍යතා තියෙනවා. ඒවත් බලන්න ඕන. ඒවා ගැන ඇහුවෙවත් නැහැ. මම රජයට දොස් කියනවා නෙවේ. නමුත් බිම් මට්ටමේ නිළධාරීන් දැනගන්න ඕන මොනවද අඩුපාඩු කියලා හොයලා බලන්න.

ඇනෙක්ස් එකේ පුතාව නාවික හමුදාවෙන්ම කළ නිරෝධාන කටයුත්තට පස්සේ ගෙදර ආවා. පී.එච්.අයි කිව්ව විදියට මෙහෙත් දවස් දහතරක් නිරෝධායනය වුනා. PHI මගෙන් ඇහුවා

“කුමාර මහත්තයා මේ දැන්වීම ගහන්න මොකද මේක නොගහා නං මට සහතිකේ දැන්න බෑ” කියලා. මම කිව්ව ප්‍රශ්නයක් නෑ ඔබතුමාගේ රාජකාරිය අකුරට කරන්න කියලා. ඊට පස්සෙ තමයි සහතිකේ දුන්නේ.

පොලීසියෙන් පැත්ත පලාතේ ආවේ නෑ. දැන්වීම ගලවන්නවත් ආවේ නෑ. PHI මහත්තයා දවස් දහතරෙන් කොලේ ගලවලා අයින් කලාට පොලිසිය කිව්වා තව කල් තියන්න ඕන කියලා. PHI දැන්වීම අයින් කලේ හය වෙනිදා. පොලිසිය කිව්ව නව වෙනිදා වෙනකං තියන්න ඕන කියලා. මම මේ නිතර කල්පනා කරන්නේ පොලිසිය හරිද PHI හරිද කියලා.

**කතාව ඉදිරිපත් කළේ :** සුපුන් සඳනුවන් | කොළඹ දිස්ත්‍රික්කය


නිශාදි

# සාගර ජලය මදි හැඬුවා නුඹ හන්ද

මගේ නම නිෂාදි. මගේ වයස තිස් හතයි. මට දෙවෙනි බබා හම්බෙන්න

දින දීලා තිබ්බේ මාර්තු 31. මාර්තු 29 තමයි රෝහල් ගත වෙන්න තීරණය කරලා තිබ්බේ.

ඔන්න හරියටම මාර්තු 28 අකුරණින් කොරෝනා රෝගියෙක් හම්බවෙනවා. මුළු අකුරණම ලොක්ඩවුන් කරනවා. මට යන්න තිබුනේ ටවුමේ ශික්ෂණ රෝහලට. එදා දවල් දහයයි තිහට විතර මම මහත්තයත් එක්ක ඉස්පිරිතාලේ යන්න පිටත් වුනාට හමුදාවෙ අය කොනකලගල ගමෙන් එලියට යන්න දුන්නේ නෑ. අකුරණ හරහා යන්න වෙනවා කියලා. ඊට පස්සේ අපි ආපහු පන්ගොල්ලාමඩින් ජම්බුගහපිටිය හරහා ගිහින් තමයි රෝහලට ඇතුලු වුනේ.

දැන් නං මං ඒ සිද්ධිය මතක් කරන්නවත් කැමති නැහැ. නමුත් අපි මේ දේවල් පිටපත් කරලා තියන්න ඕනේ කවදා හරි හැමෝටම දැනගන්න. මට කොච්චර එපා වුනාද කිව්වොත් මොනම හේතුවකටවත් අයිත්නම් ඒ ඉස්පිරිතාලෙට යන්නෑ කියලා මං හිත හදාගෙන තියෙන්නේ.

මාව ඇතුල් කලාට පස්සේ මහත්තයාට යන්න කිව්වා. එකහමාරට ඉස්පිරිතාලෙට ඇතුල් වුනු මම තුනයි තිහ වෙනකල් පුටුවක වාඩි වෙලා හිටියා වාට්ටුවට පිටත්කර යවනකල්. මාව ඇතුල් කළ වාට්ටුවේ තවත් අම්මලා පහලොවක් විතර හිටියා. ඒ අය සේරම වාගේ මුස්ලිම් අම්මලා. ඒ දවස්වල තිබ්බ භීතියත් එක්කලා මම මුස්ලිම් අම්මාලාගේ ගොඩට යන්න බය වුනා. මම අලවතුගොඩින් වුනත් අපි අකුරණ කියලා සේරම එකම වාට්ටුවකට කොටු කළා. අකුරණින් ආව අම්මලාව දාන්න වාට්ටුවේ වෙනම පැත්තක් වෙන් කරලා තිබුනා. නර්ස්ලා කෑගහනවා ඕගොල්ලෝ ඔය පැත්තේ බාත්රූම් පාවිච්චි කරන්න මේ පැත්තටවත් එන්න එපා කියලා.

මට ලොකු බයක් ඇතිවුනා මේ අකුරණින් ආව අයත් එක්ක ඉද්දි මටත් කොරෝනා හැදෙයි කියලා. ඒ පාර මම ටිකක් එහායින් ඈඳකට වුනා. මට හරියට ඇඬුනා ඇයි මම සිංහල අම්මා කෙනෙක් වෙලත් මට මෙහෙම සලකන්නේ කියලා. අකුරණින් ගියපු අයට කොරෝනා හැදිලා තියෙන්න පුළුවන්. ඒ අයත් එක්ක එකට ඉඳලා මටත් කොරෝනා හැදුනොත් දරුවාට බලපෑමක් වෙන්න පුළුවන් කියලා මම හරියට බය වුනා.

නර්ස්ලා අපිව අල්ලන්න තියා ළඟට එන්නත් මැලිවුනා. හිත හරියට කලබල වුනා. බබෙක් හම්බ වෙද්දි හිතේ සැනසිල්ල තියෙන්න ඕනේ. ඒ වුනාට මෙතන මිස්ලා අම්මලාට සලකන හැටි දැකලා හිත කලබල වුනා.

මට දින දීලා තිබුනේ තිස්වෙනිදාට. තිස් වෙනිදා ටෙස්ට්න් කරලා ඉවර කළා. තිස් එක් වෙනිදා උදේ හත වෙනකොට ලෑස්ති වෙලා ඉන්න කිව්වා. මාව තියටර් එකට ගෙනියන කොට අටට විතර ඇති. ඔය අතරේ අකුරණින් ආව මුස්ලිම් අම්මා කෙනෙක්ට බබා හම්බවෙලා වාට්ටුවට ගෙනාවා. ඒ අම්මට කොවිඩ් කියලා සැකකරලා නර්ස්ලා ඒ අම්මවත් බබාවත් අතින් ඇල්ලුවේ නෑ. මම ඇතුලත් වෙච්ච

දවසේ ඉඳලම අලුතෙන් ගෙනාපු බබාලව මිස්ලා ඇල්ලුවේ නෑ. සමහර අම්මලා වාට්ටුවට ගේනකොට ටිකට් එක තියලා තිබුනේ ඒ අම්මලාගේ ඇඟ උඩ.  මිස්ලා බැන්නා ඇයි මේ ටිකට් එක ඇඟ උඩ තියාගෙන ඉන්නේ කියලා. ඒ අම්මලව තුට්ටුවකට මායිම් කළේ නෑ.

ඔන්න මංව තියටර් එකට එක්ක ගියා. එතනත් අකුරණ අයට වෙනමම තියටර් වෙන්කරලා තියෙනවා කිව්වා. එදා උදේ ඉස්සරලාම තියටර් එකට ගත්තේ මාව. එතනදිත් මට තේරුනා මට වෙනස් විදියට සලකනවා කියලා.

මට හයියෙන් ඇඬුනා. මං ඇහුවා ඇයි මිස් අපිට මෙහෙම වෙනස්කම් කරන්නේ කියලා.

මට දරුවා ලැබෙන්න ගිහිල්ල ගොඩාක් අමාරු වුණා. හුස්ම හිරවෙනවා වගේ දැනුනා. ඊට පස්සේ බබා හම්බුනාට පස්සේ ගොඩක් අමාරු වෙලා ලොකු අවධානමක හිටියේ. මට සීසර් එක කරද්දි ලේ වහනය වෙච්ච ප්‍රමාණය වැඩි නිසා තියටර් එකේදිම ලේ දුන්නා. ඒවා මේවා සේරම කරදරත් එක්ක මානසිකව වැටුණා. ඒ අවදානම් වෙලාවේ වුනත් මිස්ලා මාව ඇල්ලුවේ ඕනෙවට එපාවට වාගේ. දරුවෙක් ලැබෙන්න ඔන්න මෙන්න අම්මා කෙනෙක් කියලාවත් තෙතමනයක් මේ කාර්ය මණ්ඩලේ කිසිම කෙනෙකුට තිබුනේ නැහැ.

ඔන්න මට බබාව හම්බවුනා. දැන් මට ඇහෙනවා නර්ස් කෙනෙක් කියනවා මෙයා අකුරණ ඉඳන් ආපු ලෙඩෙක් මෙයාව ගෙනිච්ච ගමන් පාවිච්චි කරපු හැම දෙයක්ම විෂබීජහරණය කරන්න කියලා. දරුවෙක් හම්බවෙලා රුදව පහවෙන්නත් ඉස්සර ඒ වාගේ කථාවක් ඇහුනම හිතට දැනෙන වේදනාව වචනයෙන් කියන්න පුළුවන්ද?

ඇඩ්මිට් කරපු දවසේ ඇරෙන්න මහත්තයට මාව බලන්න එන්න වුනේ නෑ. මම ඒ දවස් ටිකේම කෑම ගත්තේ ඉස්පිරිතාලෙන්. ජීවිතේ පළවෙනි වතාවට තමයි ඉස්පිරිතාලෙකින් කෑම කෑවේ. සමහර දවස්වලට වටේටම බෙදල අපේ වාට්ටුවට එනකොට කෑම ඉවරයි. කෑම එකක් ගන්න ඇටෙන්ඩන්ට්ලාගෙන් බැනුම් අහන්න වුනා. අපි අකුරණ කියලා කෑම ටික දෙන වෙලාවෙත් අපට කෙනෙහිලිකම් කළා. හරියටම අපි කොරෝනා හැදිච්ච අයගෙ ගානට දලා තමයි සැලකුවේ.

මේ මගේ දෙවැනි දරුවා. දරුවෙක් ලැබුනම අම්මා කෙනෙකුට පුදුම සතුටක් දැනෙන්නේ. ඒ වුනාට මේ රෝහල් කාර්ය මණ්ඩලය හැසිරිච්ච විදියෙන් අපට ඒ සතුට විඳින්නට බැරිවුනා.  දරුවෙක් උපන්නා කියන සන්තෝසේ විඳින්න අපට වාසනාව තිබුනේ නැහැ.

බබා හම්බෙලා පළවෙනි දවසේ නර්ස්ලා මංව තුට්ටුවකට ගනන් ගත්තේ නෑ. කොච්චර බැගෑපත් වුනත් ගනන් ගත්තේ නෑ. දෙවෙනි දවසෙත් සැරින් සැරේ කෑ ගැහුවා මට අමාරුයි පොඩ්ඩක් බලන්න කියලා. බඩගින්න ඉවසාගෙන ඉන්නම බැරිම තැන මම කිව්වා මිස් මගේ බෑග් එකේ නෙස්ටමොල්ට් තියෙනවා මට එකක් හදලා දෙන්න තිබහයි කියලා. මේ මිස්ලා ඒ කිසිම ආයාචනයක් කනට ගත්තේ නැහැ. මාර්තු තිස් වෙනිදා රෑ දහයට කෑවට පස්සේ අප්‍රේල් පළවෙනිදා දවල් වෙනකල් වතුර උගුරක්වත් නෑ. මහත්තයා ඇවිත් සුප් ටිකක් පොවනකල්ම මං බඩගින්නේ හිටියේ.

ඉස්පිරිතාලේ ඉන්න අතරේ මම හැම වෙලාවෙම ගාථා කිව්වා. අපි කළ පින් දහම් සිහිපත් කළා. උදේ හවස බුදුන් වදින අපි දෙන්නා දැනුවත්ව කාටවත්ම කරදරයක් කරලා නැහැ. රත්නත්තරේ පිහිටෙන් දරුවා යහතින් උපදියි කියන විශ්වාසයෙන් හිත හයි කරගත්තා. එතැන බහුතරයක් හිටියේ මුස්ලිම් අම්මලා. ඒ වෙලාවේ ජාතිය ආගම නෙවෙයි වැදගත්. අපි හැමෝම දරු ප්‍රසූතියට ආපු අම්මලා. මං දෙයියන්ට කන්නලව් කළා අපි හැමෝවම ආරක්ෂා කරලා දෙන්න කියලා.

මම ඇඩ්මිට් වුනේ විසි නම වෙනිදා. ටිකට් කැපුවේ දෙවැනිදා. ටිකට් කපන්න ආව ලොකු දොස්තර ඇහුවා ඇයි මේ අම්මව මෙතන දාලා තියෙන්නේ කියලා. එතකොට පොඩි ඩොක්ටර් උත්තර දුන්නා දන්නේ නැහැ නර්ස්ලගෙන් අහන්න ඕනේ කියලා. ඒ වෙලාවේ ඩොක්ටර් කිව්වා මේ නර්ස්ලට පිස්සු කියලා. මම අකුරණ නෙවෙයි. මම අලවතුගොඩ. නමුත් මේ නර්ස්ලාට ඒ බව අවබෝධ කරලා දෙන්නවත් අවස්ථාවක් දුන්නේ නැහැ. අනවබෝධය නිසා තමයි මේ ප්‍රශ්න ගොඩක් ඇතිවෙන්නේ.

හොඳටම ලේ අඩුයි කියලා ඩොක්ටර් මගේ ටිකට් කපන්න බෑ කිවුවා. නමුත් මම ඩොක්ටර්ට වැඳලා කිව්වා "අනේ දොස්තර මහත්තයෝ මං මොනවා හරි කරගෙන ලේ හදා ගන්නම් මට ගෙදර යන්න දෙන්න. අපට සලකන විදිය අන්තිමයි. මං හොඳටම මානසිකව වැටිලා ඉන්නේ. මහත්තයාට මංව බලන්න එන්න දෙන්නෙත් නැහැ. දරුවට දෙන්න කිරිත් නෑ. අනේ මට ගෙදර යන්න දෙන්න. මං බලෙන් ටිකට් කපා ගත්තා කියලා අත්සන් කරන්නම් මහත්තයෝ මට ගෙදර යන්න දෙන්න" මං ඇස්වල කඳුළු පුරෝගෙන දොස්තර මහත්තයාට බැගෑපත් වුනා. ඇත්තටම බලෙන් තමයි ගෙදර ආවේ. ටිකට් කපන කොට වෙලාව හැන්දෑවේ පහට විතර ඇති. ගෙදර එනකොට රෑ අට විතර වුණා.

ඒ ඇවිල්ලත් දවස් කීපෙකට පස්සේ ලේ අඩුවෙලා ඇඟ කහ වෙලා ටිකක් අමාරු වුනා. ඒ වෙලාවේ මාතලේ ඉස්පිරිතාලෙට ඇතුල් වුනා.

අදට දරුවට මාස තුන සම්පූර්ණ වුනා. දළදා මාළිගාව වැදලා, කිරි ආහාර පූජා කරලා, ගමේ පන්සලේ නායක හාමුදුරුවන්ට දරුවා පෙන්නලා ආශිර්වාද ලබාගත්තා. මේ සිද්ධි දාමය මතක්වෙන වෙලාවක් පාසා හිත වේදනාවෙන් පිරෙනවා. මගේ තිස් හත් අවුරුදු ජීවිතේ මේ වාගේ කනගාටුවට පත්වුනු සිද්ධියක් මතක්කර ගන්නවත් බැහැ.

මගේ ජීවිතේ එකම ප්‍රාර්ථනය තමයි මෙවන් දුකක් කිසිම අම්මා කෙනෙකුට දැනේනනට එපා කියන එක. එදා මාත් එක්ක වාට්ටුවේ හිටපු මුස්ලිම් අම්මලා මටත් වඩා අසරණ වෙලා හිටියේ. බැරිවෙලාවත් ඒ අයගේ ඇඟිල්ලක් හරි වැදුනම නර්ස්ලා ඇටෙන්ඩෙන්ට්ලා බෙරිහන් දුන්නා. මුළු වාට්ටුවටම ඇහෙන්නට බැන්නා. නර්ස්ලා ඒ තරමටම මුස්ලිම් අම්මලාව කොන් කළා. මට හිතුනා සිංහල මුස්ලිම් ප්‍රශ්නයක් ඇති වුනොත් එහෙම එදාට සිංහල මිනිස්සුන්ගෙන් මුස්ලිම් මිනිස්සු කොහොම පළිගනීද කියලා. මේ අම්මලා ගෙවල් වලට ගියාම තමන් මූණදුන් සිද්ධි අනිවාර්යෙන්ම කට්ටියට කියයි. මම සිංහල වෙලත් මට සැළකුවේ පිටස්තරයෙක්ට වාගේ. මට කරපු කෙනෙහිලිකම් වලට මං මේ තරම් කම්පා වෙනවානම් ඒ මුස්ලිම් අම්මලාට මොන තරම් වේදනාවක්, වෛරයක් ඇතිවෙන්න ඇත්ද?

මාස ගණනක් ගතවෙලත් මට ඒ සිද්ධි වරින්වර සිහියට එනවා. සමහර දවස්වලට මට හයියෙන් ඇඬෙනවා. ඒ කම්පනයෙන් මං තවමත් මිදිලා නැහැ. එහෙම වෙන්ඩ තව ගොඩක් කල් ගතවෙයි. සංසාරේ කිසිම අම්මා කෙනෙකුට මෙවන් දුකක් ඇති නොවේවා. මගේ එකම ප්‍රාර්ථනය එයයි.

**කතාව ඉදිරිපත් කළේ :** වැහිගල සාරද හිමි | මහනුවර දිස්ත්‍රික්කය



# අමුතු ඉලන්දරින්ගේ කථා වස්තුව

මං අපේ පවුලේ එකම දරුවා. මට දැං විසි නවයක් වෙනවා. මං ගෑනියෙකුත් නෙවෙයි. පිරිමියෙකුත් නෙවෙයි. මං දෙපැත්තටම නෑ. මට ඒක අදාලත් නැහැ. මං කවුද කියලා මං දන්නවා. ඒ ඇති. මං අපේ පවුලේ එකම දරුවා වුනාට අපේ තාත්තට මාව පෙන්නන්න බෑ. එයාට මගේ ජීවිතේ ගැන හරියට ප්‍රශ්න. එයාට තරහා ගිය වෙලාවට මං කරබාගෙන ඉන්නවා. මං නෙවෙයි රණ්ඩුවට යන්නේ. එහෙම පවුලේ අයත් එක්ක රණ්ඩුවට ගිහිං තමන්ගේ ගෙවල් වලින් දෙට්ට බැහැපු අපේ අය සිය ගානක් මේ කොළඹ අවට ඉන්නවා. ඒ අය පහුගිය කෝවිඩ් කාලේ අනන්ත දුක් වින්දා. මං තමයි මැද ඉඳන් මේ හැමෝගෙම ප්‍රශ්න වලට විසඳුම් හොයලා දුන්නේ. ඒ නිසාම මට කෝවිඩ් කාලේ අපේ අයට මුහුණ දෙන්න වුනු සිද්ධි සීයක් වුනත් කියන්න පුළුවනී. අපිට සාමාන්‍යයෙනුත් බෝඩිමක් හොයා ගන්න අමාරුයි. මිනිස්සු හිතාගෙන ඉන්නේ අපි අමුතු සත්තු කොට්ටාසයක් කියලා. පාරේ යනකොට වුනත් මිනිස්සු අපි දිහා බලන්නේ වපර ඇහින්. අපිට හිනාවෙනවා. අපිට ඇනුම් පද කියනවා. හරිම නරක වචන වලිං තමා අපි ගැන කථා කරන්නේ.  ඒවා නං දැං අපේ ඇගට පත්තියං වෙලා. අපේ සමහර අය නං ඒ වාගේ අපහාස කලාම ලුණු ඇඹුල් එක්ක දීපු වෙලාවලුත් තියෙනවා. අනේ මම නං එහෙම කා එක්කවත් රණ්ඩුවට යන්නෑ. මේක මේ රටේ ප්‍රශ්නයක් විතරක් නෙවෙයි.

කොළඹ බෝඩිං වලට කොටුවෙලා ඉන්න අයගෙන් බහුතරය වැඩ කරන්නේ සැලුන් වල හරි රූපලාවන්‍ය ආයතන වල හරි. නැත්නං රෙදි සාප්පුවල. සමහරු ලිංගික ශ්‍රමිකයින් විදියටත් වැඩ කරනවා. මේ කිසිම රැකියාවක් ස්ථිර නැහැ. ඒ නිසාම නිසි වැටුපක් නැහැ. කෝවිඩ් කාලේ මේ හැමෝටම රස්සාවල් නැතිවුනා. අපේ අයගෙන් සියයට අසූවකට විතර කිට්ටු වෙන්න දුප්පත් පවුල් පසුබිමක් තියෙන පිට පලාත්වලිං නගරයට සංක්‍රමනය වෙච්ච අය. සමහරුන්ට කුලී ගෙවාගන්න විදියක් නැති වුනාම බෝඩිං වලිං එළියට දැම්මා. ඒ පිරිස යන එන මං නැතිව බස් ස්ටෑන්ඩ් වල, මුහුද අයිනේ, විහාර මහා දේවි පාර්ක් වාගේ තැන්වලට කොටුවුනා. හැබැයි හැකි හැම වෙලේම මම ඒ අයව ආරක්ෂා කළා. අම්මා තාත්තට හොරෙන් අපේ ගෙදරත් තියාගත්තා.

අපේ ලිංගික අනන්‍යතාව මොකක් වුනත් අපිත් මේ රටේ පුරවැසියෝ. අනිත් මිනිස්සුන්ට තියෙන හැම අයිතිවාසිකමක්ම අපිටත් බුක්ති විඳින්න තියෙන්න ඕනේ. අපි රජයෙන් දුන්නු රුපියල් පන්දහේ දීමනාව ගන්න ගියාම ග්‍රාම සේවකලා අපිට ඉතා පහත් විදියට බැනලා එලවාගත්තා. අපිට චරිත සහතිකයක්වත් දෙන්නැති එකේ පන්දහක් දෙයි කියලා බලාපොරොත්තු වෙන එකත් මෝඩකමක් එක පැත්තකට.

බස් ස්ටෑන්ඩ් වල හිටපු කට්ටියව පොලීසියෙන් අල්ලා ගෙන ගිහිං හරියට වද දීලා තිබුනා. අපේ සමහර අය ඇඳලා ඉන්න විදියට හොයාගන්න අමාරුයි. අයිඩෙන්ටිය චෙක් කරලා පිරිමි කියලා දැන ගත්තු ගමන් කන පිරෙන්න කුණුහරුප. කීප දෙනෙක්ව පොලීසියට එක්කං ගිහං කූඩුවට දැම්මා. ඒ අය කූඩුවේ ඉන්දැද්දිම අපචාරයට ලක්වුනා. සමහර ළමයි දවස් ගනන් පොලිස් කූඩුවල තියාගෙන වද දුන්නා. මේ රටේ නීතිය අපට බලපවත්වන්නේ නැහැ. අපි වෙනුවෙන් ඉදිරිපත් වෙන්නට කවුරුවත්ම නැහැ කියලා දන්නා නිසා සමාජයේ හැම ස්ථරයකම අය අපිට අඩන්තේට්ටං කරනවා.

මේක හරිම නරක ප්‍රවනතාවක්. මේ අපි ඉපදිච්ච විදිය. මේක මානසික රෝගයක් නෙවෙයිනේ. මේක හෝමෝන පිළිබඳ ප්‍රශ්නයක්. අනේ මේ රටේ මිනිසුසු අපිව කවදක තේරුම් ගනියිද? අපි කවදක නිදහස් වෙයිද?

**කතාව ඉදිරිපත් කළේ :** අනුහස් සඳරූ | කොළඹ දිස්ත්‍රික්කය

# රාජ්‍ය සේවකයින්ගේ වීර්ය පාරමිතාව

මම තුශාන්ති ප්‍රනාන්දු. මම වැඩකරන්නේ හෝමගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ. මම තමයි එතන කුඩා ව්‍යාපාර සම්බන්ධ නිළධාරිනිය. කොරෝනා වලට ඇදිරිනීතිය දාලා දවස් දෙකකින් අපිව කැඳෙව්වා. එදිනෙදා රාජකාරි වලට නෙවේ. බඩු ගේන්න, පැක් කරන්න, බෙදා හරින්න වගේ දේවල් වලට. ඉතාම සරලව කිව්වොත් මිනිස්සුන්ට කෑම බීම අවශ්‍යතාව සපුරන්න. ඊට අමතරම මම කුඩා ව්‍යාපාර සංවර්ධන නිළධාරිනිය විදියට වසමේ ඉන්න ව්‍යවසායකයෝ ගැනත් අවධානය යොමු කළා. මම ව්‍යවසායකයෝ පනහකට හැටකට විතර බලපත්‍ර අරං දෙන්න මුල් වුනා.

ඒ දවස්වල අපේ ෆෝන්වලට නිවනක් තිබුනේ නෑ හැම තත්පරේම කෝල් ආවා. දවසක් කෝල් එකක් ආව ගැබිනි මවකගෙන්. එයාට බබා හම්බෙන්න තව සති දෙකයි. ඇදුම්වත් ලැස්ති නෑ කිව්වා. එයාට කන්න බෑ. දොඩම් විතරමයිලු කන්නේ. අන්තිමට අපි වැඩ සේරම නවත්තලා මේ අම්මට දොඩම් හෙව්වා. ඒ වාගේ ඉල්ලීමකට කාලය වැය කරන්න පුළුවන් වෙලාවක් නෙවෙයි ඒක. නමුත් දරු ප්‍රසුතියට සූදානම් අම්මා කෙනෙකුගේ ඉල්ලීමක් අපි කොහොමද බැහැර කරන්නේ.  අපි දන්න දන්න හැම තැනටම කථා කරලා දෙඩම් හෙව්වා. අන්තිමේ පොලීසියත් සම්බන්ධ කරගෙන පිලියන්දල තැනක තිබිලා හොයාගත්තා. අපි කළේ විශාල මානුෂික මෙහෙයුමක්. අපේ සමහර ව්‍යවසායකයන්ගේ දරුවටන්ට අවශ්‍ය කරන ඇඳුම් පවා සැපයුවා. අපේ ප්‍රාදේශීය ලේකම් තුමියගේ ප්‍රධානත්වයෙන් අපි හැම ගෙදරකටම දොරකොඩටම ගිහිං ආහාර සලාක බෙදු දුන්නා. එතනදි අපිත් එක්ක වැඩකරන ව්‍යවසායකයන්ව මේ කටයුත්තට ඍජුව සම්බන්ධ කරගත්තා. කුළු බඩු, හාල් වගේ දේවල් මිලදී ගත්තේ ඒ අයගෙන්.

ලොකුම ප්‍රශ්ණේ වුනේ රුපියල් පන්දහේ දීමනාව බෙදන එක. අපි මූලික වටයෙදී පන්දහ දුන්නේ සමෘධි ආධාර නොලබපු ආබාධිත වගේ පිරිසකට. ඒ කාලේ අර අපි බාහිරින් බලන දුප්පත් මිනිහා විතරක්ම නෙවේ අපහසුවට පත්වුනේ. එදිනෙදා කුලි වැඩක් කරන අය, සුළු හා මධ්‍යම පරිමානයේ ව්‍යවසාකයෝ, භාණ්ඩ හා සේවා සපයන්නන් වාගේ විශාල පරාසයක පිරිසක් වැටිලා හිටියේ. මගේ වසමෙම වාහන ලීසි ගෙවාගන්න බැරිව ලතවෙච්ච පිරිසත් සිය ගනනක් හිටියා.

පන්දහේ දීමනාව බෙදු දෙනකොට සමහර අවස්ථාවන් තිබ්බා පන්දහක් දෙන්න බැරිනම් දහක් හරි දියයුතුම පවුල්. සමහර වැඩිහිටියන්ට පන්දහ දුන්නේ නෑ පුතාට හරි දුවට හරි දුන්න නිසා. ඒ වාගේ අවස්ථාවලට මම මැදිහත් වෙලා මේ ජල්තර ප්‍රදේශයේ දහයකට පහලොවකට වාගේ සහන සැලැස්සුවා. ඒ සද්ක්‍රියාවලට නං මිනිස්සු අදටත් පිං දෙනවා.

මම විශ්වසයෙන් කියනවා හෝමගම කවුරුත් බඩගින්නේ හිටියේ නෑ. රජකාරිය අකුරට කළා. අපි එළවළු, පළතුරු ගෙනැත් බෑවා, කැපුවා, කිරුවා, ගෙදරටම ගෙනිහින් දුන්නා. වැඩ කරනකොට අපේ ගෑනු පිරිමි බේදයක් තිබ්බේ නෑ. හැමෝම එකා වාගේ වැඩ කරා. ග්‍රාම නිළධාරී, සංවර්ධන නිළධාරී, සමෘධි නිළධාරී, ඒ වගේම වෙනත් වසම් වලට අනියුක්ත අයත් මේ වෙලාවේ එක පොකුරට වැඩ කළේ.  සමහර දවස්වල රෑ දහයයි එකොළහයි අපි ගෙදර යනකොට.

කොරෝනා වලට පස්සෙ මම ගියා අපේ ව්‍යවසායකයෝ හම්බ වෙන්න. ඒගොල්ල අපිට හිතා ගන්න බැරි තරම් වැටිලා තියෙනවා. ගොඩ යන්න සෑහෙන කාලයක් ගතවෙයි. එලවළු පෝර වගේ කරන අයට ප්‍රශ්නයක් නෑ වැඩිය. ඇදුම් කරන අය අවුරුද්දට තොග ගෙනල්ල තිබ්බා. ලක්ෂ පහ හය වටින ඒ තොගේම එහෙමම ගෙවල් වල. මල් පැල කරන කෙනෙක්ට තව මාස හයක් හතක් යනකං නැගිටීමක් නෑ. මේ දවස්වල අපි ස්වශක්ති ක්‍රමය යටතේ ණය දෙනවා. ගිය සතියේ අපි ව්‍යවසායකයෝ විස්සක් බලන්න ගියා. එයාලට අපි උපරිම සහය දෙන්න පොරොන්දු වුනා. ඒ අයගේ ඉතුරු තොග අලෙවි කරන්න උපකාර වෙන්න අපි ගිය මාසේ ප්‍රදර්ශනයක් කළා.

විසිතුරු නිර්මාණ වලට අදටත් ආදායමක් නෑ. ඊට අමතරව, රූපලාවන්‍යාගාර එහෙම 80% වැටිලා. කොමියුනිකේෂන්, බුක් ෂොප් එහෙමත් ගොඩක් වැහිලා තියෙනවා. දැන් ණය දුන්න කියලා එක පාර නැගිටින්න බෑනේ. ඒකට කල් යනවා. බඩු හැදුවත් විකුණාගන්න විදියක් නෑ. මිනිස්සු අතේ සල්ලි නෑ.

ඩේ කෙයා එහෙම තාම පටං අරං නෑ. රජයේ නිළධාරීන් පවා රස්සාවට යද්දී සෑහෙන ප්‍රශ්නයක් ළමයි දාලා යන එක. මම උනත් ගෙවල් ලඟ අඳුනන යාළුවෙක් ලඟ තමා බබාලා දාලා යන්නේ.

ඉදිරියේදී මැතිවරණ රාජකාරි එනවා. එතකොටත් අපිට ඒ ප්‍රශ්න බලපානවා දරුණුවටම. දැන් ආයිමත් කොරෝනා හිස ඔසවනවා වගේ දැනෙනවා. එතකොට ව්‍යවසායකයෝ තවත් වැටෙනවා. ඒ මිනිස්සුන්ට මේ වෙලාවේ ආධාර දෙනවට වඩා කෝල් එකක් දීලා කතා කරන එකත් වටිනව. මොනාද කරන්නේ කොහෙද ඉන්නේ අහන එක උනත් ලොකු හිතේ සැනසිල්ලක් ගෙන දෙනවා. සමහර අය කර කර හිටිය ව්‍යාපාර නවත්තලා. මේ කාලෙට ගැලපෙන වෙන ඒවා පටන් අරං. ඇදුම් මහපු අය මුව ආවරණ මැහුවා. කෑම විකුණපු අය කේක් හැදුවා.

අපට පෙනුනා අපේ රාජ්‍ය නිලධාරීන් ගොඩක් අනාරක්ෂිතයි කියලා. අඩුම තරමින් අපිට මාස්ක් එකක් වත් තිබ්බේ නෑ මුල් කාලේ. පස්සේ අපි තරුණ හතර පස් දෙනෙක් එකතුවෙලා හෝමාගම කොට්ටාසෙම රජ්‍ය ආයතන වලට මාස්ක් මහලා නොමිලේ දුන්නා. අපි සල්ලි එකතු කරලා මහලා දුන්නා මාස්ක් 3000 ක් විතර.

අපිටත් දරුවෝ ඉන්නවා. අපි අහපු කථා, දැකපු සිද්ධිත් එක්කලා හොඳටම බය වුනා දරුවෝ ගැන. ගෙදරට ඇවිල්ල කුස්සිය පැත්තෙන් ගිහිල්ලා නාලා ඇදුම් එලියෙන් තියලා ළමයින්ගේ වැඩ කළේ. මං ගොඩක් වෙලාවට එයාලගෙන් ඈත් වෙලා ඉන්න උත්සහ කරනවා.

මේ කටයුත්තේදී ගම් වල ස්වෙච්ඡා සංවිධාන හොඳ සහයෝගයක් දුන්නා. ප්‍රජා නායකයෝ ඕනෑම පොදු වැඩකට සහයෝගය දෙන පිරිසක්. එක අවස්ථවක අපිට වියලි ආහාර බෙදන්න වාහනයක් තිබ්බේ නෑ. ඒ වෙලාවේ ව්‍යවසායකයෙක් තමා වාහනේ දුන්නේ. එයා උදේ නවයේ ඉඳන් පහ හය වෙනකල් හෝමගම ඇතුලේ පවුල් විසිපහකට විතර වියලි සලාක බෙදලා දුන්නා. ළඟ ළඟ ගෙවලුත් නෙවෙයි. ඒවා දුරින් තිබ්බ ගෙවල්.

ඔෆිස් එකේ වුනත් සිකුරිටි අංකල්ගේ ඉඳලා ප්‍රාදේශිය ලේකම් වෙනකං පුදුම සහයෝගෙකින් වැඩ කළේ. ඒ කාලේ යුතුකමයි වගකීමයි එක්ක පොඩි විනෝදෙකුත් තිබ්බා. සමහර වෙලාවට ප්‍රාදේශිය

ලේකම් තැනත් එළවළු පැක් කළා. සරල භාෂාවෙන් කිව්වොත් නාට්ටාමිගේ වැඩෙයි, මුදලාලි ගේ වැඩෙයි දෙකම කළේ අපි.

අපි දැනට කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙන් හදලා තියෙනවා ඔන් ලයින් මාකටිං සිස්ටම් එකක්. ඊට අමතරම ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන දිරිගන්වන්නටත් වැඩ පිළිවෙලක් පටන් ගත්තා. සමහර අය තමන්ගේ ව්‍යාපාර අත්තැරියා. ඒ අයවත් කොහෝම හරි උනන්දු කරවනවා. මේ දවස්වල දේශීය අල වලට හොඳ ඉල්ලුමක් තියෙනවා. කිලෝ එකක් තුන් සීයක් වගේ වෙනවා. ඉතින් ඒකට කැමති ඉඩම් තියෙන අය විසිපහක් විතර තෝරං ඉන්නවා. ලබන සතියේ අපි මොනරාගල යනවා ඒ බීජ අරං එන්න. පස්සෙ අල ටිකත් අපි අරං අපිම විකුණලා දෙනවා.

පස්සේ බිම්මල් ප්‍රොජෙක්ට් එකකටත් යන්න සැලසුම් තියෙනවා. ඒක ගමේ කඩේට නෙවේ ෆුඩ් සිටි මට්ටමට යන්න තමා ප්ලෑන් එක. කොළඹ  ඔන්ලයි මාකට් එක තමයි අවසාන ඉලක්කය. එහේ ලොකු ඉල්ලුමක් තියෙනවා.

**කතාව ඉදිරිපත් කළේ :** සුපුන් සඳනුවන් | කොළඹ දිස්ත්‍රිකය


කාංචන

# මල්ලි අපි නං ගොඩ මල්ලි

මම කාංචන ලක්මාල්. ගම සේදවත්තේ.

වැඩ කළේ බේකරියක. කෝවිඩ් කාලේ බේකරියෙන් පාන් ගන්න ත්‍රී වීල් පොඩි මුදලාලිලා පෝලිමේ. එකට වැඩ කරපු මමයි මගේ යාළුවයි හිතුවා අපිත් මේ වැඩේට බැස්සොත් කල්ල මරේ නේද කියලා. මුදලාලි අනිත් අයට පනහට දෙන පාන් ගෙඩිය අපිට දුන්නේ හතලිස් පහට. අනිත් අය රාත්තල වික්කේ හැත්තෑවට. අපි හැට පහට දුන්නා. අපි දෙන්න කොහොම හරි හැමදාම පාන් ගෙඩි දෙතුන් සීයක් වික්කා. ටික දවසක් ගියාම අපි අතේ ලක්ෂ දෙකක් විතර ඉතුරු වුනා.

අපි පොලියට ණයක් අරං බේකරියක් සල්ලි වලටම ගත්තා. දැන් අපේම බේකරියේ හදන පාන්, බනිස්, කේක්, බේක් සේරම අපිම දොරකොඩටම ගිහිං විකුනනවා.

කිත්තන්පහුව, සේදවත්ත, වෙලේවත්ත, වඩුගොඩවත්ත, ඔරුගොඩවත්ත වාගේ කොයි කොයි වත්තෙත් අපේ පාන් තමයි ජයටම විකිනෙන්නේ. තව ටික දවසකින් පොඩි බට්ටෙක් ගන්න තමයි අදහස. එතකොට නං රූං ගාලා කොළඹ වටේටම උනත් සප්ලයි එක දෙන්න පුළුවන්. අනේ අපිට නං කෝවිඩ් ෂෝක්.

**කථාව ඉදිරිපත් කළේ :** යූ ඒ චිල් යොහාන් | කොළඹ දිස්ත්‍රික්කය

# කටකතාවක් ගිය දුරක්

වසංගතයක් හමුවේ වැරදි තොරතුරු පැතිර යන විට කුමක් වේවි ද?

මෙය කටකතා, සැක සංකා සහ ව්‍යාජ පුවත් දාමයකට හසු වූ පවුලක කතාවක්. ශ්‍රී ලංකාවේ මෙවැනි තත්ත්වයකට මුහුණ දුන් එකම පවුල මෙය නොවේ. කොවිඩ්-19 වසංගතය ලංකාව තුළ ආරම්භ වෙද්දීම අජිත් ආරියදාස මහතාගේ සහ නාමලී ආරියදාස මහත්මියගේ පියා රෝගාතුර විය. ඔහු 86 වැනි වියේ පසු වූ අතර, කකුලේ තුවාලයක් ද සහිතව ඔහු රුහුණු රෝහලට ඇතුළත් කරන ලදී. ඇඳිරි නීතිය සමයක් නිසා ඔහුගේ අවශ්‍යතා වෙනුවෙන් පවුලේ අයට යෑම් ඊම් සඳහා රෝහල් අවසර පත්‍රයකුත් ලබා දී තිබුනා. රෝගී තත්වය උත්සන්න වූ හෙයින් පියා කරාපිටිය රෝහලට මාරු කර යැවූ අතර එහිදී ඔහු මිය ගියා.

මරණ පරීක්ෂණයට අනුව තුවාලය නිසා ඇති වූ ලේ විෂවීමක් සහ පෙනහළු ආසාදනයක් නිසා ඇති වූ ශ්වසන අපහසුතාවය ඔහුගේ මරණයට හේතු වී තිබූ මුත්, මේ අතර මරණයට හේතුව වරදවා වටහා ගත් ඥාතියෙක් මරණය පිලිබඳ පුවත වැරදි ලෙස ගම පුරා ප්‍රචාරය කළ නිසා අවුල්ජාලයක් ඇති වුනා. මරණය කොරෝනා වෛරසයට සම්බන්ධ නොවූවත්, මේ ගැන වැරදි කතා එකී නෙකා අතර පැතිරුනා. මරණය සහ මරණයට හේතුවූ කරුණ පිළිබඳ පුවත් විකෘති වූ අතර පුවත්පත් සහ සමාජ මාධ්‍ය හරහාද මේ පිලිබඳ වැරදි පුවත් හුවා දැක්වුනා.

මෙය පවුලේ අයට කරදරකාරී කාලයක් වුනා. කොරෝනා වෛරසය පිලිබඳ තොරතුරු සමාජ ගත වන අතරම මෙම මාරාන්තික වෛරසය වාතයේ පවතින බවට ද කතා පැතිරුනා. පැවති ඇඳිරිනීති තත්ත්වය සහ වෛරසය පිලිබඳ පැවති අවිනිශ්චිතතාවය හමුවේ සෞඛ්‍ය සහ පොලිස් බලධාරීන් අවමංගල්‍යට මිනිසුන් පැමිණීම සීමා කිරීමට පියවර ගනු ලැබුවා.

ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් හිමාලි රත්නවීර මහත්මිය ද මේ ගැන මෙලෙස ප්‍රකාශ කළා. "මෙම මරණය පිලිබඳ මට පැමිණිල්ලක් ලැබුණු විගසම මම එම ස්ථානය සෝදිසි කිරීමට නිලධාරීන්ව යැව්වා. පොලිසිය සහ සෞඛ්‍ය බලධාරීන්ට මේ පිලිබඳ දැන්වූවා. එම ස්ථානය අවට සියලු පුද්ගලයන්ට අවමංගල්‍යට සහභාගී නොවීමටත් තමන්ගේ නිවෙස් වලට වී සිටීමටත් උපදෙස් දුන්නා. මියගිය පුද්ගලයාට කොරෝනා වෛරසය අසාදනය වී නොතිබූ බව අපි දැනගෙන හිටියා. නමුත් අනවශ්‍ය අවදානම් නොගත යුතුයි. මම අවමංගල්‍යට සහභාගී වීමට කිසිවෙකුට ඇඳිරිනීති අවසර පත්‍ර නිකුත් නොකරන ලෙසට නිලධාරීන්ට දැන්වූ අතර පිට ප්‍රදේශ වලින් පැමිණෙන පුද්ගලයන් ව නැවැත්වූවා. සෞඛ්‍ය බලධාරීන්ටද නිසි පියවර ගන්නා ලෙසට උපදෙස් දුන්නා."

කෙසේ වෙතත් විකෘති තොරතුරු සමාජ ගත වීම නිසා ම ලොකු අවුලක් ඇති වුනා. ගම්වාසීන් පූජ්‍ය පක්ෂය අවමංගල්‍ය කටයුතු සඳහා සහභාගී වීමෙන් වැලක්වන්න කටයුතු කරා. පවුලේ අය තොරතුරු වසන් කළ බවට චෝදනා කරමින් පොලිසියට දිගින් දිගටම ඇමතුම් ලබා දී තිබුනා. පවුලක ට ශෝකජනක වූ මොහොතක් පොදු සමාජය තුළත් සමාජ මාධ්‍ය තුළත් කුණාටුවක් වුනා.

නාමලී ආරියදාස සිය අත්දැකීම් ඉතා දුක්මුසුව සිහිපත් කළා ය. "මෙම ගම උගත්, බුද්ධිමත් මිනිසුන්ගෙන් පිරුණු ගමක් ලෙස ප්‍රචලිතව තිබුණත්, මෙම සිද්ධියෙන් පසුව මේ ගමේ සහ

ගම්වාසීන්ගේ ගෞරවය සුන්වී ගියා. අපිට අවමංගල්‍ය ශාලාවේදී වත් මිනී පෙට්ටිය ළඟින් ඉවත් වෙන්න ඉඩ දුන්නෑ. මේ ගමේ සුබ සාදක සංගමයක් තියෙනවා. එහි සභාපති කොරෝනාවෙන් ගම ආරක්ෂා කිරීමට විරෝධතාවක් සංවිධානය කිරීමට සාකච්ඡා කර තිබුණා. මේක මහා රෑ සංවිධානය කරලා තිබුණේ. ඔවුන් කිහිප වතාවක්ම 119 අමතා තිබෙනවා පොලිසිය සම්බන්ධ කරගන්න. පොලීසිය අපේ නිවසේ සිටින විටත් දුරකත ඇමතුම් අවා. මේක හරියට අපෙන් කරන පළිගැනීමක් වගේ දැනුනේ. අපි කාටවත් වෛර කරන්නේ නෑ."

අපිට කොරෝනා වෛරසය අසාදනය නොවුණත් අපිට ගොඩාක් ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිද්ධ වුණා. එත් මේ සිද්ධිය අපිට මිනිසුන්ගේ ස්වභාවය තේරුම් ගන්න උදව් වුණා. අපේ කතාව ඇසීමෙන් අනාගතයේදී මිනිසුන් කටකතා සහ ව්‍යාජ පුවත් ඇසීමේදී මනා කල්පනාකාරී වේවි යයි මම හිතනවා. යනුවෙන් විජිත ආරියදාස මහතා වැලපෙමින් ප්‍රකාශ කළේය.

**කථාව ඉදිරිපත් කළේ :** අනුලා දීගල | ගාල්ල දිස්ත්‍රික්කය.

# හරියනකොට ඔහොම තමයි

කෝවිඩ් වසන්ත කාලේ අපේ ගෙදර සෙල්ලටම වාගේ පාන් පිච්චුවා.

ඉස්සෙල්ලම පාන් රාත්තල දෙල් ගෙඩිය වාගේ. දෙවෙනි දවසේ කොස් ගෙඩියක් වාගේ. හැබැයි පුසුඹේ බැහැ. මුළු ගමේම මිනිස්සු මේ පුසුඹට වහ වැටිලා පාන් සුවඳ දිගේ අපේ ගෙදරට ආවා. අපිත් අත ඇරියේ නෑ. දන්න දන්න අයගෙන් අහගෙන, යූ ටියුබ් ගතවෙලා පාන් සාත්තරේ පරතෙරට ඉගෙන ගත්තා. දවස දෙක යනකොට ඕඩර වැහි වැස්සා. දැන් පාන් විතරක් නෙවෙයි. මාළු පාන්, රෝස් පාන්, බටර් බනිස් වාගේ බේකරියක හදන හැම කෑමක්ම වාගේ හදනවා. හරියනකොට පාන් ගෙඩිය වුනත් වැල්ලෙත් කැරකෙනවා කියන්නේ ඔන්න ඕකට තමා.

**කථාව ඉදිරිපත් කළේ :** බන්දුල ජිනේන්ද්‍රසිංහ | කළුතර දිස්ත්‍රික්කය

# ඉතාලි සිට ලංකාවට

මොරටුව ලුනාව ප්‍රදේශයේ ඉතාලි සිට ලංකාවට පැමිණ කොරෝනා රෝගය ආසාදනය වී වසංගතයට සෘජුවම මුහුණ දුන් පවුලක් සමඟ කළ සංවාදයකින් උපුටාගත් කොටස්. සම්මුඛ සාකච්ඡාව සිදු කලේ සර්වෝදය කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකාරක ඉඳුනිල් හිත්තැටිය විසිනි

සෙනෙහෙලතා - සුවවූ පුද්ගලයාගේ බිරිඳ : වුහාන් වල පටන් අරගෙන සති දෙක තුනක් යනකොට තමයි ඉතාලි වලට ආවා කියලා කිව්වේ. එතකොට එතන ඉඳන් මං දවස ගානේ මෙයාට කෝල් කරනවා. ඒ හැම වෙලාවකම මං ඇහුවේ කොහෙද ගියේ මොනවද කෑවේ, පරිස්සම් වුනාද, උණුවතුර බිව්වද වාගේ දේවල්. මමයි දුවල දෙන්නයි අවුරුදු හතරකින් කිත්සිරිව දැකල තිබුනේ නැහැ. කොරෝනා ප්‍රශ්නේ එනකොට මෙයා මිලාන් ඇතුලට වෙන්න හිටියේ. ඇතුලට තාම බලපෑමක් නෑ කියල කල් ඇර ඇර හිටියා. මං ඕක දැනගත්ත දවසේ ඉඳන් කිව්වේ එන්න කියලා. මම කොහොමත් ඉස්සර ඉඳන්ම කිව්වේ එන්න කියල මොකද මගේ ජොබ් එකේ වැඩයි, දුවලා දෙන්නගේ වැඩයි ගෙදර වැඩයි සේරම තනියෙම කරගන්න අමාරු වුනු නිසා.

මෙයාගේ අයියා කෙනෙක් හිටියා මිලාන් වල. එයා තමයි ජොබ්ස් ඔක්කොම හොයලා දුන්නේ. අයියා හිටිය නිසා මෙයාට ලොකු හයියක් උනා ඒක. ඉතිං ඔහොම දවස ගානේ මම අහනවා මෙයාගෙන් දේවල්. අයියගේ වයිෆ් මට ඇත්ත කියනවා. එයා කියනවා ඔන්න අපේ අපාර්ට්මන්ට් එකට එහා පැත්තේ එකේ ඉඳන් කොරෝනා රෝගියෙක් හම්බවුණා කියලා. ඒ වගේ එයා මට එහෙ තත්වේ කියන්න ගත්තා. ඊට පස්සේ එයා මට කිව්වා දැන් නම් ඉන්න තත්වේ අමාරුයි කියලා. ඒක අහගෙන මම මෙයාට එන්න එන්න කියලා කරදර කරන්න පටන් ගත්තා. මට දැන් හිතෙන්නෙම මෙයාට ඒ ලෙඩේ හැදුනොත් මොනවා කරන්නද කියලා, එහෙ සමහරක් වෙලාවට කියා කියා හිටියා වීසා නැත්නම් හොස්පිට්ල් වලට ගන්නේ නෑ කියලා.

මාර්තු හත අට වෙනකොට මෙයාගේ අයියගේ වයිෆ් අයියයි මල්ලියි එක්ක රණ්ඩු කරලා කොහොමහරි එන්න ලෑස්ති කර ගත්තා. මොකද අයියගේ පුතාටයි අයියටයි දෙන්නටම ඇදුම ගතිය තියෙනවා. ඩොක්ටර්ස් කිව්වලු කොහොමහරි ඉක්මනටම ආසියාතික රටකට යන්න කියල. මොකද වීස් එක තියෙන අයට හැදුනොත් ලේසි වෙන්නෙම නෑ කියල. ඊට පස්සේ අයියට මේකේ බරපතලකම දැනෙන කොට මෙයාව තියලා එන්න බය උනා. ඊට පස්සේ අයියා මෙයාට කෝල් කරලා කිව්වලු අපි දහය උදේ යනවා, ඔයාට ටිකට් එක දැම්මා කියල.

සුව වූ පුද්ගලයා කිත්සිරි : අපි කොහොමහරි කරදරයක් නැතුව අපි මාර්තු එකොලොස් වෙනිද රාත්‍රියේ ඩුබායි හරහා ලංකාවට ආවා. එතන තව ලංකාවේ කට්ටිය ගොඩාක් හිටියා. මෙහෙට ඇවිත් ෆ්ලයිට් එකෙන් බහින කොට ඩියුටි ෆ්‍රී පැත්තටවත් ගෙනිච්චේ නෑ. ඒ ලඟින්ම අයින් කරලා බැස්සුවා පල්ලෙහායින්. ඊට පස්සේ එයාපෝර්ට් එකෙන් ඔක්කොම කන්න බොන්න දුන්නා. පස්සේ අපිව ගෙනිච්චා කටුනායක එයාෆෝස් කෑම්ප් එකට. ඉමිග්රේෂන් එකේ වැඩ ටිකත් කරේ එයාෆෝස් කෑම්ප් එක ඇතුලේමයි. අපිව යැව්වෙම නෑ එයාපෝට් එක ඇතුලට. පිටින්ම තමයි ගෙනාවේ කටුනායක කෑම්ප් එකට. එතනින් තමයි ඔක්කොම චෙක් කරලා, කන්න බොන්න දීල, ග්ලවුස් එහෙම දීල බෑගේජ් ඔක්කොම හෝදලා අපිව ක්ලීන් කලේ.

සෙනෙහෙලතා : එකොළහයි හතලිස්පහයි හරියටම ගේට් එකෙන් එලියට එනකොට. මමයි දුවල දෙන්නයි මගේ පුංචියි තමයි එයාර්පෝට් එකට ගියේ. දරුවොත් මාස අටක් විතරම තාත්තව දැකල නෑ නේ.

කිත්සිරි : ෆ්ලයිට් එකේ ආපු අය ඔක්කොම එකම බස් එකේ ගෙනිච්චේ කන්දකාඩු වලට. අපිත් එක්ක විසිතුනක් විතර ආව එකට. ඒ විසිතුනම තනි බස් එකේ තමයි කෑම්ප් එකට ආවේ. ඉස්සරලා කියල තිබුනේ අර ෂරියා යුනිවර්සිටි එකට ගෙනියනවා කියලා. එතන එක්කෙනෙක් හිටියා ඉතාලියේ දත් දොස්තර කෙනෙක් ළග වැඩකරපු. මිනිහා බස් එකේ එනකොටවත් මාස්ක් එකක් දාගෙන හිටියේ නැහැ. කෝකටත් අපි සැක කළා මිනිහට කොරෝනා තියෙන්න ඇති කියලා. කොහොමහරි අපිව කෑම්ප් එකට ගෙනල්ල දවසක් යනකොට මිනිහට උණ ගත්තා.

කෑම්ප් එකේ පොඩි පහසුකම් මද ගතියක් දැනුනා. පොඩි පොඩි වචන හුවමාරු ගියා ඉතින්. ආමි එකෙන් කිව්වා අපි දන්නවා ඇත්ත විස්තරේ අපිට දවසක් දෙකක් අපට දෙන්න ඕගොල්ලන්ගේ සැප පහසුව ඔක්කොම හදල දෙන්නම් මොකද අපටත් පලවෙනි අත්දැකීම මේක, ඒ නිසා පොඩ්ඩක් ඉවසගෙන ඉන්න කියලා.

සෙනෙහෙලතා : මේ ගොල්ලොත් එක්ක ආපු කවුරුවත් නම් එහෙම අරගල කරන්න ගියේ නෑ.

කිත්සිරි : අපිට ඉස්සරලා ආපු අයනම් ටිකක් රණ්ඩුවෙලා තිබුණා. කොරියා ඉඳන් ආපු අය. අපිනං අපහසුතාවයක් තිබුනොත් කියනවා මිසක් එහෙම රණ්ඩු කරන්න ගියේ නෑ. අපිට එහෙන් හොඳට කන්න බොන්න ඔක්කොම නොමිලේම දුන්නා. දවසට තේ එහෙම හතර පස් පාර දුන්නා. කොත්තමල්ලි, සුප් වගේ ඒවත් දුන්නා.

සෙනෙහෙලතා : කොහොමහරි රෝම් ඉඳන් ඇවිල්ල එතනදී මෙයත් එක්ක හිතවත් වෙච්ච කෙනෙක්ට දොළොස්වෙනිද උදේම චෙක් කරලා බලද්දී උණ තිබුණා.

කිත්සිරි : උදේ හතේ ඉඳල හවස හය හත වෙනකන්ම ඇඳේම තමයි හිටියේ නෙට් එකත් දාගෙන. හැමදාම උදේටයි හවසටයි එනවනේ උණ චෙක් කරන්න, ඩොක්ටර්ස්ලා දෙන්නෙක් එනවා. බලනකොට එයාට උණ කියලා කිව්වා. එයා පොඩ්ඩක් අදිමදි කරලා කිව්වා එයාට නිතරම උණ හැදෙනවා. දේශගුණය වෙනස් උනාම ලංකාවට ආවම කොහොමත් එහෙම උණ ගන්නවා කියලා. මං හිතන්නේ එයා ලෙඩේ හැදිලා තමයි අවේ කියලා.

මට ඊට දවස් දෙකකට පස්සේ, ඒ කියන්නේ දාහතර වෙනිදා තුන තුනහමාර වගේ වෙනකොට තේරුණා ඇඟ පොඩ්ඩක් රිදෙනවා කියලා. මං ඒත් බැලුවා මහන්සියට ද දන්නේ නෑ කියලා. ඇඟ රිදෙන්න ගත්තට පස්සේ එදා දවසේ පැය හතරක් පහක් වැඩිපුර නිදා ගත්තා. මායි අයියයි දෙන්නම නිදා ගත්තා. නිදාගෙන හිටියට මට තේරුණා ඇඟට අමාරුයි කියලා. මං හිතුවා නිදාගෙන හිටියම තවත් අමාරු වෙයි කියලා එලියට ආවා. එලියට ආවට පස්සේ මට තේරෙනවා ඉර අව්ව බලන්න බෑ, ඇස් දෙක පොඩි වෙලා කඳුළු එනවා. ඊට පස්සේ එළියෙන් පුටුවක් තියාගෙන අව්ව නැති පැත්ත බලාගෙන හිටියා ටික වෙලාවක් යද්දී අව්ව ටිකක් වටින් එනකොටත් අමාරුයි. මං දැනගත්ත මේ මොකක්හරි දෙයක් නිසා වෙන්න පුළුවන් කියලා සමහරක් විට. ඊට පස්සේ අටට විතර ඩොක්ටර්ස්ල

දෙන්න ඇවිල්ල බලනකොට මටත් සීයයි දශම දෙකට විතර උණ තිබ්බා. ඒ එක්කම තව හතර දෙනෙකුට විතරත් තිබ්බා. ඊට පස්සේ පැය බාගෙකින් විතර ඇවිල්ලා ආයිමත් චෙක් කරාට පස්සේ අපි පස් දෙනාම අරන් ගියා ඩොක්ටර් ගාවට. එතනින් බලල කිව්වා ඕගොල්ලන්ගේ පාස්පෝට් ඔක්කොම ගන්න ඇඳුම් ටිකත් ඔක්කොම ගන්න ඔක්කොම ලෑස්ති කරගන්න, එහෙම කියල පොලොන්නරුව හොස්පිටල් එකට ගියා දාහතර හවස. එතනට ගියාට පස්සේ අපේ PCR එකක් ගත්ත නහයෙන් සෙම අරගෙන දිවෙන් අරගෙන දාල. කොහොම හරි පහුවෙනිදා වෙනකොට තමයි රිපෝර්ට් එක ආවේ. පැය විසි හතරක් ගියා රිපෝර්ට් එක එන්න. එතනින් කිව්වා ඕගොල්ලෝ පොසිටිව් වෙලා තියෙන්නේ කොළඹ IDH එකට යන්න ලෑස්ති වෙන්න කියල අපි පස් දෙනාටම.

IDH ඇවිත් දවස් පහකට පස්සේ PCR එකක් කළා. එකත් පොසිටිව් උනා. ඊළඟ දවස් පහළව ගියාට පස්සේ ගත්තු එක නෙගටිව් උනා. එක ළඟ දෙකක් ගන්නවා. ඊට පස්සේ පහුවදා උදේම. ඒ ගොල්ලෝ එන්නේ පාන්දර පහමාරට විතර ගන්න. පහුවදා ගත්තට පස්සේ පලවෙනි එක නෙගටිව් උනා. ඊට පහුවදා ගත්තු එක ආපහු පොසිටිව්. ඒ ගොල්ලෝ සාමාන්‍යයෙන් රෑ හය හමාර හත වෙද්දී කියනවා රිපෝට් එක හොඳ නෑ තව ටිකක් ඉන්න වෙනවා කියල.

ඉස්පිරිතාලෙදි අපිට කෑම බීම එහෙම හොඳට දුන්නා. තුන් වවේලම බත් තමයි වැඩිපුරම දුන්නේ. මස් වලින් දුන්නේ කුකුල් මස් විතරයි. මාළු, බිත්තර වගේ ඒවා දුන්නා. බිත්තර නම් දවස ගානෙම දුන්නා. හොඳට කන්න කිව්වා. හොඳට ශක්තිමත්ව ඉන්න කිව්වා. දවස් එකහමාරක් විතර කෑවෙත් නෑ නේ බයට. තව කැඳ ගෙනාවා ආයුර්වේද තැනකින්. ඒ ගොල්ලෝ කිව්වා ඒ කැඳ එක හදන්නේ පැළෑටි වර්ග අසූ පහක් දාල කියලා. ඒ ප්‍රතිශක්තිය වැඩි කරන්න. කට්ටිය ඉන්න දවසට ඒ වගේ කැඳ ලොකු ජෝගුවක් ගෙනාවා. මං ඉතින් ඒ වගේ දෙකක් විතර බොනවා බයටම. මොකද ඒක බොන්නම කියල කියනවනේ. ඒ ගොල්ලෝ කියනවා ඉස්පිරිතාලේ කොච්චර  හිටියත් වැඩක් නෑ. තමන්ගේ ශරීරයෙන්ම තමයි මේක යවන්න තියෙන්නේ කියලා. මේකට බෙහෙත් නෑ කාල බීල හොඳට ඉන්න කියන එක තමයි කිව්වේ. තුන් වේලක් විතර විටමින් සී දුන්නා බොන්න කියලා.

සෙනෙහෙලතා : මෙයාට හුස්ම ගන්න අමාරු ගතියනම් තිබ්බා. ඒ උනාට මේගොල්ලෝ සාමාන්‍ය ලෙඩ්ඩු හැටියට තමයි සැලකුවේ. මොකද මේ ගොල්ලන්ගේ අනෙක් රිපොර්ට්ස් වල මොකුත් ප්‍රශ්න තිබුනේ නෑ. පෙනහළු පැහැදිලියි. ප්‍රෙෂර් සාමාන්‍යයි. බ්ලඩ් රිපෝර්ට් ඔක්කොම සාමාන්‍යයි. ඉතින් මේ ගොල්ලොන්ට වෙනත් අමාරුකම් ඇතුලෙන් නැති නිසා ප්‍රශ්නයක් උනේ නෑ.

කිත්සිරි : IDH එකේ හිටියා දවස් විසිතුනක් විතර.

සෙනෙහෙලතා : මෙයාව දාහතර හවස පොලොන්නරුවේ ගෙනිච්චා. දාසය පාන්දර වෙන්න තමයි IDH ගෙනාවේ. අප්‍රේල් නවය තමයි ඩිස්චාර්ජ් කරේ.

කිත්සිරි : ගෙදර ඇවිල්ලා දවස් දාහතරක් වෙනම හිටියා. උඩ කාමරයක් තියනවා. කෑම බීම ඔක්කොම ලෑස්ති කරලා දොර ළඟ පුටුවේ තියල තිබ්බම එතනින් අරන් කෑවෙ. මගේ ඇඳුම් ටික මමම හෝද ගත්තා.

කිත්සිරි : මං ගෙදර ආපු දවසෙම කතා කරා PHI මහත්තයට. මොකද තව කල් ගියොත් අපි දැනුම් දුන්නේ නෑ කියල තව ප්‍රශ්නයක් ඇති වෙනවනේ. මං කතා කරාම පහුවදාම PHI මහත්තයයි, MOH ඩොක්ටයි ආව. හරිම හොඳයි ඒ ඩොක්ට. ඒ ගොල්ලෝ කිව්වා තව දවස් දාහතරක් මට එලිබහින්නේ නැතිව ඉන්න කියල. ලේඩි ඩොක්ට කෙනෙකුයි තව මහත්තයෙකුයි තමයි අවේ.

සෙනෙහෙලතා : මට වෙච්ච තව දෙයක් කියන්න ඕනේ. මම එයාපෝට් එකට ගියානේ. මෙයත් එක්ක කිසිම කතා බහක් කරන්න වත්, වාහනය නවත්තලා ජනේලයකින් කතා කරන්නවත් හම්බවුණේ නෑ. අත වනලා ආපු ටික විතරයි. මෙයාට අසනීප වෙලා ගෙනිච්ච දවසට පහුවෙනිදම පොලිසියෙන් ආවා හත් දෙනෙක් විතර. මට තේරුණා ඒ අයත් එක්ක තව උසස් නිලධාරියෙකුත් ආව කියලා. ගෙයි ඇතුලට ආවෙත් නෑ. හරියට මැද්දේ හිටියේ. මගෙන් විස්තර ඇහුවා. අපේ අනුවණකමට අපි කිව්වා එයාපෝට් එක ලඟට ගියා නමුත් මෙයාට කතා කරන්නවත් ලැබුනේ නෑ අපි මෙයා බස් එකේ යනවා දැක්ක විතරයි කියලා. ඒ කිව්වට පස්සේ ඒ විස්තර ටික ඔක්කොම අහගත්තා. එතකොට අවට ගෙවල් වලිං එබිකම් කරනවා ඇයි පොලිසියෙන් ඇවිල්ල තියෙන්නේ හොයන්න, හරියට අපි අපරාධකාරයෝ වගේ. අපිව නිකං ඒ ගානට වැටුනේ. මම මානසිකව වැටුණේ අන්න එතනදී. අපිට පුරුදු නෑ පොලිසියකට උනත් මූණ දෙන්න. පොලිසියෙන් ගේ ළඟට ඇවිල්ලා ප්‍රශ්න කරනකොට හරි අමාරුයි එකට මූණ දෙන්න. මගේ රස්සාව, බබාලා කොහෙද ඉස්කෝලේ යන්නේ කියල විස්තර ඇහුවේ පාර මැද්දේ ඉඳන්. එතකොට ඒ ගොල්ලෝ එහෙම ප්‍රශ්න කරලා ගියා. ගියාට පස්සේ පහුවෙනිදා ආව MOH එකේ කට්ටිය. ඒ කට්ටිය මේ ඇතුලටම ඇවිල්ලා මාත් එක්ක සුහදව කතා කළා. ඊට පැයක් යන්න හම්බවුණේ නෑ පොලිසියේ දෙන්නෙක් ආවා, එක්කෙනෙක් සිවිල් එක්කෙනෙක් යුනිෆෝම්. ගේට්ටුවෙන් අතුලටවත් අවේ නෑ කලින් වගේම ප්‍රශ්න කරනවා පාර මැද්දේ ඉඳන්. අර රෑ කියපු විස්තරේම ආයේ කියන්න වුනා මුල ඉඳන්. දැන් මම MOH එකෙන් ආපු කට්ටියටත් ඔය විස්තරේ ඔක්කොම කියල තියෙන්නේ. කලින් දවසේ රෑ ආපු කට්ටියටත් එහෙමම කිව්වා. දැන් මේ දෙන්නටත් එහෙමම කියනවා.

ඒ ගොල්ල මොරටුව පොලිසියෙන්. එක්කෙනෙක් එස්.අයි. කෙනෙක්. මං හිතන්නේ ආමි එකේ බුද්ධි අංශෙනුත් කෙනෙක් එතන හිටියා.

ඒවා වෙද්දී තමයි මම කලකිරුණේ. එතකොට ඒ ගොල්ලෝ දැනගන්න ඕනේ මෙයා ලංකාවට ආවේ කොයි වේලාවේද, මේ නීතිය දැම්මේ කොයි වේලාවේද එතන ඉඳන් ආපු අයට ගෙවල් වලට එන්න දුන්නද කියන එක. ඒ ගොල්ලො දැනුවත් වෙන්න ඕනේ අපිට කලින්. මට දැන් හොඳටම දුකයි. මෙයා ලෙඩ වෙලා එහෙන්. මැරි මැරී වැටෙන ලෙඩක් කියලනේ ආවේ. ඒකත් ඔලුවේ දරාගෙන මේ එන ප්‍රශ්න වලටත් මූණ දීගෙන හිටියේ. ඊට පස්සේ ඒ ගොල්ලෝ කියනවා අපිත් නිරෝධායනය වෙන්න ඕනෙලු අපි එයාපෝට් එක ලඟට ගියා කියලා. එතකොට මං ඇහුවා ඔෆිසර් ඔයා දැන් මට කියන්නේ කොරන්ටයින් වෙන්න කියලා ඔයා දන්නවද එතන ප්‍රොසීඩියර් එක? ඔයා දන්නවද එතනින් එන කට්ටිය ගේට්ටුවකින් වත් එලියට එන්න දෙන්නේ නැතුව එහෙමම ඇතුලෙන් බස්වලට පටවාගෙන තමයි කොරන්ටයින් සෙන්ටර්ස්වලට ගෙනියලා දාන්නේ. ඊට පස්සේ බෑග් ගෙනාවද අහනවා. ඒකයි එතන තියන විහිලුව. ඒ ගොල්ලොන්ගේ රාජකාරි මට්ටමින් ක්‍රියාත්මක කරන දේවල් ඒ සංවිධාන දැනගෙන ඉන්න ඕනේ. මිනිස්සුන්ව අපහසුතාවයට පත් කරන්නේ නැතුව. ඊට පස්සේ මමත් ඒ ගොල්ලොත් එක්ක තර්ක කරා. ඊට පස්සේ මං ඇතුලට ඇවිල්ල කිව්වා දාමරිකයෝ හොරකම් කරන අයටවත් මෙච්චර කරදර නැතුව ඇති කියල.

ඊට පස්සේ එයාල නිරෝධායනය වෙනවා කියල කොලේ ගැහුවා. මං කිව්වා කොලේ ගහන්න එපා අපි කොරන්ටයින් වෙන්න අවශ්‍ය නෑ, MOH එකෙනුත් ඇවිල්ලයි ගියේ, කොලේ ගලවන්න කියලා. ඊට පස්සේ ඒ ගොල්ලෝ කිව්වා අපිට කරන්න දෙයක් නෑ අපිට කියල තියන දේ තමයි මේ කරන්නේ MOH එකට කතා කරලා විසඳගන්න කියලා. ඒ කියන්නේ PHI කරන්න ඕනේ ජොබ් එක තමයි මොරටුව පොලිසියෙන් කරේ.  ඊට පස්සේ මං මොරටුව පොලිසියට කතා කරා. ඒ ගොල්ලෝ කිව්වා එයාලට ගලවන්න බෑ MOH එකත් එක්ක කතා කරගන්න කියලා. ඊට පස්සේ මම MOH ඔෆිස් එකට ගිහින් කිව්වා මට මෙහෙම ප්‍රශ්නයක් මට කතා කරන්න ඕනේ කියලා. ඩොක්ටර්ස්ලා දෙන්නාම හිටියා ලේඩි ඩොක්ටයි අනිත් ඩොක්ටයි. මගේ ප්‍රශ්නේ ඔක්කොම අහල එයා කිව්වා  ඔයාට එවෙලේ අපි කතා කරානේ. එහෙනම් අපියි කිව්වා ඔය කොලේ ගහන්න ඕනේ. ඒ ගොල්ලෝ නෙවෙයි කිව්වා. දැනුවත් කමක් නැතුව වැඩ කරන්න ගියාම මේ ප්‍රශ්නේ එනවා කිව්වා. දැන් ඔයාගේ මානසික මට්ටම අපිට තේරෙනවයි කිව්වා. ඔයා දරුවෝ දෙන්නෙක් එක්ක මහත්තයා එහෙන් ලෙඩ වෙලා කියලා. දැන් අවටට මේක ලොකු ප්‍රශ්නයක් වෙලා. මිනිස්සු සලකන්නේ නිකං අපි හරියට කොරෝනා රෝගීන් වගේ කිසිම හුළඟකින්වත් සම්බන්ධයක් නැතුව. ඊටපස්සේ මට ඇඩුනා සෑහෙන්න. මොකද මට මානසිකව ආපු පීඩනය වැඩියි. මොකද මෙයාගේ ප්‍රශ්නෙයි එහෙන් පොලිසියෙන් එනවා නිතරම. බුද්ධි අංශයෙන් කියල එනවා. එකම විස්තරේ මමත් සැරින් සැරේට කියනවා. ඉතින් මට දැන් අමාරුයි මේක විඳගන්න.

විශේෂයෙන්ම දැන් පොලිසියෙන් රෑ දහයට එකොළහට ගේ අහගෙන අහගෙන ඇවිල්ලා තියෙනවා. ඉතින් අතන කෙලවරේ ඉඳන් ගෙවල් අහනකොට පොලිස් ජීප් එකක් ඇවිල්ලා මොන විදිහටද අනිත් අය තේරුම් ගන්නේ? ඔක්කොම අපිව දන්න කට්ටිය. නොදන්නා අය ඉන්නේ හරි පොඩි පිරිසක්. ඉතින් පොලිසියෙන් රෑ ඇවිල්ල ගියාම පහුවෙනිදා කඩේ ලඟට ගිහින් කියල මෙයාව මම ගෙදර ගෙනල්ල ඇඳ යට හංගන් ඉඳල ඇවිල්ල අරන් ගියා කියලා. ඒ කියන්නේ මෙයාට කොරෝනා. කොරෝනා එක්කෙනාව ගෙනියන්න ඇවිල්ලා තියෙන්නේ පොලිසියෙන්. ඊට පස්සේ තව කෙනෙක් කියල මගේ තාත්තව අරන් ගියා කියලා.

පොඩි දෙන්නගෙන් පොඩිම දුවව හරිම අමාරු උනා තියාගන්න. මෙයා යනකොට එයාගේ වයස දෙක හමාරයි. එයා මෙයාට හරිම එකතුයි මොකද දවල් කාලෙට මෙයත් එක්ක තමයි එයා හිටියේ. එහෙ ගිහින් එනකනුත් වීඩියෝ කෝල්ස් එහෙම ගන්නවා. ගොඩක් ඈත් උනේ නෑ. මෙයා එද්දිත් මං කරේ එයාව බලාගත්ත එක. මට හිතුණා මෙයා ගිහිල්ලා ඇගේ එල්ලෙයි කියලා. එච්චරටම හරි අමාරු උනා පාලනය කරලා තියාගන්න. මෙයා දොර අරින සද්දේ ඇහෙද්දීම දුවගෙන එනවා. දාහතරවෙනි දවසේ එලියට ආව ගමන් පැන්නා ඇඟට. එයා වඩාගන්නකන් අත දික්කරනකන් බලාගෙන හිටියේ. මෙයා බය වෙලා හිටියේ ටිකක්. මං කිව්වා පොඩ්ඩක් වඩා ගන්න කියලා. ඉස්සරලාම මෙයාගේ අටවෙනි දවස වගේ යනකොට මේ චූටි ඇඟිල්ලෙන්වත් පුලුවන්ද තාත්තව පොඩ්ඩක් අල්ලන්න කියලා අහනවා. මෙයා ඊට පස්සේ ගිහිල්ලා සැනිටයිසර් වලින් හොඳට අත හෝදගෙන ආවා. ඊට පස්සේ එයාගෙත් සැනිටයිසර් ගාල මං හෝදලා පොඩ්ඩක් ඇල්លුවා. ඊට පස්සේ ඇඟිල්ල පොඩ්ඩක් අල්ලලා හයියෙන් හිනා වෙවී දුවල ගිහින් ආපහු සැනිටයිසර් බෝතලෙන් අත හෝදගෙන අම්මා මම හොදගත්තා කියල කියනවා.

**කතාව ඉදිරිපත් කළේ :** ඉදුනිල් හිත්තැටිය | කොළඹ දිස්ත්‍රික්කය



## නැති අපට නැති - ඇති අයට ඇති ඔන්ලයින්

කෝවිඩ් වසංගතය නිසා වැඩියම පීඩා වින්දේ දුප්පත් අපි වාගේ මිනිස්සු. අපේ දරුවෝ දෙන්නාම ඉගෙනීමට හරිම දක්ෂයි. ඉස්කෝලවල ගුරුවරු අන්තර්ජාලය හරහා ඉගැන්වීම් කටයුතු කළා. ඒත් අපට දුරකථන, කොම්පියුටර, ටැබ් වාගේ පහසුකම් නැති නිසා දරුදෙන්නට මේ එකම පාඩමකටවත් සහභාගීවන්නට බැරි වුනා. වෙනදා වාගේ යාළුවෙකුගේ ගෙදරට ගිහිං වැඩ ටික ඉල්ලාගෙන ඇවිත් ගෙදරදි කරන්නවත් අවස්ථාවක් ලැබුනේ නැහැ මේ වසංගතයට හැමෝම බය වෙච්ච නිසා. ඉස්කෝලේ පටන් ගත්ත දවසක ගෙදර වැඩ නොකළට ගුරුවරුන්ගේ අපවාදයට ලක්වෙයි කියලා දරු දෙන්නා විසාල මානසික පීඩනයකින් පෙලෙනවා. අනේ අපිටත් ඔන්ලයින් යන්න තිබ්බා නං...

**කතාව ඉදිරිපත් කළේ :** සතීෂා කමේෂි | ගාල්ල දිස්ත්‍රිකය


නෙයිනා මොහොමඩ් නජීබා

## ඒ වෙලාවේ ඔක්කොම ඇඩුවේ පොඩිවුන් වාගේ.

මම නෙයිනා මොහොමඩ් නජීබා, කොවිඩ් ව්‍යසනය ඇති වෙන කොට මම හිටියේ කුවේට් රටේ. 2016 තමයි මම දෙවන වරට එරට ගියේ. මේ තත්වෙත් එක්ක අපි තානාපති කාර්යාලයෙන් ඉල්ලුවා අපිව ලංකාවට එවන්න කියලා. ඊට පස්සේ ගිය අප්‍රේල් 21 ඉඳලා කුවේට් සල්වා වල අපිව හුදකලා කරලා දින 21ක් තිබ්බා. කොහොමෙන් කොහොම හරි අපි මැයි 19 දා ලංකාවට පය තිබ්බා. ඒ ගුවන්යානයේ 481 දෙනෙක් ආවා අපේ රටට. ගුවන් තොටේදීම PCR පරීක්ෂණ කරලා අපිව කෙලින්ම චීන වරාය නිරෝධායන මධ්‍යස්ථානයට යැව්වා. ලංකාවට ඇවිල්ලත් පවුලෙ අය දකින්නේ නැතුව යන්න උන එක ගැන දැනුනේ පුදුම දුකක්.

අපි දින 35ක් විතර නිරෝධානය වෙනුවෙන් රදවා ගත්තා. විනාඩිගනණක දුර ඉදලත් පවුලේ අය දකින්නෙම නැතුව මැරෙන්න වෙයි කියලයි මට දැනුනේ. මේ අතරේ රාමසාන් උපවාසයත් යෙදිල තිබුනා. පුදුම දුකකින් මුල් දින ටික ගෙවුනේ. මේ කඳවුරේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලුම අය හිටියා. ටිකෙන් ටික අපි අතර සබදකමක් ඇති වුනා. ඒ සබදකම් ඇති නොවෙන්න අපි ඇවිදින මල මිනී වෙනවා. කවදාවත් ඒ මූණු අමතක වෙන්නෙ නෑ. අපි වෙන් වෙලා ගෙවල්වලට යවන කොට ඔක්කොම ඇඩුවේ පොඩිවුන් වාගේ.

**කතාව ඉදිරිපත් කළේ :** නෙයිනා මොහොමඩ් නජීබා I ත්‍රිකුණාමලය


උවනේෂ්වරී

# මූණ බල බල සල්ලි බෙදුවේ

මගේ නම රාජවේලු උවනේෂ්වරී. අපි පදිංචිවෙලා ඉන්නේ මාතලේ දිස්ත්‍රිකයේ රත්තොට ප්‍රදේශයේ හරංකන්ද ගමේ හුණුගල වත්තේ ඉහල කොටසේ. අපි ජීවත් වෙන්නේ හුණුගල වත්තේ ලයින් කාමරයක. අපේ ගෙදර 10X10 පුංචි කාමරයක්. අපි හය දෙනෙක් ජීවත් වෙන්නේ ඔය කාමරේ අස්සේ.

මගේ මහත්තයා සුබ්‍රමානියම් කනගරාජ්. එයා කළේ කුලී වැඩ. අපිට දරුවන් හතරදෙනෙක් ඉන්නවා. මමත් ළමයි හතර දෙනෙක්ම බලාගන්න තියෙන නිසා වැඩට යන්නේ නැහැ.

කෝවිඩ් වසංගතයත් එක්කම එයා වැඩ කරපු කඩේ වැහුවා. එයා එනකොට රුපියල් පන්දහක් අරං ආවා. අවාසනාවට එයාව අසනීප වුනා. ඉස්පිරිතාලේ ගියාම පරීක්ෂණ වාගයක් පිටින් කරගන්න කිව්වා. ඒ ටිකට රුපියල් තුන්දස් පන්සීයක් ගියා. ඉතිරි සල්ලි වලින් හාල් කිලෝ පහක් අරගෙන ගෙදර ආවා. අපේ ග්‍රාමසේවක මහත්තයා බෙදපු හාල් කිලෝ පහකුත් හම්බ වුනා. එච්චරමයි අපිට හම්බුනේ.

වත්තේ ගොඩාක් අයට වරින් වර වියලි ආහාර වර්ග බෙදුවා. ඒ වුනාට අපිට දුන්නේ නැහැ. ඒක දේශපාලන පලිගැනීමක්. මේ පැත්තේ දේශපාලන පලිගැනීම් එමටයි. ආන්ඩුවෙන් දීපු පන්දහ ගන්න ගිය දවසේ ලොකු රණ්ඩුවක් වුනා. මිනිස්සුන්ගේ මූණ බල බල තමයි සල්ලි බෙදුවේ. කොහොම හරි වාසනාවට අන්තිමේ නිළධාරීන් තීරණයක් අරං දේශපාලකයෝ එලවලා පිළිවෙලට සල්ලි ටික බෙදුවා. මටත් මාස දෙකක සල්ලි හම්බවුනා.

ඒ වුනාට අපි හය දෙනෙක්ගේ බඩ පුරවගන්න ඒ සල්ලි ප්‍රමාණවත් නැහැ. අපි දෙන්නත් දරුවෝ හතර දෙනාත් බඩගින්නේ හිටපු දවස් අනන්තයි. මේ කාලේ තමයි සාමාන්‍යයෙන් වතුවල කරාඹු කඩන්නේ. කුලියක් කරලා කීයක් හරි හොයාගන්න කියලා වතුවල වැඩට ගියා. එ වුනාට ඇඳිරි නීතිය නිසා නිසි වෙළඳ පොලක් නැහැ කියලා අපට නියමිත කුලී හම්බ වුනේ නැහැ. දැන් අපි කබලෙන් ලිපට. අතමාරුවක් ඉල්ලා ගන්න ගියාට කවුරුවත්ම අපට උපකාරයක් කළේ නැහැ. ඒකට දෙස් කියන්නත් බැහැ. කුලී වැඩ කරලා එද වේල හොයාගන්නා අපි කෙරේ විශ්වාසය තියන්න කවුරු වුනත් මැලි වෙනවා. කොහොම හරි බැගෑපත් වෙලා පොඩි පොඩි ගනන් ණයට ගත්තා. දැන් අපිව හොයාගෙන ණය දීපු මිනිස්සු ගෙදරට එනවා. විලි ලැජ්ජාවේ බැහැ. දුප්පත් වුනත් අපිටත් ආත්ම ගරුත්වයක් තියෙන්න ඕනේ. මහත්තයාට රස්සාවට යන්ඩත් නැහැ.

දරුවෝ හතර දෙනෙක් නිසා මට කොහොමටවත් රස්සාවකට යන්ඩ බැහැ. අන්තිමේ අපි රටට ණයකාරයෝ වෙලා.

**කතාව ඉදිරිපත් කළේ :** ජී එච් එන් එන් ද සිල්වා | මාතලේ දිස්ත්‍රික්කය



# වැව් ඉස්මත්තේ තනිවූ සුසුමන්

ලංකාවේ ජීවත්වන තෙළිඟු ජනතාවගේ ඉතිහාසය වසර සිය ගණනක් ඈතට දිවයනවා. අහිකුණ්ටිකයින් ලෙස හැඳින්වෙන මේ ප්‍රජාව, ගනනින් හාරදාහක් විතර. ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයෙන් මෙරටට සංක්‍රමණය වූ මොවුන් තෙළිඟු භාෂාවෙන් බිඳී ආ උප භාෂාවක් කතා කරන්නේ. නමුත් අද වනවිට මොවුන් සියළු දෙනාම පාහේ සිංහල භාෂාව චතුර ලෙස හසුරනවා. පරම්පරා ගනනාවක්ම ඔවුන් මුදල් ඉපැයුවේ සාම්ප්‍රදායික නොවන රැකියාවන්හි යෙදෙමින්. බහුතරයක් පිරිමි රැකියාවට කරන්නේ ගෙවල් ගානේ ගිහිං නයි, රිලව්, පිඹුරන් නටවන එක. කාන්තාවන් සාස්තර කියනවා. සමහරු කතුරු මුවත් තියනවා, හිරමන පීරිගානවා, හඳුන්කූරු විකුනනවා. තවත් සමහරු කුලී වැඩ කරනවා. ඔවුන්ට නිශ්චිත පදිංචියක් නැහැ. විටෙක සතියක් දෙකක්, තවත් විටෙක මාසයක් දෙකක් එළිමහනක කඳවුරු බැද ගන්නා මොවුන් ඒ ප්‍රදේශය පුරා ඇවිදිමින් ජීවිකාව කරනවා. අනතුරුව එතැනින් තව තැනකට. එතැනින්  තවත් තැනකට. කුරා කුහුඹුවෙකුටවත් හිංසාවක් පීඩාවක් නොකරන මේ මිනිසුන්ගෙන් එක් කණ්ඩායමක් කෝවිඩ් වසංගත වෙලාවේ හිටියේ අනුරාධපුර දිස්ත්‍රිකයේ කලාවැව් ඉස්මත්තේ බලලුවැව ගමේ.

### වේලාමාණික්කම් සුරේෂ්

කොරෝනා කාලේ අපේ කණ්ඩායමේ කට්ටිය පහලොවක් විතර හිටියා. ඒ වෙලාවේ තුන් වේල නෙවෙයි එක වේලක්වත් කන්ඩ නැති දවස් තිබුනා. කවුරුවත්ම අපි දිහා බැලුවේ නැහැ. අපි කෑවද බිව්වද කියලා හෙව්වේ නැහැ. අහිංකුණ්ටිකයින් වුනත් අපිත් මේ රටේ මිනිස්සු. ගමේ මිනිස්සු අපිව ප්‍රතික්ෂේප කළා. අපිට ගෙවල් වල වැඩ නැතිවුනා. අපිව දකිනකොට සමහරු ගෙවල්වල දොරවල් වහ ගත්තා. හරියටම අපි කෝවිඩ් වැළදුනු අය විදියට තමයි සැලකුවේ.

### රිස්කානා

අපි ගෙවල් වලටම කොටුවුනා. මට අත දරුවෙක් ඉන්නවා. තව අවුරුදු තුනක පුතෙකුත් ඉන්නවා. මට නං වතුර හරි බීලා ඉන්න පුළුවනී. නමුත් මං දරුවට කිරි දෙන්න ඕනේ. අපි බොහෝමයක් වේල් පිරිමහගත්තේ වැවෙන් අල්ලපු මාළු ලුණු දලා තම්බලා කාලා.

### වේලාමාණික්කම් සුරේෂ්

අපි වැවේ මාළු ඇල්ලුවා. ඒ වුනාට අල්ලපු මාළු විකුණා ගන්නට අපි හරි මහන්සියක් ගත්තා. පොලීසිය ගෙන් ගෙට ගිහිං මාළු විකුනන්න අවසර දුන්නේ බයිසිකල් තිබ්බ අයට විතරයි. අපට කොයින්ද බයිසිකල්. අපි අල්ලපු මාළු පාරේ තියාගෙන හිටියා. බයිසිකල්වලින් ආපු මුදලාලිලා අපේ මාළු ගත්තේ කුණු කොල්ලෙට.

**එස් එම් හනීෆා**

මං මේ ප්‍රදේශයේ ජීවත් වෙන වෙළඳසැල් හිමියෙක්. මේ අය මේ පළාතට ආව දවසේම වාගේ ඉඳලා මගේ කඩෙං තමයි බඩු ගත්තේ. කෝවිඩ් ලොක්ඩවුන් එක කාලේ ඒ ගොල්ලෝ ඇවිත් උදව් ඉල්ලුවා. ඒ වුනාට ඉතිං කොච්චරක් කියලා ණයට දෙන්නද? අනෙක මේ ගොල්ලෝ අද මෙතන හෙට තව තැනක. ස්ථිර පදිංචියක් තිබ්බා නං බය නැතිව දෙන්න තිබුනා. ඒ වුනත් දරුවන්ව බඩගින්නේ තියන්නේ කොහොමද? ඒ ළමයින්ගේ මූණු බලාගෙන මං කොහොමද බඩු නොදී අරින්නේ. මං කිව්වා තරහා නැතිව අයි ඩී කාඩ් එක උගසට තියලා බඩු අරං යන්න කියලා. බැලූ බැල්මට ඒක ටිකක් අමානුෂිකයි තමයි. ඒ වුනත් මං කියලා මොනවා කරන්නද? මං ඒ කාලේ මේ අයට රුපියල් 45,000 ක විතර බඩු ණයට දීලා තියෙනවා. ඒවා ආයිමත් කවදෘ හම්බවෙයිද කියලා විශ්වාසයක් නැහැ.

**හරිෂ්චන්ද්‍රරන්**

ආණ්ඩුවෙන් මුළු රටේම මිනිස්සුන්ට පන්දහ දුන්නා. ඒත් අපිට හම්බ වුනේ නැහැ. අද වෙනකලුත් හම්බ වෙලා නැහැ. දැං අපි මෙහේ මාස තුනක් හිටියා. අපිට ආණ්ඩුවේ මහත්තුරු ඇවිත් මේ ඉන්න තැනින් පිට වෙන්න කියලා අන කළා. ඒත් මේ වසංගතේ අස්සේ අපි කොහේ කියලා යන්නද?. අපිත් මේ රටේ මිනිස්සු මහත්තයා. අපිත් මේ රටේ මිනිස්සු.

**කතාව ඉදිරිපත් කළේ :** සුලෝචනා වීරසිංහ

# කෝවිඩ් කාලේ මීගමු ආලේ

2019 පාස්කු ඉරිදා යෙදුනේ අප්‍රියෙල් 21 වැනිදාට. ඒ අවාසනාවන්ත දිනයේ ශ්‍රී ලංකාවේ කතෝලික පල්ලි තුනක් සහ කොළඹ සුඛෝපභෝගී හෝටල් තුනක් ජාතික තව්හීත් ජමාත් අන්තවාදී සංවිධානයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ දරුණු ප්‍රහාරයකට ලක්වුනා. විදේශිකයන් 45 ක්, පොලිස් නිලධාරීන් තිදෙනෙකු සහ බෝම්බකරුවන් අට දෙනෙකු ඇතුළු පුද්ගලයින් 267 දෙනෙකු මියගියා. අවම වශයෙන් පන්සීයක පමණ පිරිසක් තුවාල ලැබුවා. මෙසේ ප්‍රහාරයට ලක්වූ එක් පල්ලියක් පිහිටා තිබුනේ මීගමුවේ. මේ අවාසනාවන්ත සිදුවීමෙන් අනතුරුව මීගමුව ප්‍රදේශයේ ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ප්‍රජාව අතර සමගිය පළුදු වුනා. තැනින් තැනින් පුංචි පුංචි සිදුවීම් වාර්තා වුවත් රජයේ සහ සාම ක්‍රියාධරයින්ගේ කැපවීමට පින් සිදුවන්නට මේ සිදුවීම් දුරදිග යන්නට නොදී උපන් ගෙයිම සමනය කරගන්නට හැකිවුනා.

මම මව්ලව් මොහොමඩ් සල්මන්. මම තමයි මීගමුවේ නගරය මැද්දේ පල්ලියේ ප්‍රධාන පූජක තුමා. ඒ වගේම මීගමුවේ මහ පල්ලියේ දායක සභාවේත් මම ඉන්නවා. හොඳ දෙයක් වෙනව නම් කවුරු කළත් අපි ඒකට මැදිහත් වෙලා උදව් කරනවා කියන හැඟීමෙන් තමයි ඉන්නේ.

කෝවිඩ් වසංගතය පැතිරෙන්න ගත් වෙලාවේ අපේ ප්‍රදේශයේ හැමෝම වාගේ අපහසුවට පත්වුනා. දුප්පත් පෝසත් බේදයෙන් තොරව මේ ප්‍රශ්නයට මුහුණ දුන්නා. ඒ වෙලාවේ මුස්ලිම් සමාජයේ අපි එකතු වුනා. අපි තීරණයකට ආවා ප්‍රදේශයේ අනෙක් ආගමික නායකයින්වත් සහභාගි කරගෙන මේ අහිංසක මිනිසුන්ට උපකාරයක් වෙන්න ඕනේ කියලා. මේ රටම ආපදාවට ලක්වූ මොහොතක්. අපට සිංහල, දෙමළ, මුස්ලිම් කියලා බේද බින්න වෙලා ප්‍රශ්නවලට උත්තර හොයන්න වෙලාවක් ඇත්තෙත් නැහැ. ඒකයි අපි සේරම එක්කාසු වෙලා විසඳුම් හොයන්න තීරණය කළේ.

අපි දන්න අඳුනන ධනවතුන් ඉන්නවා, ව්‍යාපාරිකයෝ ඉන්නවා, සමාජ සත්කාරක කටයුතු මනාව සංවිධානය කරන්න දැනුම තියෙන පිරිස ඉන්නවා. මේ හැමෝටම අපි පොඩි දැනුම්දීමක් කළා මේ වෙලාවේ අපි එකතු වෙලා මේ සද්කාර්යය කරමු නේද කියලා. ගිය අවුරුද්දේ පාස්කු බෝම්බ සිද්ධිය වෙලා අපි අතරේ සිදුවෙච්ච හිත් රිදීම් සමනය කරගන්නත් මේක හොඳ අවස්ථාක් කියලා තමයි අපේ කට්ටිය හැමෝම හිතුවේ. අපට පුදුමාකාර ප්‍රතිචාරයක් ලැබුනේ. මේ රටේ විතරක් නෙවෙයි, විදේශ රටවල ඉන්න අපේ යාළු මිත්‍රයොත් මුදලින් ආධාර කළා. ඒ සියළුම මුදල් ආධාර එක සතයක් එහේ මෙහේ වෙන්න නොදී ඉතා සීරුමාරුවට වියදම් කළා. සම්පූර්ණ විනිවිදබාවය රැකගෙන තමයි මුදල් වියදම් කළේ.

ලැබුන හැම රුපියලක්ම වියදම් කළ ආකාරය ඉතා පිළිවෙලට ගිණුම් ගතකරලා වට්ස්ඇප් හරහා ජනගත කළා හැමෝටම පේන්න.

මීගමුවේ ඉන්න කතෝලික, ක්‍රිස්තියානි සහ බෞද්ධ ජනතාවටත් ආගමික සිද්ධස්ථාන මාර්ගයෙන් උදව් කරන්න ඕන කියල අපි සාකච්ඡාවක් තිබ්බා. අපි මහ වීදිය සහ දළුපත පල්ලි වලට ගියා. ඒ වගේම අපි අගුරුකාරමුල්ල පොඩි පන්සලට සහ ලොකු පන්සලට ගිහිං වියලි ආහාර භාර දුන්නා. ආධාර අවශ්‍ය පවුල් තෝරාගෙන වියලි සලාක බෙදන කටයුත්ත ඔබවහන්සේලාම කරන්න කියලා ඉල්ලීමක් කළා.

අපි මීගමුව පොලිසියටත් ගියා. පොලීසියේ එස් අයි මහත්තයා අපි ගිය හැම තැනකටම ඇවිත් විශාල සහයෝගයක් දුන්නා. අපි හිතුවා පොලීසියේ නිළධාරී මහත්ම මහත්මීන්ටත් උපකාර කරන්න ඕනේ කියලා. අපි ඒ අයටත් වියලි ආහාර මල්ලක් බැගින් පරිත්‍යාග කළා.

මේ කටයුත්තට අපේ මුස්ලිම් සහෝදරවරු ඔක්කොම වාගේ උදව් කලා. ඒ ගොල්ලන්ගේ වාහන, අනෙක් සම්පත් අපිට දිල සහයෝගය දැක්වුවා. ඒ නිසා තමයි අපිට මේ වැඩේ සාර්ථකව කරගන්න පුළුවන් වුනේ. අපි හින්දු ජනතාවටත් උදව් කලා. ඒ අය අපිට පින් දුන්නා. අපිට සුවසෙතත් දීර්ඝායුෂත් ප්‍රාර්ථනා කළා. අපි බලාපොරොත්තු වුනෙත් මේ කටයුත්ත තුලින් පාස්කු ප්‍රහාරය නිසා අපි අතරේ පළුදු වුනු සමගිය නැවත ගොඩනගා ගන්නා එක තමයි. දැන් අපි ආයිමත් එක පවුලක්.

**කතාව ඉදිරිපත් කළේ :** ත්‍යාග චන්දන | ගම්පහ දිස්ත්‍රික්කය



# ATM හුටපටේ

හරි වැඩක් මට උනේ.

ඔන්න අප්‍රේල් විස්සට කිට්ටු දවසක නේවි එකේ වැලිසර කඳවුරෙන් කෝවිඩ් හැදිච්ච කට්ටියක් අහුවුනා. දැනං හිටපු නැති නිසා මේ අය නිවාඩු ඇරියා. කට්ටිය රට වටේ විසිරුනා. එක්කෙනෙක් තංගල්ලටත් ඇවිත් තිබුනා. ඒ ආපු වෙලාවේ තංගල්ලේ ලංකා බැංකුවේ ATM එකකින් සල්ලි අරං. මං දන්නෑනේ ඔය විත්තියක්. මමත් සල්ලි අරං තියෙන්නේ ඒ ATM එකෙන්මයි. ඒ බැංකුවෙන් සල්ලි ගත්තු අයගේ නංගං ප්‍රසිද්ධ කළා. මෙන්න බොලේ මගේ නමයි එඩ්රස් එකයි ඒ ලිස්ට් එකේ. විදුලි වේගෙන් ඒ ලිස්ට් එක මූණු පොතෙයි, වට්ස්ඇප් වලයි හැම තැනම සැරිසරන්න ගත්තා. මංව අඳුන ගත්තු යාළුවෝ හිටු කියලා මට කථා කරන්න පටන් ගත්තා. අවවාද අනුසාසනා කන පිරෙන්ඩ. ගමේ වයසක මිනිස්සු මාව හරියටම වසංගතේ වාගේ කොන් කරා. කිසිම කෙනෙක් ගේ පැත්ත පලාතේ එන්නැතුව ඇරියා. කෑම ටිකක් ගන්නවත් එලියට පහලියට යන්න බැරිවුනා. ඔය අතරේ හැමදම වාගේ PHI මහත්තුරු ගෙදරට ආවා ගියා. පොලීසියෙන් කෝල් කළා. මං මානසිකව වැටුනා බිංදුවට. ඔන්න දැන් දවස් දහතර ඉවර වුනා. මම නිරෝධායනය වෙලා ලෙඩෙක් නොවන වගට සහතිකෙත් හම්බවුනා. මම ගොවිතැනින් ජීවත් වෙන මනුස්සයෙක්. කොරටුවට යනකොට මගේ වගා කටයුතු සේරම විනාසයි. පපුව හෝස් ගාලා පත්තු වුනා. ඊටත් වඩා පපුව පත්තු වුනේ ගමේ මිනිස්සු මාව කොන් කරනවා කියලා දැන ගත්තම. යාළු මිත්‍රයෝ, නෑදෑයෝ, ගමේ මිනිස්සු, සේරම මංව අතඇරියා. හරියටම මං මහා විසාල අපරාධකාරයෙක් වාගේ මගහැරියා. දැං කෝවිඩ් ඉවරයි. හැබැයි මේ හුටපටේ නිසා මං හොඳ පාඩමක් ඉගෙන ගත්තා. දැන් ආයිමත් අළුත් පැල දළු දනකල් බලා ඉන්නවා.

**කතාව ඉදිරිපත් කළේ :** ආර් එච් කේ ධීරසිංහ ද සොයිසා | හම්බන්තොට දිස්ත්‍රික්කය



# කථා වලින් ඔද්දල් හිත

අපේ කථා නායිකාවගේ නම අරුණි. රැකියාව පෞද්ගලික ආයතනයක. ඇඳිරි නීතිය වැටෙන්නට සතියකට විතර ඉස්සර අරුණි වැඩමුළුවකටත් සහභාගී වෙනවා. හරියටම ඊට පහුවදා අරුණිගේ නාසයෙන් හොටු දියර ගලනවා. අරුණිට කොහොමත් පීනස් අමාරුවක් තිබුන නිසා ගෙදර අයට නං මේක සාමාන්‍ය තත්වයක්. ඒ වුනාට මේ වතාවේ කට්ටියම පෙර නොවූ විරූ ලෙස බය වෙනවා. ජනමාධ්‍ය වලින් කෝවිඩ් ගැන අහන දකින හැම වෙලාවකම අරුණිගේ හිත භ්‍රාන්තියෙන් පිරෙනවා. ඔන්න අරුණිගේ කාර්යාලීය මිතුරියක් කියනවා, එයාගේ උගුර රිදෙන්න ගත්තා කියලා. එයාගේ කොම්පැනියේ ලොක්කා කියනවා, දැන් දවස් දෙකක වෙලේ ඉඳලා ඇග රිදෙනවා කියලා. මේ හැම ප්‍රවෘත්තියකින්ම අරුණිගේ මනස ඔද්දල් වෙනවා. අරුණි ගෙදර ඇවිත් කෝවිඩ් ගැන සමාජ මාධ්‍යවල පළවුනු හැම ප්‍රවෘත්තියක්ම හාරා අවුස්සා බලනවා.

ඔන්න දැං ඇඳිරි නීතිය පැනවෙනවා. අරුණිගේ මානසික ව්‍යාධිය එන්න එන්නම දරුණු වෙනවා. ගෙදර පයිප්ප කරාම, දොර අගුල් වාගේ නිතර අතපත ගෑවෙන, ඇස ගැටෙන හැම වස්තුවක්ම සබන් දලා හෝදන්න ගත්තා. ගැලුම් කීයක් නං කොත්තමල්ලි බීවද දෙයියෝ තමා දන්නේ. අරුණිට හැමෝවම සැකයි. ගෙදරට යන එන වෙළෙන්දන් පවා සැකයි. තමන්ට කෝවිඩ් වැළඳී ඇති බවත්, තම ගමේ ප්‍රථම කෝවිඩ් ආසාධිතයා ඇය නිසා, ගමේ මිනිස්සු ගෙදරට ගල් ගහයි කියලත් භය වෙනවා. අරුණි තොරතෝංචියක් නැතිව දොඩවනවා.

දැං අරුණිගේ හිත හොඳටම අවුල් වෙලා. කොහොම පහදලා දෙන්න ගියත් අරුණි නෙවෙයි ඇහුම්කන් දෙන්නේ. වෙනත් විකල්පයක් ඇත්තේම නැති තැන අරුණිගේ තාත්තා දුවව දොස්තර කෙනෙක් ළඟට කැන්දං යනවා. මේක ගනන් නොගත යුතු තරමේ රෝගී තත්ත්වයක් කියලා දොස්තර කිව්වට අරුණිට විශ්වාස නැහැ. දැං ඔන්න උගුර හිරවෙනවා කියනවා. කෑම උගුරෙන් පහලට යන්නේ නැහැ කියනවා. බෙහෙත් බොන්න රුචියක් නැහැ කියනවා. හුස්ම ගන්න අමාරුයි කියනවා. ලෙඩ ගොඩයි. පහුවදා උදෙන්ම අරුණි රජයේ රෝහලට ඇතුල් වෙලා බලහත්කාරයෙන්ම PCR පරීක්ෂණයක් කරගන්නවා. පරීක්ෂණ වාර්තාව එන තෙක් ඇයව දින දෙකක් රෝහලේ නතර කරගන්නවා. ඔය අතරේ තමයි බණ්ඩාරගමින් කෝවිඩ් අසාදිතයින් දෙන්නෙක් හමුවෙන්නේ. ඒ රෝගීන් දෙදෙනාවත් ගේන්නේ මේ රෝහලටමයි. දවස් දෙකකට පස්සේ අරුණිගේ වාර්තාව හම්බවෙනවා. එයා කෝවිඩ් රෝගියෙක් නෙවෙයි කියලා තීරණය කරනවා. අරුණි ගෙදර එනවා. මානසික ආතතිය උග්‍ර වීම නිසා කරගත්තු බැරෑරුම් කටයුත්තේ ප්‍රතිවිපාක විඳින්න වෙන්නේ මෙතැන් සිට. ඔන්න ප්‍රදේශය බාර PHI මහත්තයා ඇවිත් ප්‍රශ්න කරනවා ඇයි PCR එකක් කරගත්තේ කියලා. මුළු ගෙදරම කට්ටියට දින දහතරක් ස්වයං නිරෝධායනයේ යෙදෙන ලෙස අන කරනවා. අරුණිගේ තත්වය උග්‍ර වෙනවා. බණ්ඩාරගම රෝගීන්ගෙන් තමන්ටත් බෝවුනා කියලා වැලහින්නක් වාගේ කම්පා වෙන්න ගන්නවා. තමන් කළ මෝඩ වැඩේ පිළිබඳව දුක්වෙනවා. ඔන්න දැන් වෙන වෙන රෝග ලක්ෂණත් පෙන්නුම් කරනවා.

දින දහතර විසි එකක් වෙනවා. විසි එක තිහක් වෙනවා. අරුණිට හොඳවෙන පාටක් නැහැ. ප්‍රවෘත්ති අහන ඇහෙන හැම වතාවකම අරුණි මානසික ආතතියේ පතුලේ ගිලෙනවා.

ටිකෙන් ටික කෝවිඩ් භීතිය සමාජයෙන් තුරන් වෙන්නට ගන්නවා. හෙමි හෙමින් අරුණිට යථා තත්ත්වය තේරුම් යනවා. කන්තෝරුවේ රාජකාරි නැවත ආරම්භ වෙනවා. අරුණි යනවා වැඩිහිටි නිවාස වලට ආහාර සලාක බෙදන්න. දැං කෝවිඩ් හමාරයි. අරුණිට හොඳයි.

**කතාව ඉදිරිපත් කළේ :** සචිත නන්දජිත් | කළුතර දිස්ත්‍රික්කය

# අනේ අපේ නැන්දා කොහි ගියාදේ

මේ කෝවිඩ් වසංගතේ නිසා වැඩියම අපහසුවට පත්වුනේ අපි වාගේ මධ්‍යම පාංතික පුංචි මිනිස්සු. අපට ලොකු අතු අල්ලන්න හයියක් නැහැ. අපි වෙනුවෙන් කථා කරන්නට කවුරුවත්ම ඉදිරිපත් වුනෙත් නැහැ. අපිට එහෙම වුනාට අපි හොඳටම දන්නවා, යමක් කමක් කරකියා ගන්න පුළුවන් මිනිස්සු ලේසියෙන්ම තම තමන්ගේ ඕනෑ එපාකම් එක දුරකථන ඇමතුමෙන් සරිකර ගත්තා කියලා. හැබැයි පුංචි අපේ කථා කොයිතරම් සාධාරණ වුනත්, සානුකම්පිත වුනත් කවුරුවත්ම අපිට ඇහුම්කන් දෙන්න ඉදිරිපත් නොවීම හරිම අවාසනාවක්. අපේම ආර්ථික මට්ටමේ, අපේම පංතියේ මිනිස්සු අපට සංවේදී නොවීම ඊටත් වඩා අවාසනාවක්.

ඩබ්ලිව් ඩබ්ලිව් එස් එච් ප්‍රනාන්දු කියන්නේ මගේ ඥාති සහෝදරියක්. ඈය 2019 අවුරුද්දේ බයිපාස් හදවත් සැත්කමකට භාජනය වූවා. 2020 අප්‍රේල් පහලොස් වැනිදා ඈය යම් සංකූලතාවයක් පෙන්නුම් කළා. දැං මොකද කරන්නේ. ඈයව රෝහලකට ගෙනියන්න ඕනේ. හැබැයි ඇඳිරිනීති අවසරපතක් නැතිව එළියට බහින්නත් බැහැ. කොහොමහරි අපේ ග්‍රාමසේවක මහත්තයාව අල්ලා ගෙන රෝගී තත්වය පිළිබඳව සහතිකයක් ගත්තා. ඒකත් අරං ගියා මහජන සෞඛ්‍ය පරීක්ෂකව හොයාගෙන. එතැනින් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයට. එතැනින් පොලීසියට. ග්‍රාමසේවක මහත්තයාව ලේසියෙන් අල්ලා ගත්තට අනිත් හැමෝම මේ වසංගත තත්ත්වය යටතේ කාර්ය බහුලව සිටියා. ඒ නිසාම අපේ ලෙඩාට කොච්චර අමාරු වුනත් කලට වේලාවට ඉස්පිරිතාලෙට එක්ක යන්න බැරිවුනා. උදේ පාන්දර අමාරු වෙච්ච ලෙඩාව අවසර පත්‍ර ටික හදාගෙන හලාවත ඉස්පිරිතාලෙට ඇතුලත් කරන කොට වෙලාව පරක්කුයි.

තත්ත්වය එන්න එන්නම නරක අතට හැරෙන කොට වහාම ශෛල්‍යකර්මයක් කරන්න ඕනේ කියලා ලෙඩාව හලාවතින් කොළඹට මාරු කළා. රෝගියාගේ තත්ත්වය විනාඩියෙන් විනාඩියට නරක අතට හැරෙමින් තිබුනු නිසා, අපි බලාපොරොත්තු වුනා කොළඹට ගෙනිච්ච ගමන් ශෛල්‍යාගාරයට ඇතුලත් කරගනීවි කියලා. ඒ වුනාට එහෙම වුනේ නැහැ. ඉස්සරලා PCR පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල එනතුරු ලෙඩාව ශෛල්‍යකර්මයට බාරගන්න බැහැ කිව්වා. අනේ අවාසනාවක මහත. පරීක්ෂණ වාර්තාව පමා වෙනකොට ලෙඩා සදහටම මෙලොව හැරගියා. ලෙඩා මියයන කොට වෙලාව පාන්දර එකහමාරයි. විශ්වාස කරන්න, පාන්දර හය වෙනකොට ඇඳිරිනීති අවසර පත්‍රය හදලා දුන්නා මිනියේ කටයුතු ඉක්මන් කරන්න කියලා. ඒ තරම්ම වේගයෙන් ලෙඩා ජීවත්වෙලා ඉන්දැද්දි එයාව ඉස්පිරිතාලේ ගෙනියන්නටත් අවසර පත්‍ර හදලා දුන්නානම්, අපේ නැන්දාට මෙවැනි අකල් මරණයකට ගොදුරු වෙන්න සිද්ධ වෙන්නේ නෑ කියලා හිතෙනකොට විසාල කම්පාවකින් හිත පිරෙනවා.

**කතාව ඉදිරිපත් කළේ :** ඩබ්ලිව්. එස්. ක්වින්ටස් තිසේරා | පුත්තලම දිස්ත්‍රික්කය

# වඳින්න ගිය දේවාලේ හිසේ කඩා වැටීම

මම ඔරුගොඩවත්ත මජිඩ් ප්ලෙස් එකේ ජීවත් වෙන මොහොමඩ් ලාෆීර්. මම සමාජ සේවයට කැමතියි. මට සල්ලි නෑ. හැබැයි පුළුවන් හැම වෙලාවෙදිම කාටවුනත් උදව් කරනවා. කෝවිඩ් කාලේ ලෙඩෙක් එක්ක ගෙන ගියා. මහරගම පිළිකා රෝහලට එක්කන් ගියා. හරිම දුප්පත් මනුස්සයෙක්. ලියුකේමියාව හැදිලා. එයාගේ බෑනායි මායි තමයි එක්කන් ගියේ. හරියටම පිළිකා රෝහල ඉස්සරහ පිටදිම මගේ ත්‍රී වීල් එකේ ක්ලච් කෙබල් එක කැඩුනා. මට වාහනය හදා ගන්නත් අතේ සල්ලි නෑ. ඒත් මම මගේ දහිරිය අත හැරියේ නෑ. ලෙඩාව ඉස්සරහ ගෙට්ටුවෙන් ගන්න බෑ කිව්වම පිටිපස්සේ ගේට්ටුවෙන් ගිහිං ඇතුල් කළා.

එයාව කොරෝනාවලට චෙක් කරලා උණ කියලා අංගොඩ උණ රෝහලට මාරු කරලා. මෙන්න දවස් තුනකට පස්සේ කෝල් එකක් එනව අංගොඩ උණ රෝහලෙන්. "ඔයා අරං ගිය ලෙඩා කොරෝනා පොසිටිව්. ගෙදර කට්ටිය ඔක්කෝම ලෑස්ති වෙන්න කොරන්ටයින් වලට යන්න" කියලා. ටික වෙලාවක් යනකොට PHI මහත්තුරුයි මාධ්‍යකාරයොයි, පොලිසියයි අපේ ගේ වටකරගෙන. ලෙඩාගේ රියාල් නානගේ ගෙදරින් දොලොස් දෙනයි. අපේ ගෙදරින් නව දෙනයි. පොඩි දරු පැටවු හිටන් ඔක්කොම එක්ක යන්නයි යන්නේ. අපේ ආබාධිත ආච්චි කෙනෙක් හිටියා. මං PHI මහත්තුරුන්ට කිව්වා ආච්චිව ගෙදර නිරෝධායනයට තියලා අපි විතරක් එක්ක යන්න කියලා. නෑ නෑ නෑ පැය 24 න් ලෑස්ති වෙන්ඩ කිව්වා. ඊට පස්සේ බස් එකක් ගෙනල්ල පයින් අරන් ගියා මහ පාරට. එතකොට අපේ ගමේ ඉන්න මිනිස්සු මහ අමුතු විදියට, ඒ කියන්නෙ මේ ඩ්‍රග්ස් පාවිච්චි කරන කුඩු මත්ද්‍රව්‍ය කාරයෝ දිහා බලනවා වාගේ නිකන් අමුතු විදියට තමා අපි දිහා බැලුවේ. අපිව පාරට අරන් ගියා. පාරට අරං යනකල් ගෙවල් වල අය අපිව විවේචනය කළා. හරියටම හොරෙක් විදියට තමයි මාව අරගෙන ගියේ. අපිව ඔරුගොඩ වත්තේ පාලම යට පැය තුනක් විතර තියාගෙන ඉඳලා තමයි ගමන පටං ගත්තේ. වතුර බෝතලයක් වත් නෑ අපිට බොන්ඩ. ඊට පස්සෙ අපිව අරගෙන ගියා දඹුල්ලට. දඹුල්ල හමුදා කෑම්ප් එක ළඟදි රෝල්ස් එකකුයි වතුර බෝතලේකුයි දුන්නා. එතකොට හරියට හවස පහට විතර ඇති. රෑ දහයට විතර ඇති වැලිකන්ද පූනානි කෑම්ප් එකට ඇතුල් කරනකොට. එතනදි බත් පාර්සලයකුයි වතුර බෝතලේකුයි දුන්නා. ඒක තමයි අපිට හම්බ වුන ආහාරය.

හැබැයි අපරාදේ කියන්න බෑ පූනානි ගියාට පස්සේ නං හොඳට සැලකුවා. හමුදාවෙන් තමයි බලා ගත්තේ. ඊට පස්සෙ දවස් නමයකින් පීසීආර් පරීක්ෂණයක් කරා. ඒකෙන් කවුරුත් පොසිටිව් නෑ. නෙගටිව්. ඇත්තටම ඊට පස්සෙ තමයි අපිට පොඩ්ඩක් ඇඟට පණ ආවේ. මොකද අපි කොරෝනා කියන එක ඇතුලින් දැකලා නෑ. ඇස්වලින් දැකලත් නෑ. කොරෝන කියන්නේ මොකක්ද කියලා අපි දන්නෙත් නෑ. මොකද අපි කාමරේ ඇතුලට වෙලා හිටියේ. අපි දෙයියොන් ගෙන් තමා උදවු ඉල්ලුවේ. දෙයියෝ තමයි අපිව බේරන්න ඕන. නැත්නම් අපිට වෙන කවුරුත් නෑ කියල.

ඒ වෙලාවේ අපි මරණ මොහොතේ වගේ තමයි හිටියේ. මොකද අපි හිටියේ ඒ තරම් බයෙන්. මම මේ ලෙඩෙක්ට උදවු කරන්න ගිහිල්ල මගේ දරුවොයි පවුලේ අයයි ඔක්කෝම හිර ගේ ඇතුලේ වැටුනා නේද කියලා හිතුනා. හරියට දවස් දාහතරක්ම අපිට රෑ දවල් නින්ද නෑ. දවස් දහතරකට පස්සේ අපිව හමුදාව අපිව පොලීසියට ගෙනත් බාර දුන්නා. පොලිසියෙන් අපිව තුට්ටුවකට ගනන් ගත්තෙත් නෑ. ඔගොල්ලෝ කොහෙද ඔරුගොඩවත්ත මජිඩ් ප්ලේස් කියල ඇහුවා විතරයි. යන්න යන්ඩ පාරෙන් එහ පැත්තට ගිහිල්ලා ඉන්ඩ කිව්වා. මන් කිව්වා මේ ආබාධිත අච්චි කෙනෙක් ඉන්නවා එයාට

ඇවිදින්න කරන්න බෑ කියලා. කමක් නෑ ඒ පුටුවත් අරන් ගිහිල්ලා එළියට වෙලා ඉන්ඩ කිව්වා. ඔගොල්ලෝ ගෙදර යන්න වාහනයක් ගෙන්න ගන්න කියලා කිව්වා. මං ඇහුවා මේ ඇඳිරි නීතිය වෙලාවේ කොහොමද මහත්තයෝ වාහනයක් ගේන්වා ගන්නේ කියලා. නෑ නෑ ඔගොල්ලෝ මේකට නග්ගා ගන්න බෑ කිව්වා. ඒ තරම්ම නරක විදියට අපිට පොලීසිය සැලකුවේ. අන්තිමේ ගමේ ඉන්න කොල්ලොන්ට කෝල් කරල පොලිසියේ රාලහාමිලා කිවුව කියල බොරු කියලා හරි වාහන දෙකක් ගෙන්නා ගෙන නම දෙනාම ත්‍රී වීල් දෙකක නැගලා ගෙදර ගියේ.

ගෙදර ආවට පස්සෙ මෙන්න ආපහු  රාලහාමිල දෙන්නෙක් එනවා. ඔගොල්ලෝ දවස් දහතරක් ගේ ඇතුලට වෙලා ඉන්ඩ ඕනේ කියලා. ඒ වෙනකොට මම විකුනන්න කියලා පොල්, බී ලූනු, අල, බිත්තර, ඉගුරු, තක්කාලි, අමු මිරිස්  වාගේ දේවල් ගෙදර තියාගෙන හිටියා. රුපියල් අසූදහක  විතර බඩු ඔක්කොම නන්නත්තාර වෙලා ගියා. දැං නං මං අන්තිම අසරණ වෙලා ඉන්නේ.

**කතාව ඉදිරිපත් කළේ :** මව්ලවී මොහොමඩ් සිරාජ් | කොළඹ දිස්ත්‍රිකය



# හෙට මැරුණත් හිතට සැපයි අද ජොලි කරලා

මම ඒ කරුණාසේන. පදිංචිය අනුරාධපුර දිස්ත්‍රිකයේ කුඹුගොල්ලෑවේ. මට දරුවෝ තුන් දෙනයි. මම දැන් කාලෙක ඉඳලම අරක්කු කසිප්පු බොනවා. යාළුවෝ දෙතුන් දෙනෙක් එක්ක එකතු වෙලා හැමදම හවසට හීනියට සප්පායම් වෙනවා.

මං ආදායමක් හෙව්වේ කිරි ගව පාලනෙන්. හැබැයි ඇත්ත කියන්න ඒ ගන්න සල්ලි වැඩියෙන්ම වියදම් වුනේ රහමෙර වලට. මොන තරම් උත්සාහ ගත්තත් මේ ජරා පුරුද්ද අතඇරගන්න බැරිවුනා. මට බිව්වම ලස්සනට සිංදු කියන්න පුළුවන්. මං හිතාගෙන හිටියේ නින්ද යන්න නම් බොන්නම ඕනේ කියලා. හවසට බිව්වහම ඇගේ පතේ අමාරුවට හොඳයි කියල තමයි ඒ දවස් වල හිතුනේ. හවසට ගෙදර එනකොට හැමදාම ගෑනිගෙන් බැනුම් අහනවා. ළමයි මූණවත් බලන්නේ නෑ. ගෙදර ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩන් වැටුනා. අරක්කු බොන එක තමයි ජීවිතයේ සැප සතුට කියල හිතාගෙන හිටියේ. මතින් තොර ජීවිතයක් තිබුනේ නෑ.

ඔන්න කොරෝණා වසංගතේ පැතිරෙන්න පටන්ගත්තා. ගෙදරටම හිරවුනා. ගෙදරින් එළියටවත් බහින්න වුනේ නෑ. යාලුවෙක් බෙහෙතකට හොයා ගන්න නෑ. දුකට සැපට ඉන්නවා කියපු උන් පැත්ත පළාතක නෑ. අරක්කු කසිප්පු හොයාගන්න නැතුව ගියා. දවස දෙක තුන සතිය මාසේ ගෙවිලා ගියා. අරක්කු ඇබිත්තක් බෙහෙතකට හොයාගන්න නැතුව ගියා. මෙහෙම කාලයක් යන කොට මටම තේරුණා අරක්කු බොරුවක් කියලා. ලස්සනට සිංදු කියන්න, හොදට නිදාගන්න බොන්න ඕන කියලා හතපු මතය බොරුවක් කියලා ඔප්පු වුනා. ඇත්තටම මට වෙනදාට වඩා හොදට නින්ද ගියා. බත් කටක රහ දැනෙන්න නං අඩියක් ගහන්න ඕන කියල හිතන් හිටපු මට වෙනදාට වඩා කෑම රස දැනුනා. මේ කාලය තුළ මගේ ජීවිතයේ හොඳ විසාල වෙනස් කමක් සිදුවුනා. බිරිඳ මට ළංවුනා. අපි දෙන්නා ආයිමත් ආදරෙන් වෙළුනා. දරුවෝ බය නැතිව මං වටේ දැවටෙන්න ගත්තා.

ඉස්සර මගහැරුනු කුඹුරු වැඩ, ගෙවතු වැඩ සේරම ආයිමත් පටන් ගත්තා. අරක්කු සිගරැට් බොනවා කියලා මම කරපු බොරු රගපෑම දැන් මටම තේරෙනවා පට්ට පල් බොරුවක් බව. ආයෙත් නං ඔය ජරාව කටේ තියන්නෑ.

**කථාව ඉදිරිපත් කළේ :** ඒ කරුණාසේන I අනුරාධපුර දිස්ත්‍රිකය

ආසියානු කලාපයේ ප්‍රචණ්ඩකාරී අන්තවාදය වළක්වාලීම සඳහා
යුරෝපා සංවිධානයෙන් ලැබූ අරමුදලෙන් UNDPහි සහාය ඇතිව ක්‍රියාත්මක වන
"ඉවසීම සහ විවිධත්වයට ගරු කිරීම හරහා ප්‍රචණ්ඩකාරී අන්තවාදය වැලැක්වීම" යන
ව්‍යාපෘතියේ කොටසක් ලෙස
සර්වෝදය ශාන්ති සේනා සංසදය මඟින් මුල පිරූ ක්‍රියාන්විතයකි.

Layout / Design - UNDP Communication Team